DEVELOPMENT LOTTERY

Enriching Your Life





සබඳතා ඇතිබවමින්

වාර්ෂික වාර්තාව

2017

සංවර්ධන ලොතරැයි මණ්ඩලය

සබඳතා ඇතිබවින්

පාර්ශවකරුවන් සමග අප පවත්වන සබඳතාවන් නිසා නිරන්තරයෙන් තිරසාර සාර්ථකත්වය හඹා යාමට අවශ්‍ය ශක්තිය හා තිර අදිටන අප වෙත ලැබේ. පෙරමුණ බලා යන මේ ගමනේදී පාර්ශවකරුවන් සියලුම දෙනා වෙනුවෙන් වටිනාකම් නිර්මාණය කිරීම වෙතද අපි අවධානය යොමු කරන්නෙමු. මෙම පසුබිම ඇසුරින් බලන කල 2017 වසරේදී සබඳතා ගොඩනගා ගනිමින් ඒවා සාර්ථක කරගැනීම කෙරෙහි අපි අවධානය යොමු කළෙමු. ගත වූ වසර තුළදී එම අරමුණු පෙරදැරි කරගෙන අප නිරත වූ ගමන් මගේදී අප හැඩගැස්වීමට දායක වූ සංවර්ධනයන්, උපායමාර්ගික වෙනස්කම් හා ක්‍රියාදාමයන් බෙදාහදා ගැනීම සතුටක් දනවයි.



පටුන

අප ගැන

ආයතනික තොරතුරු	02
දැක්ම, මෙහෙවර, ඉලක්ක හා මූලික වටිනාකම්	03
ඉතිහාසය දෙස හැරී බැලීමක්	04
අපගේ ගමන් මග/වැදගත් සන්ධිස්ථාන	05
මූල්‍ය සාරාංශයන්	06
සභාපතිතුමාගේ පණිවිඩය	08
අධ්‍යක්ෂ මණ්ඩලය	11
අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාලෝචනය	12
කළමනාකාරීත්වය	13
කණිෂ්ඨ කළමණාකාරීත්වය	14

කළමනාකරණ සාකච්ඡාව හා විශ්ලේෂණය

මෙහෙයුම් සමාලෝචනය	15
තිරසර වාර්තාව	28
ආයතනික යහපාලනය	34
අවදානම් කළමනාකරණය	37
විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව	40

මූල්‍ය වාර්තා

විගණකාධිපති ජනරාල්ගේ වාර්තාව	42
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය	76
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය	77
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	78
ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය	79
ගිණුම්කරණ ප්‍රතිපත්ති	80
මූල්‍ය ප්‍රකාශනවලට සටහන්	83
දස වාර්ෂික සාරාංශය	96

ආයතනික තොරතුරු

මණ්ඩලයේ නම

සංවර්ධන ලොතරැයි මණ්ඩලය

නෛතික පසුබිම

1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පාර්ලිමේන්තු පනත යටතේ මෙම මණ්ඩලය සංස්ථාපිත කරන ලදි.

ස්ථාපිත දිනය

1983 ජනවාරි 19 වන දින

ලියාපදිංචි කාර්යාලය

අංක 356, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, යූනියන් පෙදෙස, කොළඹ 02.

දුරකතන අංක

011 2 333 546-8, 011 4 824 824

ෆැක්ස් අංකය

011 2 333 545

විද්‍යුත් තැපෑල

info@dlb.lk

වෙබ් අඩවිය

www.dlb.lk

බදු ගෙවීම් හඳුනාගැනීමේ අංකය (TIN)

409089844

වත්මන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්

එස්. ඒ. පී. සූරියප්පෙරුම මහතා - සභාපති/ප්‍රධාන විධායක නිළධාරී
එච්. ආර්. විමලසිරි මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ
ඩී. එන්. නානායක්කාර මහතා - අධ්‍යක්ෂ
එච්. සී. ඩී. එල් සිල්වා මහතා - අධ්‍යක්ෂ
එම්. පී. බණ්ඩාර මහතා - අධ්‍යක්ෂ

විගණක

විගණකාධිපති

බැංකු සහකරුවන්

මහජන බැංකුව, ලංකා බැංකුව, සම්පත් බැංකුව

දැක්ම

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම වාසනාව උදාකිරීමේ රාජ්‍ය ආයතනයක් බවට පත්වීම.

මෙහෙවර

නවීන තාක්ෂණය යොදා ගනිමින් නව්‍යතාවයෙන් යුතු ආකර්ශනීය ලොතරැයිපත් ඉදිරිපත් කරමින් විශ්වාසය තහවුරු කරන අතරතුර සෑම කල්හිම පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් සපුරාලීම.

ඉලක්ක

වෙළෙඳපොල කොටස වර්ධනය කර ගැනීම, ජනාධිපති අරමුදල සඳහා වන දායකත්වය උපරිම තත්වයට පත් කිරීම. නවීන තාක්ෂණය අත්පත් කර ගැනීම සහ භාවිතය, පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් සපුරාලීම.

මූලික වටිනාකම්

සුපිලිපන්බව

අප විසින් ඉදිරිපත් කරන ලොතරැයි හා අප ව්‍යාපාරික කටයුතුවල නිරත වන ආකාරය සාධාරණ, අවංක සහ විශ්වසනීය වේ.

නව්‍යතාවය

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයින් ව්‍යාපාරික වර්ධනය සඳහා වන අදහස් සොයා යමින් තරඟකාරී වෙළෙඳපොල වෙනස්වීම් හමුවේ කඩිනමින් ප්‍රතිචාර දක්වති.

සුභවාදී ආකල්ප

ලොතරැයි ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී ඔවුන් හට මුහුණපෑමට සිදුවන සෑම අභියෝගයකටම සුභවාදී චිළඹුමක් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයින් තුළ පවතී.

කණ්ඩායම් හැඟීම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයින් විවෘතභාවය, එකිනෙකා කෙරෙහි ගෞරවය සහ පුද්ගල සංවර්ධනය ඔස්සේ ආයතනික ඉලක්ක සපුරාගැනීමෙහි ලා එකාවන්ව කටයුතු කරති.

ප්‍රතිඵලදායක බව

ස්වකීය කාර්යභාරයන් පිළිබඳව සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයින් තුළ මනා විශ්වාසයක් පවතින අතර ඔවුහු දෙන ලද ඉලක්ක කාර්යක්ෂමව අත්පත් කර ගැනීම සඳහා නිසි අවධානයකින් යුතුව කටයුතු කරති.

විශිෂ්ටත්වය කෙරෙහි නැඹුරුව

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයින් අඛණ්ඩවම සේවා තත්වයන් උපරිම මට්ටම් කරා රැගෙන ඒම සඳහා කැපවීමෙන් ක්‍රියා කරති.

ඉතිහාසය දෙස
හැරී බැලීමක්

1983

- ජනාධිපති අරමුදල හා මහපොල උසස් අධ්‍යාපන ඝිෂ්‍යත්ව භාරකාර අරමුදල වෙතින් ලද මූල්‍ය දායකත්වය මත සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය පිහිටුවන ලදි.
- සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය පිහිට වූ පළමු වසර තුළදීම සැලකිය යුතු මට්ටමේ සාර්ථකත්වයක් ළඟාකර ගනිමින් ලාභ ඉපයීමට හැකි විය.
- මෙම ලාභයෙන් වැඩි කොටස මධ්‍යස්ථානයේ පාර්ශවකරුවන් වූ ජනාධිපති අරමුදල හා මහපොල උසස් අධ්‍යාපන ඝිෂ්‍යත්ව භාරකාර අරමුදල වෙත හිමි විය.
- දීප ව්‍යාප්ත අලෙවි නියෝජිතයන් හරහා රු. 10 ක මිලකට අලෙවි කරන ලද, 'සංවර්ධන ලොතරැයිය' නම් වූ පළමු 'ක්ෂණික/සූරන' ලොතරැයිය විකුණා පළමු පැය 24 ඇතුළත පළමු ත්‍යාග ජයග්‍රාහිකයන් දෙදෙනෙකු බිහි කිරීමට සමත් විය. මණ්ඩලයේ දීර්ඝ කාලීන ජනප්‍රියභාවයට මෙයින් විශාල සහායක් ලැබුණි.
- මුදල් ජයග්‍රහණ හිමි නොවන ක්ෂණික ලොතරැයි ඉලක්ක කරගත් වැඩසටහනක් වූ 'වාසනා චක්‍රය' ආරම්භ කරන ලදි.

1987

- 'ශනිදා වාසනාව' ලොතරැයිය හඳුන්වා දීමත් සමගින් සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය මුලින්ම ලොතරැයි දිනුම් ඇදීමේ රූපවාහිනී වැඩසටහන් හඳුන්වා දෙන ලද අතර ආරම්භයේදී සෙනසුරාදා දිනවල විකාශය වූ එම වැඩසටහන් පසුව සතියේදා දිනවලද විකාශය විය.

1993

- සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය, ''සංවර්ධන ලොතරැයි භාරය'' නම් වූ අරමුදලක් බවට පරිවර්තනය කරන ලදි.

1997

- 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත මගින් සංවර්ධන ලොතරැයි අරමුදල, 'සංවර්ධන ලොතරැයි මණ්ඩලය' වශයෙන් නැවත ස්ථාපිත කරන ලදි.

1998

- මුදල් ජයග්‍රහණ හිමි නොවන ක්ෂණික ලොතරැයි ඉලක්ක කරගත් වැඩසටහනක් වූ 'වාසනා චක්‍රය' නැවත ආරම්භ කරන ලදි. (අද්‍යාළ දිනුම් ඇදීම ඉරිදා දිනවල රූපවාහිනියේ විකාශය විය).
- 'සංවර්ධන වාසනාව' නම් වූ දෙවන රූපවාහිනී දිනුම් ඇදීමේ වැඩසටහන ආරම්භ කරන ලදි. (දිනුම් ඇදීම අඟහරුවාදා හා සිකුරාදා දිනවල විකාශය විය).
- ජයග්‍රාහී ටිකට්පත් හඳුනාගනු පිණිස ඉලක්කම් ඇතුළත් කොට ලග්න චක්‍රයේ හැඩය ගත් නවතම අංගයක් 'සංවර්ධන වාසනාව' වැඩසටහන මගින් හඳුන්වා දෙන ලදි.

2004

- සඳුදා සහ බ්‍රහස්පතින්දා රූපවාහිනිය මගින් දිනුම් ඇදීම් විකාශය ආරම්භ වූ 'ජයෝදා' ලොතරැයිය හඳුන්වා දෙන ලදි (මෙහි සුපිරිද ත්‍යාගය රු. මිලියන 10 ක් වූ අතර පළමු ත්‍යාගය රු. මිලියන 1 ක් වූ අතරම තවත් සාමාන්‍ය මුදල් ත්‍යාග හිමි විය).
- ජයෝදා ජයග්‍රාහකයන් හට රු. මිලියන 1 මුදල් ත්‍යාගය හෝ රු. මිලියන 1 ක වටිනාකමකින් යුතු නිවසක් හෝ යන දෙකින් එකක් තෝරා ගැනීමේ විකල්ප අවස්ථාව හිමි විය.

2010

- බ්‍රහස්පතින්දා හා ඉරිදා දිනවල රූපවාහිනිය මගින් විකාශය කෙරුණු 'ජන ජය' ලොතරැයිය හඳුන්වා දෙන ලදි (ඉලක්කම් 64 කින් 4 ක් ගැලපෙන ටිකට්පත්වලට සුපිරි මුදල් ත්‍යාගය හිමි අතර ඉලක්කම් 12 ක් අතරින් සුපිරි අංකය තෝරන ලදි).

2012

- රු. මිලියන 30 ක වටිනාකමකින් යුතු මෙතෙක් ලබා දෙන ලද විශාලතම පළමු ත්‍යාගයක සහිත 'සුපර් බෝල්' ලොතරැයිය හඳුන්වා දෙන ලදි.

2016

- 'සංවර්ධන ලක්ෂපති' ලොතරැයිය හඳුන්වා දුන් අතර එම ලොතරැයි මිලියන 5.6 ක් අලෙවි කරමින් වෙතිහාසික වාර්තාවක් තබන ලදි.
- 'කෝටිපති ශනිදා' ලොතරැයිය හඳුන්වා දුන් අතර පළමු අලෙවි වටය තුළදී ටිකට්පත් මිලියන 4.4ක් අලෙවි කරන ලදි.
- ලොතරැයි දිනුම් ඇදීමේ රූපවාහිනී වැඩසටහනක් වූ 'සංවර්ධන වාසනාව' නව මුහුණුවරකින් නැවත ආරම්භ කරන ලදි.

2017

- 'අද කෝටිපති' ලොතරැයිය හඳුන්වා දෙන ලදි.
- සිංහල හා දමිළ ද්වී භාෂාවෙන්ම 'වාසනාවට විනාඩියක්' යන රූපවාහිනී වැඩසටහන් තුළින් ලොතරැයිපත් සුපිරි ත්‍යාගලාභීන් ජාතික රූපවාහිනිය ඔස්සේ මහජනතාවට හඳුන්වා දෙමින් මහජන විශ්වාසය ගොඩනැගීමේ වැඩසටහනක් ආරම්භ කරන ලදි.

වැදගත් සන්ධිස්ථාන

1983

පළමු ක්ෂණික/සූරන ලොතරැයිය වන සංවර්ධන ලොතරැයිය ආරම්භ කරන ලදි.

1987

ලොතරැයි දිනුම් ඇදීමේ පළමු රූපවාහිනී වැඩසටහන වූ 'ශනිදා වාසනාව' හඳුන්වා දීම.

1993

'සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය', 'සංවර්ධන ලොතරැයි භාරය' බවට පරිවර්තනය කිරීම.

1997

'සංවර්ධන ලොතරැයි භාරය', '1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත' මගින් රජයේ හිමිකාරත්වයට යටත් ආයතයක් ලෙස ''සංවර්ධන ලොතරැයි මණ්ඩලය' බවට පරිවර්තනය කිරීම.

1998

'වාසනා චක්‍රය' ලොතරැයි දිනුම් ඇදීමේ රූපවාහිනී වැඩසටහන නැවත හඳුන්වා දීම. මෙය, ජයග්‍රහණ හිමි නොවන ක්ෂණික ලොතරැයි සඳහා වෙන් වූවකි. "වින්ඩෝස්" සහ "යුරේකා" ක්ෂණික ලොතරැයි සමගින් 'සංවර්ධන වාසනාව' හඳුන්වා දෙන ලදි. රු. ලක්ෂ 100 ක් වටිනා අධි සුඛෝපභෝගී මෝටර් රථයක් එහි පළමු ත්‍යාගය විය.

1999

ලෝක බැංකුවේ සහාය ඇතිව 'Y2K' පරිගණක දෝෂයට මුහුණ දිය හැකි පරිදි පරිගණක පද්ධතිය යාවත්කාල කරන ලදි.

2004

- ත්‍යාගය වශයෙන් මුදල් හෝ නිවසක් තෝරාගැනීමේ අවස්ථාව ලබා දෙමින් 'ජයෝදා' ලොතරැයිය හඳුන්වා දෙන ලදි.
- රු. බිලියන 3 ක පිරිවැටුමක් ළඟාකර ගන්නා ලදි.

2008

- මණ්ඩලයටම අයත්, කොළඹ 02, කොල්වින් ආර් ද සිල්වා මාවතේ අංක 356 දරණ ස්ථානය වෙත ගමන් කරන ලදි.
- රු. බිලියන 5 ක පිරිවැටුමක් ළඟාකර ගන්නා ලදි.

2010

සුපිරි පළමු මුදල් ත්‍යාගයක් සහිතව 'ජන ජය' ලොතරැයිය හඳුන්වා දෙන ලදි.

2011

'නියත ජය' ලොතරැයිය හඳුන්වා දෙන ලදි.

2012

රු. මිලියන 30ක සුපිරි ත්‍යාගයක් සමග සුපර් බෝල් ලොතරැයිය හඳුන්වාදෙන ලදි.

2013

ඉහළම මුදල් වටිනාකමක් පළමු ත්‍යාගය ලෙස හිමි වන Highway Dream ලොතරැයිය හඳුන්වා දෙන ලදි.

2014

SMS ක්‍රමයට ලොතරැයි අලෙවිය හඳුන්වා දෙන ලදි.

2016


'සංවර්ධන ලක්ෂපති', 'කෝටිපති ශනිදා' හා 'සංවර්ධන වාසනාව' ලොතරැයි හඳුන්වා දෙන ලදි.

2017


'අද කෝටිපති' ලොතරැයිය හඳුන්වා දෙන ලදි.

මූල්‍ය සාරාංශයන්


පිරිවැටුම




මුළු වත්කම්




ජනාධිපති අරමුදල සඳහා දායකත්වය




ආදායම් බදු



රජයට සිදුකළ මුළු ප්‍රේෂණය



බදු පෙර ලාභය



දෙසැම්බර් 31 න් අවසන් වූ මූල්‍ය වර්ෂය	2017	2016
මෙහෙයුම් ප්‍රතිඵල		
ආදායම	**13,981,500,306**	14,759,875,240
දළ ලාභය	**5,864,333,040**	6,236,580,852
බදු පෙර ලාභය	**2,331,187,173**	2,695,497,748
බදු වියදම්	**1,819,191,890**	917,136,130
ශුද්ධ ලාභය	**507,036,703**	1,783,386,637
ජනාධිපති අරමුදල වෙත දායකත්වය	**346,541,000**	1,836,020,000
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය		
වත්කම්		
දේපල, පිරියත හා උපකරණ	**670,526,398**	699,667,579
කල්පිරෙන තෙක් රඳා සිටින මූල්‍ය වත්කම්	**1,050,939,528**	673,087,287
තොග	**58,355,403**	39,733,884
වෙළෙඳ ණයකරුවන් හා අනෙකුත් ලැබිය යුතු	**195,356,468**	65,861,572
පෙර ගෙවීම් හා තැන්පතු	**6,473,731**	6,402,121
බැංකුවේ හා අතැති මුදල්	**739,482,123**	572,045,926
මුළු වත්කම්	**2,721,133,651**	2,056,798,369
වගකීම්		
ගෙවිය යුතු සේවක ප්‍රතිලාභ වගකීම්	**43,110,120**	31,004,453
අලෙවි නියෝජිතයන් හා බෙදාහරින්නන්ට ගෙවිය යුතු තැන්පතු	**33,482,881**	30,696,381
ගෙවිය යුතු මුදල් වවුචර	**247,427,740**	101,500,760
වෙළෙඳ හා ගෙවිය යුතු අනෙකුත් මුදල්	**776,332,866**	576,301,096
ජනාධිපති අරමුදල වෙත ගෙවිය යුතු	**107,862,341**	(52,633,363)
ගෙවිය යුතු ත්‍යාග	**698,488,245**	560,093,693
ස්කන්ධය		
ජනාධිපති අරමුදල	**2,200,000**	2,200,000
මහපොළ භාරකාර අරමුදල	**2,200,000**	2,200,000
ත්‍යාග සංචිත ගිණුම	**810,029,458**	805,435,349
මුළු ස්කන්ධ හා වගකීම්	**2,721,133,651**	2,056,798,369
ලාභදායිත්ව අනුපාත		
ශුද්ධ ලාභ අනුපාතිකය	**17%**	18%
දළ ලාභ අනුපාතිකය	**42%**	42%
ද්‍රවශීලතා අනුපාතිකය		
ජංගම වත්කම් අනුපාතිකය	**1:0.6**	1:0.6
ක්ෂණික (ද්‍රවශීල) වත්කම් අනුපාතිකය	**1:0.5**	1:0.5

සභාපතිතුමන්ගේ පණිවිඩය



සබඳතා ගොඩනැගීම, සන්නාම බලය හා ආපදා කළමනාකරණය ආදී කාරණා සම්බන්ධයෙන් අප සතු ශක්තිය මනාව විග්‍රහ කරන වසරක් වශයෙන් 2017 මූල්‍ය වර්ෂය සඳහන් කළ හැක. මෙම සාර්ථක වසර අවසානය දකින මොහොතේ අපගේ ජයග්‍රහණයන් සාරාංශ ගත කරමින් 2017 වසර සඳහා වන, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඔබ වෙත ඉදිරිපත් කරන්නට ලැබීම ගැන මම අතිශයින් සතුටට පත් වෙමි.

මෙම සමාලෝචනයට ලක් වන වර්ෂය තුළදී අනපේක්ෂිත ලෙස ටිකට්පත් මිල ඉහළ යාම හා බැඳි බරපතල අර්බුදයක් සාර්ථක ලෙස කළමනාකරණය කර ගැනීමට පමණක් නොව, ව්‍යාපාරික සබඳතා ගොඩනැගීම හා සවිමත් කිරීම සහ ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය ඉහළ නැංවීම වෙනුවෙන් උපායමාර්ගික තීරණ මාලාවක්ම ක්‍රියාත්මක කිරීම අතින්ද සංවර්ධන ලොතරැයි මණ්ඩලය සාර්ථක වූ බව කිව හැක.

මූල්‍ය තත්ත්වය ගැන දළ විශ්ලේෂණයක්

2017 වසරේදී ටිකට්පත් අලෙවියෙන් ලද ආදායම රු. බිලියන 14.6 ක් ලෙස වාර්තා වන අතර ගත වූ මූල්‍ය වර්ෂය හා සැසඳීමේදී මෙය 4.4% ක ආන්තික පහත බැසීමක් පෙන්නුම් කරයි. විවක්ෂණ අලෙවිකරණ උපායමාර්ග නිසා ලද සහාය හේතුවෙන් 'කෝටිපති ශනිදා' හා 'සංවර්ධන වාසනාව' යන ටිකට්පත් අලෙවිය ඉහළ නැඟි අතර සංවර්ධන ලොතරැයි කළඹට හඳුන්වා දුන් නවතම ලොතරැයිය වන 'අද කෝටිපති' මඟින් මෙම වසර තුළදී පස්වන ස්ථානයට අලෙවි කරන ලද වැඩිම ටිකට්පත් ප්‍රමාණය වාර්තා වෙයි.

2017 මූල්‍ය වර්ෂයේ පළමු කාර්තුව තුළදී ටිකට්පතක මිල රු. 10 කින් ඉහළ නංවන ලෙස මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කළ නියමයෙන් අනතුරුව උද්ගත වූ මෙහෙයුම් අර්බුදයක

ප්‍රතිඵලයක් වශයෙන් අප මණ්ඩලයට රු. මිලියන 1,181 පමණ විකුණුම් පසුබෑමක් වාර්තා විය. කෙසේ වෙතත්, ලොතරැයි අලෙවි නියෝජිතයන් සහ අලුතින් පිහිටුවන ලද ලොතරැයි අලෙවි නියෝජිතයන්ගේ වෘත්තීය සමිතිය සමග සාර්ථක සබඳතාවන් පැවැත්වීම තුළින් එම තත්ත්වය යථා තත්ත්වයට පත්කර ගැනීමට අපට හැකි විය. ඒ අනුව, රු. බිලියන 2.3 ක බදුවලට පසු ලාභයක් වාර්තා කර ගැනීමට අපට හැකි වූ අතර මෙය පසුගිය මූල්‍ය වර්ෂය හා සැසඳීමේදී 13% ක පහත බැසීමකි. 2016 වසර සමග සැසඳීමේදී රු. මිලියන 902 ක ඉහළ යාමක් සනිටුහන් කරමින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් රු. මිලියන 1,819 ක මුදලක් ආදායම් බදු වශයෙන් දායක කර ඇත. ඒ අනුව, 2017 වසර සඳහා වූ බදුවලින් පසු ලාභය රු. මිලියන 507 කි. පසුගිය මූල්‍ය වර්ෂය සමග සසඳීමේදී මෙය 71.5% ක පහත බැසීමකි.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය ස්ථාපිත කරන ලද්දේ ජනාධිපති අරමුදල හා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙනුවෙන් මුදල් උත්පාදනව කිරීමේ තිරසාර යෝජනා ක්‍රමයක් වශයෙනි. මේ නිසා එකී අරමුදල් වෙත දායකත්වය දැක්වීම අපගේ ප්‍රධානතම අරමුණක් ලෙස පවතී. මෙම සමාලෝචනයට ලක් වන මූල්‍ය වර්ෂය තුළදී දීර්ඝ කාලීනව පැවැති භාරයක් සැහැල්ලු කර ගනිමින් රු. මිලියන 1,931 ක වටිනාකමකින් යුතු සමුච්ඡිත බදු මුදල් ප්‍රමාණයක් ගෙවා දැමීමට අපට හැකි විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වසර අවසානයේදී හිතකර ශේෂ පත්‍රයක් ඉදිරිපත් කිරීමට අපට හැකි විය. සමුච්ඡිත හිඟ බදු මුදල් ප්‍රමාණය ගෙවීම හේතුවෙන් ජනාධිපති අරමුදල වෙත අප දැක්වූ දායකත්වයද රු. මිලියන 437 කට සීමා විය. ගත වූ වර්ෂය හා සැසඳීමේදී මෙය රු. මිලියන 1,399 ක පහත බැසීමකි.

සබඳතා ගොඩනැගීම හා උපායමාර්ගික සංවර්ධනයන්

2017 වසර තුළදී අලෙවි නියෝජිතයන් හා මහජනතාවගේ අභිලාෂ සාර්ථක ලෙස ආමන්ත්‍රණය කිරීම හා නව සන්නිවේදන ජාල ආරම්භ කිරීම තුළින් ඔවුන් හා දීර්ඝ කාලීන සවිමත් සබඳතා ගොඩනගා ගැනීමට අපට ඇති ශක්තිය හා හැකියාව මැනවින් ප්‍රකට කළෙමු. ඉහත සඳහන් කළ පරිදි, පළමු කාර්තුව තුළදී ටිකට්පතක මිල ඉහළ යාම නිසා මතු වූ අභියෝග ලොතරැයි අලෙවි නියෝජිතයන් අතර ශක්තිමත් ප්‍රතිරූපයක් ගොඩනගා ගැනීමට හැකි පරිදි කළමනාකරණය කර ගැනීමට අපට හැකි විය. ලොතරැයි ත්‍යාග දිනා ගැනීමට ඇත්තේ ඉතාම දුර්ලභ අවස්ථාවකි යන පොදු වැරදි වැටහීම හඳුනාගැනීමෙන් අනතුරුව සිංහල හා දමිළ දෙබසින්ම 'වාසනාවට විනාඩියක්' යන රූපවාහිනී වැඩසටහන ජාතික රූපවාහිනිය ඔස්සේ විකාශය කිරීම තුළින් ගනුදෙනුකරුවන් අතර විශ්වාසය ගොඩනගා ගැනීමට පියවර අප විසින් ගන්නා ලදි. එහි මූලික අරමුණ වූයේ සෑම සතියකම සුපිරි ත්‍යාග හා පළමු ත්‍යාග දිනාගත් පුද්ගලයන් හඳුන්වා දීමයි. ටිකට්පත් අලෙවිය ඉහළ නැංවීම ඉලක්ක කරගනිමින් අලෙවි ප්‍රචාරණ වැඩසටහන් ආශ්‍රිත ආයෝජනයන් සිදු කරමින් ප්‍රතිඵල ඉදිරිපත් කිරීමේ වැදගත් උපායමාර්ගික සාකච්ඡාත්කරණයක් වශයෙන් මෙය දැක්විය හැක.

සබඳතා ගොඩනැගීමේ අපගේ ප්‍රයත්නයන්හි කොටසක් වශයෙන් වසර ගණනාවකට පසුව පළමු වතාවට අප විසින් ටිකට්පත් බෙදාහරින්නන් වෙනුවෙන් සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදි. ඔවුන් මුහුණ පාන අභියෝගවලට සාර්ථක විසඳුම් ලබා දීම හා ඔවුන් දිරිමත් කිරීම එහි අරමුණ විය.

දිවයිනේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශ වෙත නව ප්‍රාණයක් ලබා දෙනු වස් සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් එකී ප්‍රදේශ ආශ්‍රිත අලෙවි නියෝජිතයන් වෙනුවෙන් නව ලොතරැයි අලෙවි කුට් ලබා දෙන ලදි.

වසර ගණනාවකට පසුව තවත් පරිචයක් සමාලෝචනය කිරීමටද අපි පියවර ගත්තෙමු. ඒ අනුව, වත්මන වන විට සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අලෙවි නියෝජිතයන්ගේ දරුවන් විශ්වවිද්‍යාල ප්‍රවේශය ලැබීමෙන් අනතුරුව ඔවුන් වෙත මාසික ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ වැඩසටහන නැවත ආරම්භ කරන ලදි.

2017 වසරේදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් රූපවාහිනී ලොතරැයි දිනුම් ඇදීමේ වැඩසටහන් මෙහෙයවන නිවේදක නිවේදිකාවන්ට සිය අදහස් බෙදාහදා ගැනීමට අවස්ථාවක් උදා කරමින් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පරිශ්‍රයේදී සුහද හමුවක් සංවිධානය කරන ලදි. ඔවුන්ගේ වටිනා දායකත්වය අගය කිරීමට අපි මෙම අවස්ථාව යොදා ගතිමු.



සභාපතිතුමන්ගේ පණිවිඩය ඉතිරිය

කාර්ය මණ්ඩලය සතු ශක්‍යතා ඉහළ නැංවීමේ අරමුණින් සේවක සහභාගීත්වය සහිතව විවිධ වැඩසටහන් හා පුහුණු සැසි මාලාවක්ද මෙම කාල සීමාව තුළ ක්‍රියාත්මක කරන ලදි.

මේ අතරම, ටිකට්පත් නිරන්තරයෙන් වෙළෙඳපොල තුළ ලබා ගැනීමට පහසු තත්ත්වයෙන් පවතින බව සහතික කරනු වස් අප විසින් බෙදාහැරීමේ ජාලය ප්‍රතිසංවිධානය කොට සැපයුම කාර්යක්ෂම කිරීමටද පියවර ගන්නා ලදි. මේ වන විට ඉදිරි දින 14 ක කාලය සඳහා ප්‍රමාණවත් ටිකට්පත් සංචිතයක් අපගේ ප්‍රධාන කාර්යාලයෙහි පවත්වා ගනිමින් ඕනෑම අවස්ථාවක අපගේ නියෝජිතයන්ට ටිකට්පත් ලබා ගැනීමට ඉඩකඩ ඇති බව තහවුරු කර තිබේ.

2017 වසරේදී අපගේ නියෝජිත ජාලය සහ උතුරු හා නැගෙනහිර පළාත්වල අලෙවි හා බෙදාහැරීමේ නියෝජිත ජාලය සංවර්ධනය කිරීම වෙත වැඩි අවධානයක් යොමු කරමින් අපගේ වර්ධන උපායමාර්ගය නව දිශානතියකට යොමු කිරීමද සිදු කෙරිණ. මීට අනුගත වන පරිදි මෙම ප්‍රදේශ දෙකෙහි නියෝජිතයන් වෙත ගාස්තු අය කිරීමකින් තොරව ලොතරැයි අලෙවි කුට්ටි ලබා දුන්නෙමු.

මෙම සමාලෝචනයට ලක් වන කාල සීමාව තුළ අප විසින් සිදු කරන ලද තවත් කාර්යයක් නම් අපගේ තොරතුරු තාක්ෂණ හා ඩිජිටල් සේවාවන් සංවර්ධනය කිරීම වෙත අවධානය යොමු කිරීමයි. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ජංගම ලොතරැයියක් හඳුන්වා දීම හා මහජනතාවට සංවර්ධන ලොතරැයි මණ්ඩලය සමග අන්තර්ක්‍රියාකාරී වීමටත් විවිධ තොරතුරු ලබා ගැනීමට අවස්ථාව උදා කරමින් ජංගම දුරකතන යෙදුමක් සංවර්ධනය කිරීමට අවශ්‍ය මූලික පසුබිම සකස් කරන ලදි.

එසේම, විවිධ ආයතනික සමාජ වගකීම් වැඩසටහන් කිහිපයක් දියත් කිරීමටද සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අපි පියවර ගත්තෙමු. විවිධ ආගමික කටයුතු සඳහා සහාය දැක්වීම, සමාජ හා සංස්කෘතික වශයෙන් වැදගත් ආයතනවලට උපකාර කිරීම ආදියද ඊට ඇතුළත් විය.

කෘතවේදීත්වය

අවසන් වශයෙන් මෙම වර්ධනය ළඟා කර ගැනීමේදී අප වෙත නිරතුරුව සහයෝගය දැක්වූ පරදු භාරකරුවන් සියලුම දෙනා මාගේ සම්භාවනාවට ලක් වේ. විශිෂ්ට සහයෝගයක් හා මනා මගපෙන්වීමක් ලබා දීම වෙනුවෙන් මුදල් අමාත්‍යාංශය, අප මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය, ක්‍රියාකාරී අධ්‍යක්ෂ, සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් සහ සහකාර සාමාන්‍යාධිකාරීවරුන් වෙතද මාගේ හදපිරි ස්තූතිය හිමි විය යුතුය. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මීට පෙර සේවය කළ හා වත්මනෙහි සේවයෙහි නියුතු සේවක මහත්ම මහත්මීන්ගේ සහයෝගය නොවන්නට 35 වසරක් පුරාවට අප ලබා ඇති මේ සාර්ථකත්වය උදාකර ගත නොහැකි වනු ඇති බවද කෘතවේදීව සඳහන් කරමි. එසේම, දිනුම් ඇදීමේ වැඩසටහන් සඳහා සහභාගී වූ අධීක්ෂකයන්, ජනාධිපති අරමුදලේ කාර්ය මණ්ඩලය, මහපොල උසස් අධ්‍යාපන භාර අරමුදලේ කාර්ය මණ්ඩලය, අපගේ බෙදා හරින්නන්, අලෙවි නියෝජිතයන්, අලෙවි සහකාරවරුන්, මාධ්‍ය ආයතන, බැංකු සහකරුවන්, විගණකවරුන් සහ සියලු සැපයුම්කරුවන් වෙතද ස්තූතිවන්ත වෙමි.

ඉදිරි වසරවලදීද සංවර්ධන ලොතරැයි මණ්ඩලය අපගේ පාර්ශවකරුවන් සියලුම දෙනා වෙනුවෙන් සේවය ලබා දීම වෙත කැපවීමෙන් සිටිනු ඇති බවටත්, අන්‍යොන්‍ය වශයෙන් ප්‍රතිලාභ උදා කරන තිරසාර සබඳතා ගොඩනගා ගැනීම කෙරෙහි දැඩි අවධානයකින් යුතුව පෙරට ඇදෙනු ඇත.



ඩබ්ලිව්. ඒ. පී. සූරියප්පෙරුම මහතා
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී

අධ්‍යක්ෂ මණ්ඩලය
2017

එස්. ඒ. පී. සූරියප්පෙරුම මහතා - සභාපති/ප්‍රධාන විධායක නිලධාරී	2017.09.06 - සිට මේ දක්වා
රොමේෂ් ජයවර්ධන මහතා - සභාපති/ප්‍රධාන විධායක නිලධාරී	2015.10.29 2017.09.04
ආර්. අයි. විමලසේන මිය - උප සභාපති	2015.02.16 - 2017.06.15
එච්. ආර්. විමලසිරි මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ	2017.09.06 සිට මේ දක්වා
ආචාර්ය වික්‍රම වීරසූරිය මහතා - අධ්‍යක්ෂ	2015.03.17 - 2017.11.05
එම්. එස්. ඩී. රණසිරි මහතා - අධ්‍යක්ෂ	2015.02.27 - 2017.02.13
ඩී. එන්. නානායක්කාර මහතා - අධ්‍යක්ෂ	2015.03.11 - සිට මේ දක්වා
එච්. පී. සුමනසිංහ මහතා - අධ්‍යක්ෂ	2017.02.14 - 2017.06.08 2017.09.26 - 2018.09.13
ඩී. සී. දිසානායක මහතා - අධ්‍යක්ෂ	2017.11.06 - 2018.05.15
එස්. එම්. මොහොමඩ් මිය - අධ්‍යක්ෂ	2017.06.22 - 2017.08.17

අධ්‍යක්ෂ මණ්ඩලය
වර්තමාන

එස්. ඒ. පී. සූරියප්පෙරුම මහතා
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී

එච්. ආර්. විමලසිරි මහතා
ක්‍රියාකාරී අධ්‍යක්ෂ

ඩී. එන්. නානායක්කාර මහතා
අධ්‍යක්ෂ

එච්. සී. ඩී. එල්. සිල්වා මහතා
අධ්‍යක්ෂ

එම්. පී. බණ්ඩාර මහතා
අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාලෝචනය

2017 මූල්‍ය වර්ෂය තුළදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය සිය පාර්ශවකරුවන් සමග ඇති සබඳතා සවිමත් කරගැනීම කෙරෙහි විශේෂ අවධානයකින් කටයුතු කරන ලදි. මණ්ඩලයේ මූලික අරමුණ සාර්ථක කරගනිමින් රු. මිලියන 507 ක බදුවලට පසු ලාභයක් සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් උපයා ගන්නා ලද අතර එයින් රු. මිලියන 346 ක් ජනාධිපති අරමුදල හා මහපොල උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත දායක කරන ලදි. 2017 වාර්ෂික වාර්තාව වෙනුවෙන් වන අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය මගින් වසර තුළ ක්‍රියාත්මක වූ ප්‍රධාන උපායමාර්ග කිහිපයක් විස්තර කෙරේ.

2017 දී සමුච්චිත හිඟ බදු ගෙවා දැමීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලයට හැකි වූ අතර වසර අවසානයේදී පැහැදිලි ශේෂ පත්‍රයක් ඉදිරිපත් කිරීමට එමගින් මග පෑදුණි.

සබඳතා සවිමත් කරගැනීම පැත්තෙන් ගත් විට, අලෙවි නියෝජිතයන්ගේ අභිලාෂ වඩා හොඳින් ආමන්ත්‍රණය කිරීමේ අරමුණින් ඔවුන් සමග සෘජු හා විනිවිදභාවයෙන් වඩා ඉහළ සන්නිවේදන ජාල නිර්මාණය කර ගැනීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලයට හැකි වූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් අලෙවි පරිමා වැඩිකර ගැනීමට හැකියාව ලැබුණි. එසේම, මහජනතාව අතර අප කෙරෙහි විශ්වාසය වැඩිකර ගැනීම වෙනුවෙන්ද නවතම ප්‍රවේශයක් අනුගමනය කිරීමට අපි පියවර ගත්තෙමු.

මේ අනුව, ජාතික රූපවාහිනිය ඔස්සේ විකාශය කෙරුණු 'වාසනාවට විනාඩියක්' වැඩසටහන තුළින් අපගේ ලොතරැයි සතිපතා සිංහල හා දෙමළ යන භාෂා දෙකෙන්ම සතිපතා මහජනතාවට හඳුන්වා දීමට පියවර ගත්තෙමු. මෙය, විකුණුම් වර්ධනය කර ගැනීමේ අපගේ පුළුල් අරමුණෙහි කොටසක් ලෙස ක්‍රියාත්මක කෙරුණු වැඩසටහනකි. නිරන්තරයෙන් වෙනසට බඳුන් වන වෙළෙඳපොල තත්ත්වයන්ට අනුගත වෙමින් ජංගම ලොතරැයි ක්‍රමයක් සහ මහජනතාවට සංවර්ධන ලොතරැයි මණ්ඩලය සමග තොරතුරු නුවමාරු කර ගැනීමට ඉඩ සලසන ජංගම දුරකතන යෙදුමක් හඳුන්වා දීමට අදාළ මූලික පසුබිම මෙම වකවානුවේදී සකස් කරන ලදි.

මෙම සමාලෝචනයට ලක් වන වර්ෂය තුළදී අපගේ කාර්ය මණ්ඩලය, නියෝජිත ජාලය සහ නිෂ්පාදන කළඹ ඇතුළු පැති වර්ධනය කර ගැනීම වෙතද අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමු විය. ඒ අනුව, ටිකට්පත් අඛණ්ඩව වෙළෙඳපොලට බෙදා හැරෙන බව තහවුරු කරනු පිණිස ප්‍රධාන කාර්යාලය මෙන්ම අදාළ බෙදාහැරීමේ නියෝජිතයන් ආශ්‍රිතවද ටිකට්පත් සංචිතයක් පවත්වා ගැනීමට පියවර ගන්නා ලදි. මේ අතරම, කාර්ය මණ්ඩලයේ පුහුණු අවශ්‍යතා නිසි පරිදි හඳුනාගත් අප මණ්ඩලය ඊට ඔබින පරිද්දෙන් පුහුණු හා සංවර්ධන වැඩසටහන්ද ක්‍රියාත්මක කරන ලදි. 'අද කෝටිපති' නමින් නව ලොතරැයියක්ද හඳුන්වා දෙන ලදි. මහජනතාවගේ ආකර්ෂණය දිනා ගැනීමට සමත් වූ මෙම නව ලොතරැයිය මෙම වසර තුළ ඉතා ඉහළ අලෙවියක් වාර්තා කරන ලද ලොතරැයි පතකි. සමස්ථයක් වශයෙන් මෙම වසර තුළදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් රු. මිලියන 7,263 ක් වටිනා මුදල් ත්‍යාග ගනුදෙනුකරුවන් වෙත ලබා දී තිබේ.

වසර තුළදී ආයතනයේ තිරසාර මෙහෙයුම් සුපරීක්ෂාකාරී ලෙස සලකා බැලීමෙන් අනතුරුව නුදුරු අනාගතයේදී තවත් ඉදිරි ගමන් මඟක නියැළීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ගැනීමටද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විධිවිධාන සකස් කරනු ඇත.

මෙම අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය අවසන් කරමින් නිරන්තර සහායක් අප වෙත ලබා දුන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය සහ සමස්ථ කාර්ය මණ්ඩලය වෙත අවංක ස්තුතිය පළ කිරීමට කැමැත්තෙමු. විගණකවරුන් ලබා දුන් සහයෝගය වෙනුවෙන්ද සංවර්ධන ලොතරැයි මණ්ඩල අධ්‍යක්ෂ මණ්ඩලයේ කෘතවේදීත්වය හිමි වෙයි. අපගේ සාර්ථකත්වයේ අත්‍යන්ත නියෝජනයක් වන අප හා රැඳී සිටින ගනුදෙනුකාර භවතුන් වෙතද සමස්ථ ආයතනයම වෙනුවෙන් අපි ස්තුතිවන්ත වෙමු. 2018 වසරේදීද දූරදර්ශී ක්‍රියා පිළිවෙතක් අනුගමනය කරමින් අපගේ ආයතනයේ තිරසාරතාව සහතික කරනු පිණිස කැපවීමෙන් කටයුතු කරන බව අපගේ සියලුම පාර්ශවකරුවන් වෙත සපථ කර සිටින්නෙමු.



ඩී. චින්. නානායක්කාර
අධ්‍යක්ෂ

කළමණාකාරීත්වය

ජේ. ඩබ්. සමන් ජයසිංහ මහතා
සාමාන්‍යාධිකාරී

අනුර ජයරත්න මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවිකරණ

විජිතා සෝමරත්න මෙනවිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මුදල්

චානක දොඩංගොඩගේ මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - අලෙවිකරණ

කපිල බුලත්සිංහල මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - අලෙවිකරණ

අසංකා ඩබ්. ගුණසිංහ මිය
සහකාර සාමාන්‍යාධිකාරී - අලෙවිකරණ

කසුන් ජයසූරිය මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - මුදල්

නිශාන් පෙරේරා මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - මුදල්

සුනිල් ජයරත්න මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - විකුණුම්

මධුර හර්ෂණ මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - තොරතුරු තාක්ෂණ

වසන්ත සේනාධීර මහතා
අභ්‍යන්තර විගණක

කණිෂ්ඨ

කළමණාකාරීත්වය

නුවන් අබේරත්න මහතා
පරිපාලන නිලධාරී

මේජර් ජේ. එම්. ඩී. ඒ. ක්‍රිශාන්ත මහතා
ප්‍රධාන ආරක්ෂක නිලධාරී

එන්. වී. ඉන්දික උපුල් මහතා
ගිණුම් නිලධාරී

ආර්. ඩී. චන්ද්‍රා රාජපක්ෂ මිය
ගිණුම් නිලධාරී

නිරංජලා ගුණසේකර මිය
ගිණුම් නිලධාරී

වත්සලා රූපසිංහ මිය
ගිණුම් නිලධාරී

ජී. රෝෂන් ප්‍රියන්ත මහතා
කළාප කළමණාකරු

සී. සී. අයිලප්පෙරුම මහතා
කළාප කළමණාකරු

පී. ඒ. ආර්. එස්. රණතුංග මහතා
කළාප කළමණාකරු

එම්. බී. එම්. එන්. කේ. බලගල්ල මහතා
කළාප කළමණාකරු

එම්. කේ. අජිත් ඉන්දික කමල්සිරි මහතා
කළාප කළමණාකරු

අයි. ඩී. පී. කුමාරසිරි මහතා
කළාප කළමණාකරු


අයි. ඒ. උමේෂ් ගයාංග ඉලේපෙරුම මහතා
පද්ධති විශ්ලේෂක/වැඩසටහන් විශ්ලේෂක

චමිලා තෙවරප්පෙරුම මිය
මානව සම්පත් නිලධාරී

චමින්ද කරුණාරත්න මහතා
ප්‍රසම්පාදන නිලධාරී

DEVELOPMENT LOTTERY

Enriching Your Life





මෙහෙයුම් සමාලෝචනය

මෙහෙයුම් සමාලෝචනය

2017 වසර තුළ ශ්‍රී ලාංකේය ආර්ථික පසුතලය

2016 වසරේදී 4.5% ක් ලෙස වාර්තා වූ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය 2017 වසරේදී 3.1% දක්වා පහත බසින ලදි. අයහපත් කාලගුණික තත්ත්වයන් රටේ කෘෂිකාර්මික කටයුතු කෙරෙහි දිගටම බලපෑම් එල්ල කළ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් එහි 0.8% ක හැකිළීමක් සිදු විය. කර්මාන්තවලට අදාළ ක්‍රියාකාරකම් ආශ්‍රිත 3.9% ක වර්ධනයක් දක්නට ලැබුණේ මූලික වශයෙන්ම නිෂ්පාදන කටයුතු, ඉදිකිරීම්, පතල් කැණීම් ආදී ක්‍රියාකාරකම්හි වර්ධනය හේතුවෙතැයි කිව හැක. දළ දේශීය නිෂ්පාදිතයේ සමස්ථ වටිනාකමින් 26.8% ක් ම නියෝජනය වන්නේ කර්මාන්ත ආශ්‍රිත කටයුතු මගිනි. ආර්ථික වර්ධනයට උපකාරී වෙමින් යුද්ධයෙන් පසු කාලය තුළ වර්ධනීය ස්වභාවයක් පෙන්නුම් කළ ඉදිකිරීම් කටයුතු 2017 වසරේදී සැලකිය යුතු තරමින් පහත වැටී ඇති අතර සේවා අංශය 3.2% කින් වර්ධනය වී තිබේ. මූල්‍ය සේවා කටයුතු, තොග හා සිල්ලර වෙළෙඳාම සහ අනෙකුත් පුද්ගල සේවාවන් ඊට මූලික වශයෙන්ම දායක වී ඇත. මෙම සේවා අංශය සත්‍ය දළ දේශීය නිෂ්පාදිතයෙන් 56.8% ක් නියෝජනය කරයි. මෙම සමාලෝචනයට ලක්වන වර්ෂය තුළ සේවා අංශය ආශ්‍රිතව දැකිය හැකි මෙම වර්ධනය රාජ්‍ය පරිපාලන හා ආරක්ෂක කටයුතුවල අඩු වීම හේතුවෙන් පහත බැසීමක්ද පෙන්නුම් කරයි.

2017 වර්ෂය තුළදී මතුපිට උද්ධමනය ඉලක්ක මට්ටමට වඩා බෙහෙවින් ඉහළින් පැවතියේය. කෙසේ වෙතත්, වසරේ දෙවන භාගය තුළදී යටිදැරි උද්ධමනය ස්ථායී තත්ත්වයට පත් වූ අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුගමනය කරන ලද දැඩි මූල්‍ය ප්‍රතිපත්තිය ඊට හේතු විය. ජාතික පාරිභෝගික මිල දර්ශකය හා කොළඹ පාරිභෝගික මිල දර්ශකය යන දෙකම ආශ්‍රිත ලක්ෂ්‍යමය පදනම මත වෙනස්වීම ඇසුරින් මිනුම්ගත කෙරෙන පරිදි 2017 වසරේ පළමු හා අවසන් කාර්තු දෙක තුළදී ශීර්ෂ උද්ධමනය ඉහළ ගොස් ඇත. මීට බලපෑ මූලික හේතු වශයෙන් ලබා දිය හැක්කේ ආහාර උද්ධමනයේ සංයුක්ත සාධක (අහිතකර කාලගුණ තත්ත්ව හේතුවෙන්) සහ එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බද්ධ සම්බන්ධයෙන් හඳුන්වා දෙන ලද සංශෝධනයන් ආදියයි. මේ අතරම, ගෝලීය වෙළෙඳපොල තුළ පැවැති ඉහළ පාරිභෝගික භාණ්ඩ මිලද 2017 වසර තුළ ශ්‍රී ලංකාවේ උද්ධමනය ඉහළ යාමට බලපා ඇත.

2016 දෙවන භාගයේදී 6.7% ක් වශයෙන් වාර්තා වූ ජාතික පාරිභෝගික මිල දර්ශකය පාදක කරගත් යටිදැරි උද්ධමනය 2017 දෙවන භාගයේදී 2.7% දක්වා පහත බැස ඇත. මේ අතරම 2016 වසර අවසානයේදී 5.8% ලෙස වාර්තා වූ කොළඹ පාරිභෝගික මිල දර්ශකය පාදක කරගත් යටිදැරි උද්ධමනයද 4.3% දක්වා පහත බැස තිබේ.

විදේශ විනිමය මුදල් රට තුළට ගලා ඒම වැඩි වීමත් සමගම රටේ බාහිර අංශය ආශ්‍රිතව වර්ධනීය සලකුණු හඳුනාගත හැකි විය. යුරෝපීය එකමුතුවේ GSP+ මූල්‍ය පහසුකම නැවතත් ක්‍රියාත්මක වීමෙහි සුභවාදී බලපෑමකට ලක් වෙමින් භාණ්ඩ අපනයනයෙන් ලද ආදායම වර්ධනය වී ඇත. කෙසේ වෙතත්, ඉන්ධන හා සහල් ආනයන වියදම් ආදී සාධක හේතුවෙන් දරන්නට සිදු වූ අධික ආනයන වියදම් නිසා වෙළෙඳ ලාභ හිඟය වසර තුළදී ව්‍යාප්ත වූ ලක්ෂණ පෙන්නුම් කරයි.

පෙරමග බලමින්

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව තක්සේරු කර ඇත්තේ පෞද්ගලික අංශයේ දායකත්වය ඉහළ යාම හේතුවෙන් 2022 වසර වන විට දිවයිනේ සත්‍ය දළ දේශීය නිෂ්පාදිතය 6.0% දක්වා ඉහළ යනු ඇති බවටයි. මේ අතරම, දැනුම් පාදක කරගත් සමාජ වෙළෙඳපොල ආර්ථිකයක් පදනම් වූ වර්ධන උපායමාර්ගයක් අනුගමනය කිරීමට ශ්‍රී ලංකා රජය සැලසුම් කරමින් සිටියි.

ප්‍රධාන ක්‍රියාකාරකම්

2017 වසර තුළදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් ජනාධිපති අරමුදල හා මහපොල උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත රු. මිලියන 346.5 ක් දායක කර ඇත. අරමුදල් සම්පාදනය තුළින් දරිද්‍රතාව තුරන් කිරීම, අධ්‍යාපනික කටයුතු සංවර්ධනය සහ අනෙකුත් ජාතික සංවර්ධන ක්‍රියාදාමයන් වෙනුවෙන්ද සංවර්ධන ලොතරැයි මණ්ඩලය දායකත්වය දක්වයි.

ජනාධිපති අරමුදල හා මහපොල උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල මෙන්ම තවත් සංවර්ධන ව්‍යාපෘති රැසක්ම සඳහා අරමුදල් උත්පාදනය කිරීමේ අරමුණින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතට අනුව පාලනය කෙරේ. ජනතාව වෙත ආකර්ෂණීය නිෂ්පාදන මාලාවක්ම ලබා දීමේ අභිලාෂය පෙරදැරි කරගනිමින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් වසර ගණනාවක්ම තිස්සේ විස්තීර්ණ නිපැයුම් කළඹක් සකසා ගෙන ඇත පහත වගුවෙන් දැක්වෙන්නේ මණ්ඩලයේ නිපැයුම් කිහිපයකි:

නිෂ්පාදන කළඹ


உங்களை வெற்றியாளராக்கும் நாடறிந்த அதிர்ஷ்ட சீட்டு
සංවර්ධන
වාසනාව
Development Fortune
அபிவிருத்தி அதிர்ஷ்டம்


ශනිදා
වාසනාව
SATURDAY FORTUNE


ලග්න
වාසනාව
ලක්කින
අදිර්ෂ්ටම්


SUPER
BALL
සුපර් බෝල්
சுப்பர் போல்


කෝටිපති
ශනිදා
கோடிபதி சனிதா
KOTIPATHI SHANIDA


කෝටි 2 කින්
ඇරඹෙන ලුසිරි ජයමල්ල
ජයෝදා
ජ්‍යෝතා Jayoda
ඔබට උරුම ජයක්


නියති ජය
NIYATHA JAYA
நியத்த ஜய


Galaxy
Star
ගැලැක්සි ස්ටාර්
கலக்ஸி ஸ்டார்


DLB
දසලක්ෂපති
தசலக்ஷபதி
CAR PLUS


අද
කෝටිපති
அத கோடீஸ்வரி ADA KOTIPATHI


සංවර්ධන
ක්ෂණික
அபிவிருத்தி
உடனடி

මෙහෙයුම්
සමාලෝචනය ඉතිරිය

නිපැයුම් කළඹ

ලොතරැයිය	තරඟ රටාව	දිනුම් අදින දිනය හා වේලාව	ත්‍යාග ව්‍යුහය	
			සංකලනය	ත්‍යාගය රු.
ශනිදා වාසනාව	අංකනය කළ පන්දු 75 ක් අතරින් ජයග්‍රාහී අංක 4 ක් එක් යන්ත්‍රයක් ආධාරයෙන් තෝරා ගනී.	නිල් පැහැති ටිකට්පත - සඳුදා දම් පැහැති ටිකට්පත - බදාදා කොළ - සෙනසුරාදා	ඉලක්කම් 4 + ඉංග්‍රීසි අක්ෂරය	30,000,000
			ඉලක්කම් 4	1,000,000
	බෝනස් අංකය එම යන්ත්‍රයේම ඇති ඉතිරි බෝල 71 අතරින් එක ඉලක්කමක් තෝරා ගැනේ.	ජාතික රූපවාහිනිය ඔස්සේ සඳුදා, බදාදා සහ සෙනසුරාදා දිනවල ප.ව. 9.30 ට	ඉලක්කම් 3 + බෝනස් අංකය	100,000
		චැනල් අයි නාලිකාව ඔස්සේ සඳුදා, බදාදා සහ සෙනසුරාදා දිනවල ප.ව. 10.00 ට.	ඉලක්කම් 3 + ඉංග්‍රීසි අක්ෂරය	10,000
			ඉලක්කම් 3	1,000
	ඉංග්‍රීසි අක්ෂරය වෙනත් යන්ත්‍රයක ඇති ඉංග්‍රීසි හෝඩියේ අක්ෂර 26 අතරින් එක අක්ෂරයක් ඇති පන්දුවක් තෝරා ගැනේ.		ඉලක්කම් 2 + බෝනස් අංකය	500
			ඉලක්කම් 2 + ඉංග්‍රීසි අක්ෂරය	1,000
			ඉලක්කම් 2	100
			ඉලක්කම් 1 + ඉංග්‍රීසි අක්ෂරය	40
			ඉලක්කම් 1	20
			ඉංග්‍රීසි අක්ෂරය	20
ලග්න වාසනා	පළමු වටය පන්දු 61 ක් අතරින් 4 ක් තෝරා ගැනේ.	නිල් පැහැති ටිකට්පත - අඟහරුවාදා රතු පැහැති ටිකට්පත - සිකුරාදා දම් පැහැති ටිකට්පත - ඉරිදා	ඉලක්කම් 4 + ලග්නය	2,000,000
	දෙවන වටය වෙනම යන්ත්‍රයක් මගින් ලග්න සඳහන් පන්දු 12 ක් අතරින් එකක් තෝරා ගැනේ.	අඟහරුවාදා, සිකුරාදා සහ ඉරිදා දිනවල ප. ව. 9.30 ට ජාතික රූපවාහිනිය ඔස්සේ විකාශය කෙරේ.	ඉලක්කම් 4	500,000
		අඟහරුවාදා, සිකුරාදා සහ ඉරිදා දිනවල ප. ව. 10.00 ට චැනල් අයි ඔස්සේ විකාශය කෙරේ.	ඉලක්කම් 3 + ලග්නය	10,000
			ඉලක්කම් 3	1,000
			ඉලක්කම් 2 + ලග්නය	200
			ඉලක්කම් 1 + ලග්නය	60
			ඉලක්කම් 2	60
			ඉලක්කම් 1	20
			ලග්නය	20

ලොතරැයිය	තරඟ රටාව	දිනුම් අදින දිනය හා වේලාව	ත්‍යාග ව්‍යුහය	
			සංකලනය	ත්‍යාගය රු.
ජයෝද්‍රා	ජයග්‍රාහී අංක 4 කි.	කහ පැහැති ටිකට්පත - සඳුදා	ඉලක්කම් 4 + ඉංග්‍රීසි අක්ෂරය	20,000,000
	අංකනය කළ පන්දු 68 ක් අතරින් 4ක් එක් යන්ත්‍රයක් ආධාරයෙන් තෝරා ගැනේ.	තැඹිලි පැහැති ටිකට්පත - බ්‍රහස්පතින්දා	ඉලක්කම් 4	1,000,000
	ඉංග්‍රීසි අක්ෂරය වෙනත් යන්ත්‍රයක ඇති ඉංග්‍රීසි හෝඩියේ අක්ෂර 26 අතරින් එක අක්ෂරයක් ඇති පන්දුවක් තෝරා ගැනේ.	සඳුදා, බ්‍රහස්පතින්දා දිනවල ප.ව. 9.30 ට ජාතික රූපවාහිනිය ඔස්සේ විකාශය කෙරේ.	ඉලක්කම් 3 + ඉංග්‍රීසි අක්ෂරය	50,000
		සඳුදා හා බ්‍රහස්පතින්දා දිනවල ප. ව. 10.00 ට වැනල් ඇයි ඔස්සේ විකාශය කෙරේ.	ඉලක්කම් 3	2,000
			ඉලක්කම් 2 + ඉංග්‍රීසි අක්ෂරය	1,000
			ඉලක්කම් 2	100
			ඉලක්කම් 1 + ඉංග්‍රීසි අක්ෂරය	40
			ඉලක්කම් 1	20
			ඉංග්‍රීසි අක්ෂරය	20
ගැලැක්සි ස්ටාර්	ජයග්‍රාහී අංක 4 කි.	බදාදා _ නිල්පැහැති කහ පැහැති ටිකට්පත - ඉරිදා	ඉලක්කම් 4 + තරු සළකුණ	2,000,000
	ඉලක්කම් සහිත පන්දු 60 ක් අතරින් එක යන්ත්‍රයකින් එක පන්දු 4 තෝරා ගනු ලැබේ.		ඉලක්කම් 4	500,000
	තරු සලකුණ	බදාදා හා ඉරිදා දිනවල ප.ව. 9.30 ට ජාතික රූපවාහිනිය ඔස්සේ විකාශය කෙරේ.	ඉලක්කම් 3 + තරු සළකුණ	10,000
	වෙනත් යන්ත්‍රයකින් ඉලක්කම් 12 ක් අතරින් එකක් තෝරා ගැනේ.	බදාදා හා ඉරිදා දිනවල ප.ව. 10.00 ට වැනල් අයි ඔස්සේ විකාශය කෙරේ.	ඉලක්කම් 3	1,000
			ඉලක්කම් 2 + තරු සළකුණ	200
			ඉලක්කම් 1 + තරු සළකුණ	60
			ඉලක්කම් 2	40
			ඉලක්කම් 1 + තරු සළකුණ	20
			තරු සළකුණ	20

ලොතරැයිය	තරඟ රටාව	දිනුම් අදින දිනය හා වේලාව	ත්‍යාග ව්‍යුහය	
			සංකලනය	ත්‍යාගය රු.
නියත ජය	ජයග්‍රාහී අංක 4 කි. ඉලක්කම් සහිත පන්දු 65 ක් ඇති එක් යන්ත්‍රයකින් පන්දු 4 ක් තෝරාගනු ලැබේ.	තැඹිලි පැහැති ටිකට්පත - අඟහරුවාදා නිල් පැහැති ටිකට්පත - සිකුරාදා		
	ඉංග්‍රීසි අක්ෂර 01 වෙනත් යන්ත්‍රයක ඇති ඉංග්‍රීසි හෝඩියේ අක්ෂර 26 අතරින් එක අක්ෂරයක් ඇති පන්දුවක් තෝරා ගැනේ.	අඟහරුවාදා, සිකුරාදා දිනවල ප. ව. 9.30 ට ජාතික රූපවාහිනිය ඔස්සේ විකාශය කෙරේ.		
		අඟහරුවාදා, සිකුරාදා දිනවල ප. ව. 10.00 ට චැනල් අයි ඔස්සේ විකාශය කෙරේ.	ඉලක්කම් 4 + ඉංග්‍රීසි අක්ෂරය	10,000,000
			ඉලක්කම් 4	1,000,000
			ඉලක්කම් 3 + ඉංග්‍රීසි අක්ෂරය	50,000
			ඉලක්කම් 3	1,000
			ඉලක්කම් 2 + ඉංග්‍රීසි අක්ෂරය	1,000
			ඉලක්කම් 2	60
			ඉලක්කම් 1 + ඉංග්‍රීසි අක්ෂරය	40
			ඉලක්කම් 1	20
			ඉංග්‍රීසි අක්ෂරය	20
සුපර් බෝල්	ජයග්‍රාහී අංක 4 කි. ඉලක්කම් සහිත පන්දු 73 ක් ඇති එක් යන්ත්‍රයකින් පන්දු 4 ක් තෝරාගනු ලැබේ.	නිල් පැහැති ටිකට්පත - සෙනසුරාදා කොළ පැහැති ටිකට්පත - බ්‍රහස්පතින්දා දම් පැහැති ටිකට්පත - සඳුදා	ඉලක්කම් 4 + ඉංග්‍රීසි අක්ෂරය	40,000,000
	ඉංග්‍රීසි අක්ෂර 01 වෙනත් යන්ත්‍රයක ඇති ඉංග්‍රීසි හෝඩියේ අක්ෂර 26 අතරින් එක අක්ෂරයක් ඇති පන්දුවක් තෝරා ගැනේ.	සෙනසුරාදා, බ්‍රහස්පතින්දා, සඳුදා දිනවල ප. ව. 9.45 ට ජාතික රූපවාහිනිය ඔස්සේ විකාශය කෙරේ.	ඉලක්කම් 4	1,000,000
		සෙනසුරාදා, බ්‍රහස්පතින්දා, සඳුදා දිනවල ප. ව. 10.00 ට චැනල් අයි ඔස්සේ විකාශය කෙරේ.	ඉලක්කම් 3 + ඉංග්‍රීසි අක්ෂරය	100,000

ලොතරැයිය	තරඟ රටාව	දිනුම් අදින දිනය හා වේලාව	ත්‍යාග ව්‍යුහය	
			සංකලනය	ත්‍යාගය රු.
			ඉලක්කම් 3	2,000
			ඉලක්කම් 2 + ඉංග්‍රීසි අක්ෂරය	1,000
			ඉලක්කම් 2	100
			ඉලක්කම් 1 + ඉංග්‍රීසි අක්ෂරය	40
			ඉලක්කම් 1	20
			ඉංග්‍රීසි අක්ෂරය	20
සංවර්ධන ලක්ෂපති	ජයග්‍රාහී අංක 3 කි. ඉලක්කම් සහිත බෝල 50 ක් ඇති එක් යන්ත්‍රයකින් බෝල 3 ක් තෝරාගනු ලැබේ.	සඳුදා - රතු ටිකට්පත් සෑම සඳුදා දිනකම ප. ව. 9.45 ට රූපවාහිනිය ඔස්සේ විකාශය කෙරේ.	ඉලක්කම් 3 ඉලක්කම් 2 ඉලක්කම් 1	100,000 200 20
කෝටිපති ශනිදා	පළමු වටය එක් යන්ත්‍රයක් ආධාරයෙන් අංකනය කළ පන්දු 80 ක් අතරින් 4 ක් තෝරාගනු ලැබේ.	දම් පැහැති ටිකට්පත - අඟහරුවාදා තැඹිලි පැහැති ටිකට්පත - සිකුරාදා කොල පැහැති ටිකට්පත - ඉරිදා	ඉලක්කම් 4 + ඉංග්‍රීසි අක්ෂරය	75,000,000
	දෙවන වටය වෙනම යන්ත්‍රයක් ආධාරයෙන් ඉංග්‍රීසි අක්ෂර 26 අතරින් එකක් තෝරාගනු ලැබේ.	අඟහරුවාදා, සිකුරාදා සහ ඉරිදා දිනවල ප. ව. 9.30 ට ජාතික රූපවාහිනිය ඔස්සේ විකාශය කෙරේ.	ඉලක්කම් 4	1,000,000
		අඟහරුවාදා, සිකුරාදා සහ ඉරිදා දිනවල ප. ව. 10.00 වැනල් අයි ඔස්සේ විකාශය කෙරේ.	ඉලක්කම් 3 + ඉංග්‍රීසි අක්ෂරය	100,000
			ඉලක්කම් 3	2,000
			ඉලක්කම් 2 + ඉංග්‍රීසි අක්ෂරය	1,000
			ඉලක්කම් 2	100
			ඉලක්කම් 1 + ඉංග්‍රීසි අක්ෂරය	60
			ඉලක්කම් 1	20
			ඉංග්‍රීසි අක්ෂරය	20
			ඉංග්‍රීසි අක්ෂරය පමණක්	20

ලොතරැයිය	තරඟ රටාව	දිනුම් අදින දිනය හා වේලාව	ත්‍යාග ව්‍යුහය	
			සංකලනය	ත්‍යාගය රු.
සංවර්ධන වාසනාව	පළමු වටය	නිල් පැහැති ටිකට්පත - බ්‍රහස්පතින්දා		
	එක් යන්ත්‍රයක් ආධාරයෙන් අංකනය කළ පන්දු 65 ක් අතරින් 4 ක් තෝරාගනු ලැබේ.	රෝස පැහැති ටිකට්පත - සෙනසුරාදා		
	දෙවන වටය	බ්‍රහස්පතින්දා සහ සෙනසුරාදා දිනවල ප. ව. 9.30 ට ජාතික රූපවාහිනිය ඔස්සේ විකාශය කෙරේ.		
	වෙනම යන්ත්‍රයක් ආධාරයෙන් මාස 12 අතරින් එක් මාසයක් තෝරාගනු ලැබේ.		අදාල මාසය	20
	තුන්වන වටය අංක 6ක් අතරින් එක් අංකයක් තෝරා ගනී.		ඕනෑම තනි අංකයක් (සුපිරි අංක හැර)	20
			ඕනෑම තනි අංකයක් + වාසනාවන්ත මාසය	40
			ඕනෑම අංක 2ක්	100
			ඕනෑම අංක 2ක් + වාසනාවන්ත මාසය	200
			ඕනෑම අංක 3ක්	1,000
			ඕනෑම අංක 3ක් + වාසනාවන්ත මාසය	5,000
			ඕනෑම අංක 4ක්	500,000
			ඕනෑම අංක 4ක් + සුපිරි අංකය	1,000,000
			ඕනෑම අංක 4ක් + වාසනාවන්ත මාසය	2,000,000
			ඕනෑම අංක 4ක් + වාසනාවන්ත මාසය + සුපිරි අංකය	5,000,000
දස ලක්ෂපති	පළමු වටය	රතු පැහැති ටිකට්පත - බදාදා	ඉලක්කම් 3 + ඉංග්‍රීසි අක්ෂරය + විශේෂ දිනය	2,500,000/Car
	එක් යන්ත්‍රයකින් අංකනය කළ පන්දු 55ක් අතරින් ඉලක්කම් 3 ක් තෝරාගනු ලැබේ.	බදාදා දිනවල ප. ව. 9.30 ට ජාතික රූපවාහිනිය ඔස්සේ විකාශය කෙරේ.	ඉලක්කම් 3 + ඉංග්‍රීසි අක්ෂරය	1,000,000
	දෙවන වටය ඉංග්‍රීසි අක්ෂරයක් සඳහන් බෝල 1 ක් වෙනත් යන්ත්‍රයකින් තෝරාගනු ලැබේ.	බදාදා දිනවල ප. ව. 10.00 චැනල් අයි ඔස්සේ විකාශය කෙරේ.	ඉලක්කම් 3	100,000

ලොතරැයිය	තරඟ රටාව	දිනුම් අදින දිනය හා වේලාව	ත්‍යාග ව්‍යුහය	
			සංකලනය	ත්‍යාගය රු.
	තෙවන වටය එක් යන්ත්‍රයක් ආධාරයෙන් අංකනය කළ ලද පන්දු යොදා ගෙන සතියේ දින 7 අතරින් විශේෂ දිනයක් තෝරාගනු ලැබේ.		ඉලක්කම් 2 + ඉංග්‍රීසි අක්ෂරය	1,000
			ඉලක්කම් 2	200
			ඉලක්කම් 1 + ඉංග්‍රීසි අක්ෂරය	100
			ඉලක්කම් 1	20
අද කෝටිපති	පළමු වටය	රතු පැහැති ටිකට්පත - සඳුදා	ඉලක්කම් 4 + ඉංග්‍රීසි අක්ෂරය	50,000,000
	එක් යන්ත්‍රයක් ආධාරයෙන් අංකනය කළ පන්දු 75ක් අතරින් අංක 4ක් තෝරා ගනු ලැබේ.	තද නිල් පැහැති ටිකට්පත - අඟහරුවාදා කොළ පැහැති ටිකට්පත - බදාදා දම් පැහැති ටිකට්පත - බ්‍රහස්පතින්දා තැඹිලි පැහැති ටිකට්පත - සිකුරාදා රෝස පැහැති ටිකට්පත - සෙනසුරාදා ලා නිල් පැහැති ටිකට්පත - ඉරිදා	ඉලක්කම් 4	1,000,000
		සඳුදා, අඟහරුවාදා, බදාදා, බ්‍රහස්පතින්දා, සිකුරාදා, සෙනසුරාදා සහ ඉරිදා දිනවල ප. ව. 9.30 ට ජාතික රූපවාහිනිය ඔස්සේ විකාශය කෙරේ.	ඉලක්කම් 3 + ඉංග්‍රීසි අක්ෂරය	100,000
		සඳුදා, අඟහරුවාදා, බදාදා, බ්‍රහස්පතින්දා, සිකුරාදා, සෙනසුරාදා සහ ඉරිදා දිනවල ප. ව. 10.00 චැනල් අයි ඔස්සේ විකාශය කෙරේ.	ඉලක්කම් 3	1,000
			ඉලක්කම් 2 + ඉංග්‍රීසි අක්ෂරය	1,000
			ඉලක්කම් 2	100
			ඉලක්කම් 1 + ඉංග්‍රීසි අක්ෂරය	40
			ඉලක්කම් 1	20
			ඉංග්‍රීසි අක්ෂරය	20

සබඳතා ගොඩනැගීම

මෙහි සමාලෝචනයට ලක් වන වර්ෂය තුළ සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් අලෙවි නියෝජිතයන්, බෙදාහරින්නන් සහ මහජනතාව ඇතුළු සියලුම පාර්ශවකරුවන් සමග සබඳතා ගොඩනැගීමට අවශ්‍ය මූලික පසුබිම සකස් කරන ලදි. සබඳතා සවිමත් කරමින් විශ්වාසය ගොඩනැගීමේ අරමුණින් පාර්ශවකරුවන් සියලුම දෙනාගේ අභිලාෂ නිසි පරිදි ආමන්ත්‍රණය කිරීම සහ නව සන්නිවේදන ජාල ආරම්භ කිරීමට ආයතනය කටයුතු කරන ලදි.

නියෝජිතයන් අතර විශ්වාසය තර කිරීම

අනපේක්ෂිත ලෙස ටිකට්පත්වල මිල ඉහළ යාමත් සමග මතු වූ දැවැන්ත අභියෝගය, සංවර්ධන ලොතරැයි මණ්ඩලයට අනුබද්ධිත දීප ව්‍යාප්ත නියෝජිත ජාලය සමග අවංක සන්නිවේදනයක නියැළීමත්, විශ්වාසය තර කර ගැනීමත් වෙනුවෙන් යොදා ගැනීමට අපි කටයුතු කළෙමු. මෙම අරමුණ මත පදනම් වෙමින් නියෝජිත ජාලය සවිමත් කිරීම වෙත අවධානය යොමු කළ වර්ධන උපායමාර්ගයක් ක්‍රියාත්මක කරන ලදි. මේ අතරම, උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල නියෝජිත ජාල සංවර්ධනය කිරීමේ පියවරක් වශයෙන් අප විසින් ගාස්තු අය කිරීමකින් තොරව ඔවුන් හට ටිකට්පත් අලෙවි කුට්ටි ලබා දෙන ලදි.

මහජනයා අතර විශ්වාසය තර කිරීම

මෙහි සමාලෝචනයට ලක් වන වර්ෂය තුළදී ලොතරැයි ජයග්‍රහකයන් මහජනතාවට හඳුන්වා දීමේ අරමුණින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් 'වාසනාවට විනාඩියක්' නමින් රූපවාහිනී වැඩසටහනක් විකාශය කිරීම අරඹන ලදි. මෙය සිංහල හා දමිළ දෙබසින්ම ජාතික රූපවාහිනිය ඔස්සේ විකාශය කෙරේ. හුදෙක් අලෙවි ප්‍රචාරණ අරමුණුවලට සීමා නොවී මහජනතාව අතර විශ්වාසය ගොඩනැගීම උදෙසා සැබෑ ජයග්‍රාහකයන්ගේ විස්තර ජනතාවට සන්නිවේදනය කිරීමට මෙමගින් පියවර ගැනේ.

කාර්ය මණ්ඩලයේ ශක්‍යතා වැඩිදියුණු කිරීම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවක සේවිකාවන්ගේ ශක්‍යතා සංවර්ධනය කරනු වස් විස්තීර්ණ පුහුණු වැඩසටහන් මාලාවක්ද පවත්වන ලදි.

කාර්යසාධන දර්ශකයන්ට අදාළ වැදගත් තොරතුරු

	2016	2017
ඉහළම ලොතරැයි ජයග්‍රහණ	98,560,620	**104,565,936**
ජයග්‍රාහකයන්ගේ සාමාන්‍යය මසකට	15,336,386	**14,375,639**
සමස්ථ අලෙවිය (වාර්ෂික)	14,759,875,240	**13,981,500,306**
ගෙවන ලද ත්‍යාග මුදල් වැකතුව	7,755,659,066	**7,263,436,665**
ජයග්‍රාහකයන් සංඛ්‍යාව	184,036,631	**172,507,676**
බිහි කළ මිලියනපතියන් සංඛ්‍යාව	540	**507**
ජනාධිපති අරමුදලට දායකත්වය	1,836,020,000	**346,541,000**

'අද කෝටිපති' ලොතරැයිය හඳුන්වා දීම

අපගේ නිපැයුම් කළඹට අභිනවයෙන් එකතු කළ 'අද කෝටිපති' ලොතරැයිය මහජනතාව අතර වැඩිම ජනප්‍රියත්වයක් දිනාගත් අතර මෙම වසර තුළදී පස්වන ස්ථානයට වැඩියෙන්ම ටිකට්පත් අලෙවි වූ ලොතරැයිය වූයේ එයයි.

වැදගත් අලෙවිකරණ හා මෙහෙයුම් තොරතුරු

2017 වසරේදී අපේක්ෂිත ප්‍රතිඵල උදාකර ගනිමින් ව්‍යාපාරික තිරසාරතාව සවිමත් කිරීමේ අරමුණින් අපගේ අලෙවිකරණ හා විකුණුම් කටයුතු කාර්යක්ෂම කරන ලදි. ඒ අනුව, එකී කාර්යයන්හි සාර්ථකත්වය වර්ධනය කරගැනීමට අපට හැකි වූ අතර එහි ප්‍රතිඵලය වූයේ ජනාධිපති අරමුදල වෙත සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් දායක කරන්නට හා ලොතරැයි ජයග්‍රාහකයන් හට වැඩි වැඩියෙන් මුදල් ත්‍යාග ලබාදීමට හැකි වීමයි.

අලෙවි සංවර්ධන ක්‍රියාකාරකම් - 2017

නව ලොතරැයි ටිකට්පත් හඳුන්වා දීම

- 'දස ලක්ෂපති'
  අලෙවිය වැඩිකර ගනිමින් තරගකාරීත්වය නිසි ලෙස කළමනාකරණය කරගැනීමේ අරමුණින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් 2017 අප්‍රේල් 05 වන දින 'දස ලක්ෂපති' යන නව සන්නාමය යටතේ 'සංවර්ධන ලක්ෂපති' ලොතරැයිය නැවත හඳුන්වා දෙන ලදි.
- 'අද කෝටිපති'
  සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් 2017 අගෝස්තු 31 වන දින 'අද කෝටිපති' නමින් නව ලොතරැයියක් හඳුන්වා දෙන ලදි.

- උතුරු හා නැගෙනහිර පළාත්වාසීන්ගේ අපේක්ෂාවන් ඉටු කළ හැකි පරිදි 'ලග්න වාසනාව' ලොතරැයිය 'රාශි අධිෂ්ඨාන්' නමින් නැවත හඳුන්වා දීමට පියවර ගන්නා ලදි.
- බදාදා සහ සෙනසුරාදා දිනවලට අමතරව සඳුදා දිනවලද 'ශනිදා වාසනා' ලොතරැයිය දිනුම් ඇදීම ආරම්භ කරන ලදි.

ප්‍රවර්ධන ක්‍රියාකාරකම්

- ලොතරැයි ජයග්‍රාහකයන් හඳුන්වා දෙමින් ගනුදෙනුකරුවන් අතර අප කෙරෙහි ඇති විශ්වාසය ඉහළ නැංවීම සඳහා 2017 ජූලි මාසයේ සිට 'වාසනාවට විනාඩියක්' රූපවාහිනී වැඩසටහන විකාශය කිරීම ආරම්භ කරන ලදි.
- 'ටිකට් එකයි - චාන්ස් දෙකයි' ක්‍රියාදාමය - අලෙවිය වැඩිකර ගනිමින් වැඩි පිරිසක් වෙත ළඟා වීමේ අරමුණින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් 2017 ජූලි මාසයේ සිට ආරම්භ වන පරිදි මාස දෙකක කාලයක් පුරාවට 'ටිකට් එකයි - චාන්ස් දෙකයි' වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. මෙම කාල වකවානුව තුළ පළමු දිනුම් ඇදීමෙන් අනතුරුව ඉතිරි වූ ඉලක්කම් යොදා ගනිමින් තෝරාගත් ලොතරැයි කිහිපයක් සඳහා දෙවන දිනුම් ඇදීමක් සිදු කරන ලදි. මෙම ද්විමාසික වැඩසටහනට අනුකූල වන පරිදි දිවයින පුරා බිම් මට්ටමේ ප්‍රවර්ධන වැඩසටහනක්ද පැවැත්වීමු. මේ සඳහා තෝරාගනු ලැබූ ලොතරැයි පහත දැක්වේ:
- ශනිදා වාසනාව
- ලග්න වාසනාව
- ජයෝදා
- ගැලැක්සි ස්ටාර්
- නියත ජය
- සුපර් බෝල්
- දස ලක්ෂපති
- කෝටිපති ශනිදා
- සංවර්ධන වාසනාව
- 'අද කෝටිපති' ප්‍රවර්ධන වැඩසටහන 2017 ඔක්තෝම්බර් මාසයේදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් සාමාන්‍ය ප්‍රමාණයට වඩා තරමක් විශාල ලෙස 'කෝටිපති ශනිදා' ලොතරැයි මුද්‍රණය කොට අලෙවි කරන ලද අතර වඩා පුළුල් පිරිසක් වෙත ළඟා වීම එහි අරමුණ විය. මෙය, ටිකට් පත් මිලියන 2.2 ක් අලෙවි කිරීමට මග පෑදූ සාර්ථක වැඩසටහනක් විය. 2017 ඔක්තෝම්බර් 31 දින මීට අදාළ දිනුම් ඇදීම සිදු කරන ලදි.

2017 නොවැම්බර් මාසයේ සිට මාස දෙකක කාලයක් පුරාවට සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් 'ගැලැක්සියෙන් ගැලැක්සි 5ක්' ප්‍රවර්ධන වැඩසටහන පවත්වන ලදි. ජයග්‍රාහකයන් සංඛ්‍යාව වැඩි කිරීමේ අරමුණින් පළමු දිනුම් ඇදීමෙන් අනතුරුව 'විශේෂ අංක' තීරයේ සඳහන් ඉලක්කම් හත අතරින් පහක් තෝරාගෙන දිනුම් ඇදීම සිදු කෙරුණි.

- 2017 නොවැම්බර් 30 වන දින ක්‍රියාත්මක කරන ලද 'සුපර් බෝල්' ප්‍රවර්ධන වැඩසටහන - සාමාන්‍ය ප්‍රමාණයට වඩා තරමක් විශාල ලෙස මුද්‍රණය කරන ලද සුපර් බෝල් ලොතරැයි යොදාගෙන පවත්වන ලද මෙම ප්‍රවර්ධන වැඩසටහනට වැඩි පිරිසක් වෙත ළඟා වීමේ අරමුණින් අමතර දිනුම් රටාවක් ඇතුළත් විය. ටිකට්පත් මිලියන 2.6 ක් අලෙවි කරමින් මෙම වැඩසටහන සාර්ථක ලෙස නිමාව දුටුවේය.
- 2017 දෙසැම්බර් 30 දින පවත්වන ලද 'ශනිදා වාසනා' ප්‍රවර්ධන වැඩසටහන - 'නව අවුරුදු සිහිනය' ලෙස සඳහන් කරමින් සාමාන්‍ය ප්‍රමාණයට වඩා තරමක් විශාල ලෙස මුද්‍රණය කරන ලද 'ශනිදා වාසනා' ලොතරැයි රු. 100 ක මිලකට අලෙවි කරන ලදි. මෙම දිනුම් ඇදීම 2017 දෙසැම්බර් 31 දින පැවැත්වුණු අතර මෙම ප්‍රවර්ධන වැඩසටහනද සාර්ථක ලෙස අවසන් වූයේ ටිකට්පත් මිලියන 1 ක් අලෙවි කරමිනි.

බෙදා හැරීම් නියෝජිතයන් පත් කිරීම

දිස්ත්‍රික්කය	පත් කළ නියෝජිතයන් සංඛ්‍යාව
ගාල්ල	1
මාතර	1
අනුරාධපුර	1
පොළොන්නරුව	1
බදුල්ල	1
රත්නපුර	1
ගම්පහ	1
චිකතුව	7

නව අලෙවි නියෝජිතයන් පත් කිරීම

දිස්ත්‍රික්කය	සංඛ්‍යාව
කොළඹ	198
කළුතර	49
මහනුවර	55
මාතලේ	35
නුවර එළිය	20
ගාල්ල	56
මාතර	62
යාපනය	23
මොනරාගල	10
රත්නපුර	66
හම්බන්තොට	34
කිලිනොච්චිය	06

දිස්ත්‍රික්කය	සංඛ්‍යාව
මන්නාරම	01
මඩකලපුව	09
අම්පාර	11
ත්‍රිකුණාමලය	08
කුරුණෑගල	57
පුත්තලම	18
අනුරාධපුරය	52
පොළොන්නරුව	14
බදුල්ල	34
කෑගල්ල	42
ගම්පහ	138
වවුනියාව	10
මුලතිව්	07
එකතුව	1,015

බෙදාහැරීමේ නියෝජිත ජාලය පරිගණකගත කිරීම

2017 වසරේදී සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ බෙදාහැරීමේ නියෝජිත ජාලය පරිගණකගත කරමින් ඔවුනට සෘජුවම අප ප්‍රධාන කාර්යාලය හා සම්බන්ධ වීමට ඇති අවකාශය පුළුල් කරන ලදි.

බෙදාහැරීමේ නියෝජිතයන් සහ අලෙවි නියෝජිතයන් යන දෙපිරිසම වෙනුවෙන් දිරිදීමනා යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම

අලෙවිය වැඩිකර ගැනීමේ ප්‍රයත්නයක් වශයෙන් සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් 2017 දෙසැම්බර් 31 දින දක්වා බෙදාහැරීමේ නියෝජිතයන් හා අලෙවි නියෝජිතයන් වෙනුවෙන් දිරිදීමනා යෝජනා ක්‍රමයක් පවත්වාගෙන යන ලදි.

වෛද්‍යාධාර

2017 වසරේදී සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ නියෝජිතයන් හා අලෙවි සහකරුවන් වෙනුවෙන් වෛද්‍යාධාර පහසුකම් ලබා දීමටද පියවර ගන්නා ලදි. ඒ අනුව, අලෙවි නියෝජිතයන් හා සහකරුවන් 113 දෙනෙකු වෙත වෛද්‍යාධාර වශයෙන් රු. 2,237,400 ක මුදලක් ලබා දෙන ලදි.

විශ්වවිද්‍යාල ශිෂ්‍යත්ව

අලෙවි නියෝජිතයන්ගේ දරුවන් විශ්වවිද්‍යාලයට ඇතුළු වූ පසුව ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමටද සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2017 දී පියවර ගන්නා ලදි. ශිෂ්‍යත්ව අරමුදල් වශයෙන් රු. 589,500 ක මුළු මුදල් ප්‍රමාණයක් මෙම විශ්වවිද්‍යාල සිසුන් 33 දෙනෙකු වෙත ලබා දෙන ලදි.

අලෙවි නියෝජිතයන් සඳහා කණ්ඩායම් රැස්වීම්

අලෙවි නියෝජිතයන් වෙනුවෙන් දිස්ත්‍රික්ක මට්ටමින් කණ්ඩායම් රැස්වීම් සංවිධානය කිරීමටද සංවර්ධන ලොතරැයි මණ්ඩලය කටයුතු කරන ලදි.

අලෙවි කුට්ටි සහ ස්ටිකර් ලබා දීම

සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් අලෙවි නියෝජිතයන් 43 ක් වෙනුවෙන් ලොතරැයි අලෙවි කුට්ටි ඉදිකිරීම සඳහා රු. 645,000 ක මුදලක් වැය කරන ලදි. මේ අනුව, සෑම අලෙවි නියෝජිතයෙකුම වෙත රු. 15,000 ක මුදලක් ලබා දෙන ලදි.

රු. 1,991,250 ක මුදලක් වැය කරමින් කොළඹ හා කළුතර දිස්ත්‍රික්ක තුළ අභිනව ලොතරැයි අලෙවි කුට්ටි 59 ක් ඉදිකරන ලදි.

එසේම, ලොතරැයි අලෙවි කුට්ටි සඳහා ස්ටිකර් ලබා දීම වෙනුවෙන් සංවර්ධන ලොතරැයි මණ්ඩලය රු. 298,755 ක මුදලක් වැය කර ඇත.

ආයතනික සමාජ වගකීම

ආයතනික සමාජ වගකීම් වැඩසටහන් වෙනුවෙන් මෙම සමාලෝචිත වසර තුළදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් ආයෝජනය කරන ලද මුළු මුදල රු. මිලියන 2.5 කි.


කොළඹ, කළුතර, ගම්පහ, කෑගල්ල, ගාල්ල, මාතර, හම්බන්තොට සහ රත්නපුර දිස්ත්‍රික්කවල ගංවතුරෙන් පීඩාවට පත් වූ අලෙවි නියෝජිතයන් හා අලෙවි සහකරුවන් වෙත උපකාර කිරීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය කටයුතු කරන ලදි. ඒ අනුව, ගංවතුර හේතුවෙන් විනාශ වූ ලොතරැයි ටිකට්පත් නිසා සිදු වූ අලාභය හිලවු කර ගැනීමට ඔවුනට සහාය වන අතරම වියළි ආහාර, නව අලෙවි කුට්ටි සහ ශබ්ද විකාශන යන්ත්‍ර කට්ටලද ලබා දෙන ලදි.

රූපවාහිනී ලොතරැයි දිනුම් ඇදීම් ආවරණය කළ නිවේදක නිවේදිකාවන්ගේ මෙහෙවර පිළිගැනීමට හා ඇගයීමට ලක් කිරීම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලොතරැයි දිනුම් ඇදීම් ඉදිරිපත් කළ රූපවාහිනී නිවේදක නිවේදිකාවන්ගේ සේවය සාංකේතික ඇගයීමකට ලක් කරනු වස් උත්සවයක් සංවිධානය කරන ලදි. 2017 ඔක්තෝබර් 28 දින කොළඹ හිල්ටන් හෝටලයේදී එය පැවැත්වීමට කටයුතු යොදන ලදි.

DEVELOPMENT LOTTERY

Enriching Your Life





තිරසර වාර්තාව

තිරසාරතා වාර්තාව

තිරසාර මෙහෙයුම් හා මූලික වටිනාකම්

දරිද්‍රතාව තුරන් කිරීම අරමුණු කරගත් වැඩසටහන් සහ උසස් අධ්‍යාපනික හා වෙනත් සංවර්ධන වැඩසටහන් තුළින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනය වෙනුවෙන් දායකත්වය දක්වයි. විහිදී ආර්ථික හා සමාජයීය ක්ෂේත්‍ර ඉතා සමීපයෙන් පවත්වා ගනු ලැබේ. ආයතනයේ මෙහෙයුම් ආශ්‍රයෙන් ගත් විට අපගේ දෛනික ක්‍රියාකාරකම් මෙන්ම අනාගත ප්‍රගමනද කෙරෙහි බලපාන ගැටළුවලට සාර්ථක විසඳුම් හඳුනාගැනීම කෙරෙහි අපගේ අවධානය යොමු වේ. අප නිරන්තරයෙන්ම උත්සුක වන්නේ ගනුදෙනුකරුවන්, සේවකයන්, සැපයුම්කරුවන් හා මහජනතාවගේ ජීවිතවලට වටිනාකමක් එක් කිරීම වෙනුවෙනි. සේවකයින් තුළ රජකාරීන්ට ඇති උනන්දුව වර්ධනය කිරීම, සේවාස්ථානය තුළදී ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම එක සමාන අවස්ථා උදා කිරීම සහ ධනාත්මක හා දීර්ඝ කාලීන වර්ධනය වෙනුවෙන් සමාජයීය මැදහත්වීමක් දැක්වීම ආදී කාරණා අපගේ තිරසාරතා න්‍යායපත්‍රයෙහි වැදගත් අංග වේ.

ලොතරැයි ටිකට්පත් නිරන්තරයෙන් ලබාගැනීමට ඇති හැකියාව තහවුරු කිරීම

2017 වසර තුළදී ටිකට්පත් අඛණ්ඩව අලෙවි කිරීමට හැකි වන පරිදි නියෝජිතයන්ට ඒවා ලබා ගැනීමට ඇති අවස්ථා සම්බන්ධයෙන් හිදැසක් අපි හඳුනා ගතිමු. එම ගැටළුවට පිළියමක් සොයමින් බෙදාහැරීමේ ජාලය ප්‍රතිසංවිධානය කළ සංවර්ධන ලොතරැයි මණ්ඩලය ටිකට්පත් සැපයීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීමට පියවර ගෙන ඇත. මේ වන විට ඉදිරි දින 10 ක කාලය සඳහා ප්‍රමාණවත් අමතර ටිකට්පත් සංචිතයක් ප්‍රධාන කාර්යාල පරිශ්‍රයෙහි පවත්වා ගැනීමට අපි කටයුතු කරන්නෙමු. මේ අතරම අපගේ නියෝජිතයන් හා බෙදාහරින්නන් විසින් දින හතරක කාලයක් සඳහා ප්‍රමාණවත් ටිකට්පත් තොගයක් පවත්වා ගනු ලැබේ.

මානව සම්පත් සංවර්ධනය

අප නිරන්තරයෙන් විශ්වාස කරන කරුණක් වන්නේ සේවක සුභසිද්ධිය සෘජුවම අපගේ මෙහෙයුම්වල සාර්ථකත්වය හා බැඳී ඇති බවයි. ඒ අනුව අපගේ සේවක සංවර්ධන න්‍යායපත්‍රය සකස් කර ඇත්තේ සෑම සේවකයෙකුම සතු ශක්‍යතා හඳුනාගෙන ඔවුන්ගේ වෘත්තීය ඉලක්ක සාක්ෂාත් කරගැනීමට සහාය දැක්වීමේ අරමුණ පෙරදැරි කරගෙන වේ.

කාර්ය මණ්ඩල සංවර්ධන රාමුව



පුහුණු හා සංවර්ධන

ආයතනයේ හඳුනාගත් ඉලක්කවලට අනුකූල වන පරිදි සේවකයින්ගේ කුසලතා හා නිපුණතා සංවර්ධනය කිරීම අවධානයට ගනිමින් පුහුණු වැඩසටහන් රැසක් පැවැත්වීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2017 වසර පුරාවට කටයුතු කර ඇත.

විදේශීය පුහුණු වැඩසටහන්

සේවකයාගේ නම	තනතුර	පුහුණු වැඩසටහන	පැවැත්වූ රට	පාඨමාලා කාල සීමාව
එස්. ගුණසිංහ මිය	සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි)	සංවිධාන හා ව්‍යාපෘති සඳහා නූතන උපායමාර්ගික සංකල්ප	තායිලන්ත	දින 09
එස්. එම්. ඒ. ඩබ්ලිව්. උදය කුමාර මහතා	අභ්‍යන්තර විගණක	සංවිධාන හා ව්‍යාපෘති සඳහා නූතන උපායමාර්ගික සංකල්ප	තායිලන්තය	දින 09
නිශාන් පෙරේරා මහතා	සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)	සංවිධාන හා ව්‍යාපෘති සඳහා නූතන උපායමාර්ගික සංකල්ප	තායිලන්තය	දින 09

සේවකයාගේ නම	තනතුර	පුහුණු වැඩසටහන	ස්ථානය	පාඨමාලා කාල සීමාව
ඒ. ටී. එම්. අමරසිංහ මහතා	කළමනාකරණ සහකාර	බහුමාධ්‍ය ඩිප්ලෝමා	විජය ග්‍රැෆික්ස්	දින 03
අයන්ති සාරංගා මිය	කළමනාකරණ සහකාර	ලිපිකරු නිපුණතා	නිපුණතා සංවර්ධන අරමුදල් පරිශ්‍රය	දින 03
දිනූෂා රාජපක්ෂ මිය				
මධුර බුද්ධික මහතා				
තිලිණි පියුම්කා මිය				
අනුරාධ ගොඩම්පල මිය				
සමන්ත කුමාර මහතා				
අවන්ති සුරේඛා මිය				
පවිත්‍රා කොඩිකාර මිය				
ජගත් මුදන්නායක මහතා				
සුදර්ශන නැදගමුව මහතා				
එස්. යූ. ජයසේකර මිය				
හිමාලි විතානගේ මිය				
ඩබ්. එම්. ප්‍රාර්ථනා මිය				
නුවන් අබේරත්න මහතා	පරිපාලන නිලධාරී	විනය පරිපාටිය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	දින 06
ආර්. ඩී. සී. රාජපක්ෂ මිය	ගිණුම් නිලධාරී	මූලික ගබඩා කළමනාකරණය	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	දින 01
ජේ. ඩී. සී. චිල්. පෙරේරා මෙනෙවිය	කළමනාකරණ සහකාර	අවදානම් තක්සේරුව, ගිණුම් සැලසුම්කරණය හා අභ්‍යන්තර කළමනාකරණය	සවුසිරිපාය	දින 01
කේ. එම්. එන්. එම්. කරුණානායක මෙනවිය				

සේවකයාගේ නම	තනතුර	පුහුණු වැඩසටහන	ස්ථානය	පාඨමාලා කාල සීමාව
චින්තක පුෂ්පකුමාර මහතා	රියදුරු	ආරක්ෂිත රිය පැදවීම හා මාර්ග නීති	ප්‍රාග් ආයතනය	දින 01
එස්. පී. මාරසිංහ				
ජගත් පුෂ්පකුමාර මහතා				
එච්. ඒ. ආර්. එස්. පෙරේරා මහතා	කළමනාකරණ සහකාර	කොන්ත්‍රාත්තු කළමනාකරණය හා සේවක වැටුප්	නිපුණතා සංවර්ධන අරමුදල් පරිශ්‍රය	දින 01
චමින්ද කරුණාරත්න මහතා	ප්‍රසම්පාදන නිලධාරී	ගබඩා කළමනාකරණය හා මිලදී ගැනුම් පටිපාටි	නිපුණතා සංවර්ධන අරමුදල් පරිශ්‍රය	දින 02
චන්ද්‍රා රාජපක්ෂ මිය	ගිණුම් නිලධාරී	ගබඩා කළමනාකරණය හා මිලදීගැනුම් පටිපාටි	නිපුණතා සංවර්ධන අරමුදල් පරිශ්‍රය	දින 02
සුසන්ත ජයලාල් මහතා	කාර්යාල කාර්ය සහයක	ආකල්ප හා වෘත්තීය දැනුම ඉහළ දැමීම	නිපුණතා සංවර්ධන අරමුදල් පරිශ්‍රය	දින 02
කමල් සුරවීර මහතා				
උපාලි ශාන්ත මහතා				
සුහාෂ් පෙරේරා මහතා				
රංජන් සාලිය මහතා				
දේවින්ද ලක්මාල්				
යූ. එන්. සී. පෙරේරා මහතා				
සුරංග කොතලාවල මහතා				
රංජිත් සිරිර කුමාර මහතා				
එස්. ඒ. පියරත්න මහතා				
විපුල් තුෂාර මහතා				
රොෂාන් සම්පත් මහතා				
ඉන්දික රණවීර මහතා				
දිලුක් චමල් මහතා				
ගිහාන් සංකල්ප මහතා				
ප්‍රියාංගනී රාජපක්ෂ මෙනෙවිය	කළමනාකරණ සහකාර	පෞද්ගලික ලිපි ගොනු	ප්‍රාග් ආයතනය	දින 01
සන්ධ්‍යා අමරකෝන් මිය				
තුෂානි වික්‍රමසිංහ මෙනෙවිය				
ජී. ඩී. එස්. ප්‍රේමතිලක මිය	කළමනාකරණ සහකාර	කාර්යාල කළමනාකරණය හා මුද්‍රල් රෙගුලාසි	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	දින 02
කේ. එම්. අයි. ධර්මසිරි මිය				
ටී. පී. පණ්ඩිත මිය				
අනුරාධා ගොඩම්පල මිය				
වෙනුෂ්ක පෙරේරා මහතා				
අවන්ති සුරේඛා මෙනෙවිය				
ඒ. පී. ජී. ලාසරස් මහතා				

මීට අමතරව, අපගේ සේවකයන්ට සිය නිපුණතා හා ශක්‍යතා තවදුරටත් වර්ධනය කර ගැනීමට ඉඩ සලසමින් විදේශීය පුහුණු වැඩසටහන්වලට සහභාගී වීමටද අවස්ථාව අපි උදා කළෙමු.

උසස් අධ්‍යාපන අවශ්‍යතා සඳහා මූල්‍ය සහාය ලබා දීම

සේවකයාගේ නම	තනතුර	ඩිප්ලෝමාව හෝ පශ්චාත්-උපාධි පාඨමාලාව
අයි. ඩී. පී. කුමාරසිරි මහතා	අලෙවි නිලධාරී	MBA – කළමනාකරණය

ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව

සංවර්ධන ලොතරැයි මණ්ඩලය ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම සමාන වෘත්තීය අවස්ථා සලසන ආයතනයකි. මේ නිසා, සේවක සේවිකා දෙපිරිසටම එක සමාන ප්‍රතිලාභ, වැටුප් ක්‍රම සහ එක සමාන වර්ධන අවස්ථා හිමි වේ. සැබෑ තිරසාරතාව ළඟාකර ගැනීම වෙනුවෙන් සේවකයන් බඳවා ගැනීමේදී හා වෘත්තීය සංවර්ධන ක්‍රියාවලියේදී ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම එක සමාන ලෙස සලකන බව තහවුරු කිරීමට අපි කටයුතු කරන්නෙමු.

විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්ම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයන් සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල යන දෙකෙහිම සාමාජිකයන් වේ. 1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ අවශ්‍යතාවන්ට අනුකූල පරිදි අදාළ විධිවිධාන ආයතනය විසින් දායක කරනු ලැබේ.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව - සේවක සංඛ්‍යා තොරතුරු පත්‍රිකාව

අමාත්‍යාංශය : මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
ආයතනය : සංවර්ධන ලොතරැයි මණ්ඩලය
ලිපිනය : 356, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, යූනියන් පෙදෙස, කොළඹ 02.

තනතුර		අනුමත සේවක සංඛ්‍යාව	සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු	2017.12.31 දින සේවක සංඛ්‍යා තත්ත්වය			
					අතිරික්තය	සිටින ස්ථිර සේවකයන්	සේවක සංඛ්‍යා කොන්ත්‍රාත්තු	අනුයුක්ත කිරීම්
සභාපති/ප්‍ර.වි.නි.		1	1			1		
ක්‍රියාකාරී අධ්‍යක්ෂ		1	1			1		
සාමාන්‍යාධිකාරී	H.M - 2.1	1	1					1
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවිකරණ)	H.M - 1.1	1	1			1		
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)	H.M - 1.1	1	1			1		
සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවිකරණ)	M.M-1.1	3	3			3		
සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)	M.M- 1.1	3	2	1		1		

තනතුර		අනුමත සේවක සංඛ්‍යාව	සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු	2017.12.31 දින සේවක සංඛ්‍යා තත්ත්වය			
					අතිරික්තය	සිටින ස්ථිර සේවකයන්	සේවක සංඛ්‍යා කොන්ත්‍රාත්තු	අනුයුක්ත කිරීම්
සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්)	M.M- 1.1	1	1			1		
සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත්/පරිපාලන)	M.M- 1.1	1	0	1				
සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන)	M.M- 1.1	1	0	1				
සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ)	M.M- 1.1	1	1			1		
අභ්‍යන්තර විගණක	M.M- 1.1	1	1			1		
පරිපාලන නිලධාරී	J.M- 1.1	1	1			1		
ප්‍රවාහන නිලධාරී	J.M- 1.1	1	0	1				
ප්‍රධාන ආරක්ෂක නිලධාරී	J.M- 1.1	1	1			1		
අලෙවි නිලධාරී	J.M- 1.1	6	6	0		6		
ගිණුම් නිලධාරී	J.M- 1.1	4	4			4		
පද්ධති/වැඩසටහන් විශ්ලේෂක	J.M- 1.1	1	1			1		
ප්‍රසම්පාදන නිලධාරී	J.M- 1.1	1	1				1	
මානව සම්පත් නිලධාරී	J.M- 1.1	1	1			1		
අලෙවි ප්‍රවර්ධන සහකාර	MA - 3	25	14	11		12	2	
මහජන සම්බන්ධතා නිලධාරී	MA - 3	1	1			1		
තොරතුරු තාක්ෂණ සහකාර	MA - 3	2		2				
ගිණුම් සහකාර	M.A-2.2	2	0	2				
ප්‍රධාන කළමනාකරණ සහකාර	MA-1.2	1	1			1		
පුද්ගලික සහකාර	MA-1.2	1	1				1	

තනතුර		අනුමත සේවක සංඛ්‍යාව	සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු	2017.12.31 දින සේවක සංඛ්‍යා තත්ත්වය			
					අතිරික්තය	සිටින ස්ථිර සේවකයන්	සේවක සංඛ්‍යා කොන්ත්‍රාත්තු	අනුයුක්ත කිරීම්
කළමනාකරණ සහකාර	MA-1.2	109	111		2	88	23	
කළමනාකරණ සහකාර (දෙමළ)	MA-1.2	2	3		1	3		
රියදුරු	P.L - 3	37	36	1		32	4	
කාර්යාල කාර්ය සහායක	P.L -1	48	67		19	52	15	
විදුලි කාර්මික	P.L -1	1	0	1				
ආරක්ෂක සහකාර	P.L -1	3	16		13	16		
එකතුව		269	287	21	39	233	53	1
ප්‍රවාහන උපදේශක			1					
අලෙවි උපදේශක			1					
			289					

වයස් කාණ්ඩය	සේවකයින් සංඛ්‍යාව		
	පිරිමි	කාන්තා	එකතුව
< 25	31	10	41
< 35	72	33	105
<45	63	27	90
<55	40	13	53
	206	83	289

ආයතනික යහපාලනය

සංවර්ධන ලොතරැයි මණ්ඩලය තුළ ක්‍රියාත්මක වන ආයතනික පාලන පද්ධතිය සකසා ඇත්තේ දීර්ඝ කාලීන වටිනාකම් නිර්මාණය කිරීමට ඉඩ සලසන දිශානතියකට අනුව වේ. ආයතනයේ සේවක කණ්ඩායම වෙත විනිවිදභාවයකින් සහ වගවීමකින් යුතුව නායකත්වය ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩලයට අවකාශ සැලසෙන පරිදි විස්තීර්ණ හා වෙනස්වීම්වලට ලක් වන පද්ධතියක් වශයෙන් ආයතනික පාලන රාමුව සකසා ඇත.

පාලන රාමුව

අධ්‍යක්ෂ මණ්ඩලය

(උපායමාර්ග සාර්ථක ලෙස ක්‍රියාවේ නැංවීමට ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට මග පෙන්වීම, ආයතනයේ කටයුතු නිසි පරිදි ඉටුවන බව අධීක්ෂණය කිරීම සහ අවසන් අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා විවිධ පාර්ශවකරුවන් සමග සබඳතා පවත්වා ගැනීම යන කාර්යයන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉටුකරනු ලබයි.)

↓

සභාපති/ප්‍රධාන විධායක නිලධාරී

යොදාගනු ලබන උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය ලබා දෙමින් මගපෙන්වීම සිදු කරයි).

↓

ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

උපායමාර්ග කාර්යක්ෂම ලෙස කළමනාකරණය කර ගැනීම හා ආයතනයේ කටයුතු නිසි පරිදි සිදු වන බව සහතික කිරීමේ වගකීම ඉටු කරයි)

ආයතනික
යහපාලනය

අධ්‍යක්ෂ මණ්ඩලය

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ඉහළම බලාධිකාරිය අධ්‍යක්ෂ මණ්ඩලය වන අතර සුදුසු පරිදි මෙහෙයුම් ඉටු කිරීම හා මණ්ඩලයේ කළමනාකරණය සම්බන්ධයෙන් වගකීම් දරයි. ප්‍රධාන විධායක නිලධාරී ලෙසද කටයුතු කරන සභාපතිවරයා අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධානියා වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය සභාපති සහ පත් කරන ලද අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වන අතර එහි සංයුතිය පහත දැක්වේ:

1. ජනාධිපති අරමුදලේ නියෝජනය
2. මහපොල භාර අරමුදලේ නියෝජනය
3. මුදල් අමාත්‍යාංශයේ නියෝජනය
4. විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් දෙදෙනකු. මේ අතරින් එක් අයෙකු සභාපති ධුරය දරයි.

සභාපති/ප්‍රධාන විධායක නිලධාරී

- ආයතනික පාලනයේ යහපැවැත්ම තහවුරු කිරීම සභාපතිගේ වගකීමකි.
- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල මුලසුන දරමින් නිසි ක්‍රමවේද අනුගමනය කරනු ලබන බව තහවුරු කළ යුතු වේ.
- අධ්‍යක්ෂවරුන් සෑම දෙනාටම එක සමාන අයුරින් සැලකිය යුතු අතර තම විශේෂඥ ඥානය පවතින ක්ෂේත්‍රවලට උපරිම දායකත්වය දක්වමින් ඵලදායී භූමිකාවක නිරත වන ලෙස ඔවුන් සෑම දෙනාම දිරිමත් කළ යුතු වේ.
- සභාපති ප්‍රධාන විධායක නිලධාරී ලෙසද කටයුතු කරන්නේ නම් හැර ඔහු හෝ ඇය අධීක්ෂණ භූමිකාවක නිරත විය යුතු අතර මෙහෙයුම් කටයුතුවලට සම්බන්ධ වීමෙන් වැළකී සිටිය යුතු වේ.
- මණ්ඩලයේ කාර්යභාරයන් සම්බන්ධයෙන් වන අවසන් තීන්දු ගැනීමේ බලතල අධ්‍යක්ෂ මණ්ඩලය සතුව පවතින බව සභාපති විසින් සහතික කළ යුතු වේ.
- වගකීම් පැහැදිලි ලෙස බෙදී ගොස් ඇති බව සහතික කිරීම හා බලය හා අධිකාරීත්වය අතර මනා සමතුලිතභාවයක් පවත්වා ගැනීමට සහාය වීම සභාපතිගේ වගකීමකි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ භූමිකාව

රජයේ ප්‍රතිපත්තිවලට අනුකූල වන පරිදි හඳුනාගත් දිශානතිය ඔස්සේ ආයතනය ප්‍රගමනාත්මක ලෙස මෙහෙයවීමේ සහ මෙහෙයුම් සාර්ථක ලෙස කළමනාකරණය වන බව සහතික කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. සම්පත් විනිවිදභාවයකින් යුතුව උපයෝගී කරගැනීම, නිවැරදි ගිණුම් තොරතුරු පවත්වා ගැනීම සහ සියලුම ව්‍යවස්ථාපිත හා නියාමන අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි නිවැරදි වාර්තා පවත්වා ගැනීම සම්බන්ධයෙන්ද අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම් දරයි.

පහත කාර්යයන් තහවුරු කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් අතර වේ:

- ආයතනයේ උපායමාර්ගික ඉලක්ක පිහිටුවාගෙන ඇති බව සහතික කිරීම.
- උපායමාර්ගික ඉලක්ක සාක්ෂාත් කරගැනීම උදෙසා නායකත්වය ලබා දීම.
- ප්‍රධාන විධායක නිලධාරී සහ කළමනාකරණ කණ්ඩායම සතුව අවශ්‍ය නිපුණතා, දැනුම හා ශක්‍යතා සියල්ල පවතින බව සහතික කිරීම.
- කාර්යක්ෂම අභ්‍යන්තර පාලන හා අවදානම් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක වන බව සහතික කිරීම.
- ආයතනයේ කළමනාකරණ කාර්යයන් සාර්ථක ලෙස අධීක්ෂණය කෙරෙන බව සහතික කිරීම.මූල්‍යමය කාරණා සම්බන්ධයෙන් පාර්ශවකරුවන් වෙත ප්‍රමාණවත් ලෙස වාර්තාකරණයන් සිදු කෙරෙන බව හා අවශ්‍ය හෙළිදරව් කිරීම් නිසි කලට සිදු කෙරෙන බව සහතික කිරීම.
- සම්පත් හා වත්කම් වගකීම් සහගත අයුරින් උපයෝගී කරගනු ලැබෙන බව සහතික කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන කමිටුවක් හා අනෙකුත් අදාළ කමිටු පත් කළ යුතු වේ. පිළිවෙත් හා ආචාර ධර්ම සංග්‍රහයක් සහ ආයතනික පාලන උපායමාර්ගයක් හඳුන්වා දිය යුතුය.
- තම සියලුම කාර්යයන් අදාළ ව්‍යවස්ථාපිත විධිවිධාන, මාර්ගෝපදේශන හා චක්‍රලේඛ ආදිය අනුකූලව ඉටු කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමකි.
- ප්‍රධාන විධායක නිලධාරී සහ කළමනාකරණ කාර්ය මණ්ඩලයේ කාර්යසාධන යටත් පිරිසෙන් වසරකට වරක්වත් ඇගයීමට ලක් කළ යුතුය.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී ආයතනික මෙහෙයුම් හා ප්‍රතිඵල, අනුමත කරගත් අයවැය හා අදාළ ප්‍රමිතීන්ට සාපේක්ෂව ඉතා සූක්ෂම ලෙස නිරීක්ෂණය කිරීම හා අධීක්ෂණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කරනු ලබයි. මෙහිදී අධ්‍යක්ෂ මණ්ඩලය සම්මත න්‍යායපත්‍රයක් සහ අනෙකුත් සාකච්ඡා කළ කාරණා කෙරෙහි අවධානය යොමු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය මසකට වරක් රැස්වන අතර අවශ්‍යතා පැන නැඟි විට විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වනු ලැබේ.

2017 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය තුළදී පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වය සම්බන්ධ තොරතුරු පහත දැක්වේ:

අධ්‍යක්ෂවරයා/වරිය	තනතුර	රැස්වීම් වාර ගණන	රැස්වීම්වලට සහභාගීත්වය
එස්. ඒ. පී. සූරියප්පෙරුම (2017.09.06 සිට මේ දක්වා	සභාපති/ප්‍ර.වි.නි.	02	02
රොමේෂ් ජයවර්ධන මහතා (2015.10.29 සිට 2017.09.04 දක්වා)	සභාපති/ප්‍ර.වි.නි.	06	06
ආර්. අයි. විමලසේන මිය (2015.02.16 සිට 2017.06.15 දක්වා)	උප සභාපති	04	04
එච්. ආර්. විමලසිරි මහතා (2017.09.06 සිට මේ දක්වා)	ක්‍රියාකාරී අධ්‍යක්ෂ	02	02
ආචාර්ය වික්‍රම වීරසූරිය (2015.03.17 සිට 2017.11.05 දක්වා)	භාරකරු මහපොල උසස් අධ්‍යාපන භාර අරමුදල	06	06
එම්. එස්. ඩී. රණසිරි මහතා (2015.02.27 සිට 2017.02.13 දක්වා)	අධ්‍යක්ෂ ජනරාල් මහාභාණ්ඩාගාරමෙහෙයුම් දෙපාර්තමේන්තුව - මුදල් අමාත්‍යාංශය	01	01
ඩී. එන්. නානායක්කාර මහතා (2015.03.11 සිට මේ දක්වා)	අතිරේක ලේකම්/ජනාධිපති ලේකම් කාර්යාලය	08	08
එච්. ජී. සුමනසිංහ මහතා (2017.02.14 සිට 2017.06.08 දක්වා සහ 2017.09.26 සිට 2018.09.13 දක්වා)	අධ්‍යක්ෂ ජනරාල් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව	05	05
එස්. එම්. මොහොමඩ් මිය (2017.06.22 සිට 2018.08.17 දක්වා)	විදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්	02	02
ඩී. සී. දිසානායක මහතා (2017.11.06 සිට 2018.05.15 දක්වා)	ලේකම් උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය	01	01

2017.06.09 සිට 2017.08.17 අතර කාලය තුළ සංවර්ධන ලොතරැයි මණ්ඩලය පැවැතියේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ කළමනාකාරිත්වය යටතේය.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය සතු කමිටු

1. කළමනාකරණ කමිටුව
2. විගණන හා කළමනාකරණ කමිටුව
3. ටෙන්ඩර් මණ්ඩල කමිටුව
4. සේවක සුභසාධන කමිටුව
5. ප්‍රචාරණ කමිටුව
6. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සංස්කෘතික හා කලා සමිතිය

අනුකූලතා නිලධාරී

ව්‍යවස්ථාපිත හා නියාමන අවශ්‍යතා සහ අධ්‍යක්ෂ මණ්ඩලය පාලනය වන සියලුම නීති හා රෙගුලාසිවලට අනුකූලතාව දක්වනු ලැබෙන බව සහතික කිරීම සඳහා මූල්‍ය අංශයේ ප්‍රධානියා වන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූදල් අනුකූලතා නිලධාරී වශයෙන්ද කටයුතු කරයි.

කළමනාකාරිත්වය

අධ්‍යක්ෂ මණ්ඩලයේ දෛනික මෙහෙයුම් සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී විසින් ඉහළ කළමනාකරණ කණ්ඩායම් වෙත පවරා ඇත. අවදානම් හා අවස්ථා හඳුනාගෙන නිශ්චය කර ඇති කාල හා අයවැය සීමා ඇතුළත ඉලක්ක සාක්ෂාත් කරගැනීම උදෙසා අවශ්‍ය පියවර ගැනීම මෙම කළමනාකරණ කණ්ඩායම් විසින් සිදු කෙරේ.

අවදානම් කළමනාකරණය

සංවර්ධන ලොතරැයි මණ්ඩලය අවදානම් හඳුනාගැනීම හා ඒවා අවම කිරීමට අදාළ විධිවිධාන ඇතුළත් විස්තීර්ණ අවදානම් කළමනාකරණ වැඩසටහනක් අනුගමනය කරයි. ආයතනික චර්යාව හා තීන්දු ගැනීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම උදෙසා අවදානම් පිළිබඳ දැනුම්වත්භාවයකින් යුතු සංස්කෘතියක් නිර්මාණය කිරීම වෙනුවෙන් අපි කටයුතු කරන්නෙමු. අපගේ අවදානම් කළමනාකරණ ආකෘතිය සකස් කර ඇත්තේ දීර්ඝ කාලීන තිරසාරතාව ස්ථාපිත කිරීමට හේතු වන උපායමාර්ග මාලාවක් පාදක කරගනිමිනි.

අවදානම් කළමනාකරණ පද්ධතිය

බලපාන අවදානම් සාධක හා ඒවා අවම කර ගැනීම සඳහා යොදාගත යුතු මෙවලම් සම්බන්ධයෙන් පාර්ශවකරුවන්, කළමනාකාරිත්වය හා අධ්‍යක්ෂ මණ්ඩලය සතු අවබෝධය වැඩිදියුණු කිරීම උදෙසා නිරන්තරයෙන්ම අවශ්‍ය තොරතුරු හා මාර්ගෝපදේශනයන් සන්නිවේදනය කරනු ලැබේ.



මෙම පද්ධතියේ අවසන් අරමුණ වන්නේ උපායමාර්ගික හා ව්‍යාපාරික සැලසුම්කරණය, ව්‍යාපෘති කළමනාකරණය හා ව්‍යාපාරික ක්‍රියාවලි යන මට්ටම්වලින් ව්‍යාපාරික අවදානම් කළමනාකරණය කර ගැනීමයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය පහත ක්‍රියාවලීන් ඇසුරින් මෙම අරමුණ ඉටුකර ගැනීමට උත්සාහ දරයි:

- ව්‍යාපාරික කාර්යයන් හා ඒකක සියල්ලටම අදාළ අවදානම් සම්බන්ධයෙන් පොදු වැටහීමක් ලබා දීම.
- වැඩිදියුණු මට්ටමින් ප්‍රමුඛතා පිහිටුවීම හා තීන්දු ගැනීමට සහායක් ලැබෙන පරිදි ඉස්මතු විය හැකි අවදානම් සම්බන්ධයෙන් අඛණ්ඩ තක්සේරුවක් කළමනාකාරිත්වය වෙත ලබා දීම.
- එකී අවදානම් කළමනාකරණය කර ගැනීමේදී සේවකයන් සතු අවබෝධය හා වගකීම අවධාරණය කිරීම.

ව්‍යවසායික අවදානම් කළමනාකරණය

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අවදානම් කළමනාකරණ රාමුව ලොව පුරා පිළිගැනීමට ලක්ව ඇති ව්‍යවසායික අවදානම් කළමනාකරණ ප්‍රමිතීන්ට අනුගත වන පරිදි සකසා ඇත.

අවදානම් කළමනාකරණ රාමුව

උපකරණ

අවදානම් හඳුනාගැනීම
අවදානම් තුරන් කිරීම

ක්‍රියාවලීන්

සැලසුම්කරණය
නායකත්වය
සංවිධානය

අවදානම් සාධක

අහඹු
මූල්‍ය
උපායමාර්ගික
මෙහෙයුම්
වෙනත්

අවදානම් කළමනාකරණය ඉතිරිය

අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

නියාමන මාර්ගෝපදේශනයන්ට දැඩිව අනුකූල වීම හා සවිමත් ආයතනික පාලන සංස්කෘතියක් පවත්වා ගැනීම

මතු විය හැකි අවදානම්වලට බලපාන සංස්කෘතික හා මානව විචල්‍යයන් බෙදා දැක්වීම

අවදානම් කළමනාකරණ යාන්ත්‍රණයන්

මතු විය හැකි අවදානම් විචක්ෂණ ලෙස හඳුනාගැනීම හා නිශ්චිත අවදානම් වාර්තාකරණ ක්‍රියාවලියක් සහිත මනා සුපරීක්ෂාව

ඒ ඒ අවදානමට ඔබින ලෙස සැකසූ විසඳුම් ලබා දීම සඳහා අවදානම් කළමනාකරණ උපයාමාර්ගයන්හි නම්‍යශීලීතාව පවත්වා ගැනීම

ආයතනයේ සෑම මට්ටමකදීම දැනුම්වත් ලෙස තීරණ ගැනීමට දිරි දීම

අවදානම	විස්තරය
ත්‍යාග මුදල් ගෙවීමේ අනුපාතික අවදානම	ලොතරැයි දිනුම් ඇදීම් සම්බන්ධයෙන් ජයග්‍රාහකයන්ට ත්‍යාග මුදල් ගෙවීමේදී සම්මත ගෙවීම් අනුපාතිකයක් පවත්වා ගත යුතු වේ. මේ ආශ්‍රිත අවදානම මූලික වශයෙන්ම ඉස්මතු වන්නේ මිල අනුපාතික ඉහළ යාම හේතුවෙන් මුදල් ගලනය කෙරෙහි අහිතකර බලපෑම් එල්ල වීමට ඇති ඉඩකඩ නිසාවෙනි. මෙකී අවදානම ආවරණය කරගැනීම උදෙසා සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් සිය ටිකට්පත් මුද්‍රණය කරන මුද්‍රණාල වෙතින් රක්ෂණ ආවරණයක් ලබා ගනී.
ආර්ථික අවදානම	දිවයිනේ සමාජ-ආර්ථික හා දේශපාලනික වෙනස්වීම්වල බලපෑම සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ගනුදෙනුකරුවන්ගේ මිලදී ගැනීම් රටාවන් වෙත එල්ල වීමේ අවදානමයි.
මූල්‍ය අවදානම	මුදල් ප්‍රවාහ සහ මූල්‍ය තොරතුරු අකාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම නිසා ආයතනයේ ලාභදායීතාව හා කාර්යක්ෂමතාව කෙරෙහි අහිතකර බලපෑම් එල්ල වීම නිසා මෙම අවදානම ඇති වෙයි. ප්‍රමාණවත් රක්ෂණාවරණ හා ආයතනය පුරාවටම පිරිවැය පාලන උපායමාර්ග සම්බන්ධීකරණය කර ගැනීම වැනි සම්මත මූල්‍ය අවදානම් කළමනාකරණ පරිචයන් සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් භාවිතයට ගනියි.
ද්‍රවශීලතා අවදානම	අපේක්ෂිත කාලයට පෙරාතුව ඉහළ ත්‍යාග ජයග්‍රහණය කිරීම නිසා ද්‍රවශීලතා අවදානම ඉස්මතු වෙයි. මෙම අවදානම අවම කිරීම උදෙසා සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් ඉහළ ද්‍රවශීල වත්කම් පවත්වාගෙන යනු ලබයි.

අවදානම	විස්තරය
මෙහෙයුම් අවදානම	පද්ධති බිඳවැටීම්, මිනිසුන් අතින් සිදු වන දෝෂ, සාපරාධී ක්‍රියා සහ අභ්‍යන්තර පද්ධති බිඳවැටීම් ආදියෙහි බලපෑම මෙහෙයුම් අවදානම යටතට ගැනේ. මෙවැනි තත්ත්ව උදා වීම නිසා ගනුදෙනුකරුවන් තුළ අප කෙරෙහි ඇති විශ්වාසය පළුදු වී ආයතනයේ ප්‍රතිරූපයට හානි සිදු වේ. මෙම අවදානම අවම කිරීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය නිරන්තරයෙන්ම අභ්‍යන්තර පාලන විධිවිධාන සවිමත් කිරීමට කටයුතු කරයි. මීට අමතරව, මෙහෙයුම් අවදානමක් ඇති වීමේ ඉඩකඩ අවම කිරීම උදෙසා සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කළමනාකාරිත්වය කලින් කලට මෙහෙයුම් ඒකක, ව්‍යාපාරික ක්‍රියාවලීන් හා මහා පරිමාණ ඒකක ආශ්‍රිත අවදානම් තක්සේරුකරණයක් සිදු කරයි.
කීර්ති නාම අවදානම	සංවර්ධන ලොතරැයි මණ්ඩලය විශාල වශයෙන් දෘෂ්‍ය මාධ්‍ය හා මහජනතාව සැරිසරන මාධ්‍ය අවකාශ මත රඳා පැවතීන නිසා සැලකිය යුතු මට්ටමේ කීර්ති නාම අවදානමක් ඇති වීමේ ඉඩකඩ නිරතුරුවම පවතී. මේ සඳහා මහජනතාවගේ ආකර්ෂණය පවත්වා ගනු පිණිස සංවර්ධන ලොතරැයි මණ්ඩලය සාර්ථක අලෙවිකරණ ව්‍යාපාර ක්‍රියාත්මක කරන අතර මෙම අවදානම අවම කිරීම උදෙසා පද්ධතිමය විනිවිදභාවය කෙරෙහි දැඩි අවධානයකින් කටයුතු කරයි.
නෛතික අවදානම	සංවර්ධන ලොතරැයි මණ්ඩලයට එරෙහිව ඉදිරිපත් වන්නට ඉඩ ඇති නීතිමය ක්‍රියාමාර්ගවලට සාර්ථකව ප්‍රතිචාර දක්වමින් ආරක්ෂණ විධිවිධාන අනුගමනය කිරීමට අපොහොසත් වීම මත නෛතික හානි සිදු වීමේ අවදානමක් ඉස්මතු විය හැක. මෙවැනි තත්ත්ව අවම කිරීම උදෙසා පිළිගත් නීති විශාරදයන්ගේ උපදෙස් ලබා ගෙන අවශ්‍ය පූර්ව විධිවිධාන අනුගමනය කිරීමට කටයුතු කරනු ලැබේ.
තොරතුරු තාක්ෂණ අවදානම	නිවැරදි හා කාලීන වශයෙන් යාවත්කාල වන තොරතුරු තාක්ෂණ පද්ධතියක් පවත්වාගෙන යාම සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මෙහෙයුම් ක්‍රියාවලියෙහි වැදගත් අංගයකි. ආයතනික තොරතුරු තාක්ෂණ පද්ධතිය නිසි පරිදි යාවත්කාලීන කර තැබීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් ක්‍රියාත්මක වෙයි.

විගණන සහ කළමනාකරණ

කමිටු වාර්තාව

2017 දෙසැම්බර් 31 න් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වන අපගේ වාර්තාව ඉදිරිපත් කරන්නේ මහත් සතුටිනි.

විගණන කමිටුවේ සංයුතිය

විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගෙන් විගණන කමිටුව සමන්විත වෙයි:

1. එච්. ජී. සුමනසිංහ මහතා - විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපති

   සහ

2. ඩී. එන්. නානායක්කාර මහතා - විගණන හා කළමනාකරණ කමිටු සාමාජික

සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවිකරණ, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මුදල්, අභ්‍යන්තර විගණක, පරිපාලන නිලධාරී සහ අනෙකුත් අදාළ නිලධාරීන් මෙම කමිටු රැස්වීම් සඳහා සහභාගී වේ. විගණකාධිපති ජනරාල් දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරීවරයා මෙහි නිරීක්ෂකයෙකු ලෙස සහභාගී වේ.

විගණන කමිටුවේ භූමිකාව

පාර්ශවකරුවන්ගේ අභිලාෂ සහ මණ්ඩලය සතු වත්කම් ආරක්ෂා කරනු වස් සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් කාර්යක්ෂම අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යාම අවශ්‍ය වෙයි. මෙහිදී මුදල් අමාත්‍යාංශය හා අනෙකුත් අදාළ අධිකාරීන් විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශනයන්ද මෙම කමිටුව විසින් අනුගමනය කරනු ලබයි. 2017 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය තුළ සිය ප්‍රධාන වගකීම්වලට අනුකූල පරිදි විගණන කමිටුව විසින් සිදු කරන ලද කාර්යභාරයන් පහත දැක්වේ:

1. වාර්ෂික මූල්‍ය ප්‍රකාශනයන්හි අනුකූලතාව හා ඒකාබද්ධතාව නිරීක්ෂණය කිරීම හා ප්‍රසිද්ධ කිරීමට පෙරාතුව ඒවායෙහි ඇතුළත් වැදගත් මූල්‍ය වාර්තාකරණ තීන්දුකිරීම් සමාලෝචනය කිරීම. ගිණුම්කරණ ප්‍රතිපත්ති, සටහන් හා පරිචයන්, ප්‍රධාන තීන්දුකාරක ක්ෂේත්‍ර හා නෛතික හා නියාමන අවශ්‍යතා වෙත අනුකූලතාව දැක්වීම යනාදිය පිළිබඳ සමාලෝචනයක් ඊට ඇතුළත් වෙයි. මූල්‍ය ප්‍රකාශන විගණනයෙහි ප්‍රතිඵල සමාලෝචනයේ කොටසක් වශයෙන් විගණන කමිටුව විසින් මෙම කාරණා විගණකාධිපති ජනරාල් සමඟ සාකච්ඡා කරන ලදි.
2. අනුමත කරන ලද වාර්ෂික විගණන සැලැස්මට අනුකූල පරිදි කලින් කලට සිදු කරනු ලබන අභ්‍යන්තර විගණන වාර්තා අභ්‍යන්තර විගණක විසින් ඉදිරිපත් කරනු ලැබේ. මෙහිදී, අභ්‍යන්තර පද්ධති හා ක්‍රමවේදයන්හි හිදැස් හඳුනාගෙන ඒවා වාර්තා කරන අතරම කළමනාකරණ හා විගණන කමිටුව වෙත යොමු කරන ලද නිර්දේශ හා වාර්තා සලකා බැලීමෙන් අනතුරුව පවතින පද්ධති හා ක්‍රමවේද සඳහා සිදු කළ යුතු වැඩිදියුණු කිරීම් සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ. අභ්‍යන්තර විගණන අංශය වෙතින් නිතිපතා වාර්තා විගණන කමිටුව වෙත ලැබෙන අතර අදාළ කාලසීමාවට සම්බන්ධ සෑම විගණන කටයුත්තකම ප්‍රධාන සොයාගැනීම්වල සාරාංශයක්ද ඊට ඇතුළත් වේ. කළමනාකාරිත්වයේ අදහස්ද එහි කොටසක් වන අතර මෙහිදී අදාළ කාරණාවලට මුල් වූ හේතු සමාලෝචනය කරමින් විගණන කමිටුව විසින් එම තත්ත්ව නැවත ඇති වීම වැළැක්වීම සඳහා ගත යුතු නිරවද්‍යකරණ ක්‍රියාමාර්ග සලකා බලනු ලැබේ.
3. අභ්‍යන්තර විගණකගේ සහ රජයේ විගණකවරුන්ගේ සහායද ඇතිව මෙම කමිටුව විසින් බැංකුවේ මෙහෙයුම් හා මූල්‍ය පාලන ක්‍රමවේදයන්හි කාර්යක්ෂමභාවය තක්සේරු කරනු ලබන අතර වියදම් කිරීමේදී ලැබෙන අවසරයන්හි සීමා, ආදායම් ක්‍රියාවලීන් හා ප්‍රාග්ධන වියදම, අත්සන් තැබීමේ අධිකාරීන්, තොරතුරු තාක්ෂණය යොදා ගැනීමේ පාලන හා සංවර්ධනයන්, සංවිධාන ව්‍යුහය, ප්‍රතිපත්ති, රාජකාරීන් බෙදා දැක්වීම හා කළමනාකාරිත්වයේ සමාලෝචන ආදිය මීට ඇතුළත් වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ද්‍රවශීලතා තත්ත්වය නිතිපතා නිරීක්ෂණය කරන ලදි. ඒ අනුව හඳුනාගත් හිදැස්, වැඩිදියුණු කරගැනීමේ නිර්දේශද සමඟින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබා දී ඇති කෝප් නියමයන් වෙත මෙම කමිටුවේ විශේෂ අවධානය යොමු වේ.

විගණන කමිටු රැස්වීම් පැවැත්වූ වාර ගණන්

2017 වසර තුළදී විගණන කමිටු රැස්වීම් 05 ක් පැවැත්වූ අතර සාමාජිකයන්ගේ සහභාගීත්වය පහත දැක්වේ:

අධ්‍යක්ෂවරයාගේ/වරියගේ නම	සහභාගීත්වය	නොපැමිණීම්
එම්.එස්.ඩී. රණසිරි මහතා	01/01	නැත
එස්. එම්. මොහොමඩ් මිය	01/01	නැත
එච්. ජී. සුමනසිංහ මහතා	03/03	නැත
ඩී. එන්. නානායක්කාර මහතා	05/05	නැත



එච්. ජී. සුමනසිංහ මහතා
සභාපති
විගණන හා කළමනාකරණ කමිටුව

DEVELOPMENT LOTTERY

Enriching Your Life





මූල්‍ය

තොරතුරු

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } පියූආර්/එෆ්/ඩීඑල්බී/1/17/එෆ්එස්1 මබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2019 ජනවාරි 31 දින

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 14(3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2018 නොවැම්බර් 15 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීමිද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

(i) ප්‍රමිතයේ 32 වගන්තිය ප්‍රකාරව, ගිණුම්කරණ ප්‍රමිත මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටක හැර වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් නොකළ යුතු වුවද මණ්ඩලය විසින් යතුරු පැදි විකිණීමේ අලාභය වූ රු.189,638 ක් වෙනත් ආදායම්වලින් හිලව් කර දක්වා තිබුණි. තවද, එකතුව රු.844,650,423 ක් වූ බැංකු ගිණුම් අටක හර ශේෂ, එකතුව රු.105,184,705 ක් වූ බැංකු ගිණුම් තුනක බැර ශේෂ සමඟ හිලව් කර රු.739,482,123 ක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුදල් හා මුදල් සමාන දෑ යටතේ දක්වා තිබුණි. කෙසේ වුවද මෙම ශේෂයන් ගිණුම් සටහන් තුළ වෙන් වශයෙන් පෙන්වා තිබුණි.

(ii) ප්‍රමිතයේ 54 ඡේදය ප්‍රකාරව අස්පෘෂ්‍ය වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනම පෙන්විය යුතු වුවද, මණ්ඩලය විසින් එකතුව රු.2,243,478 ක් වූ පරිගණක මෘදුකාංග (Computer Software) හා වෙබ් අඩවි සංවර්ධනය (Website Development) යනාදිය දේපළ පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි.

(iii) ප්‍රමිතයේ 66 ඡේදය ප්‍රකාරව, වාර්තා කරන කාලපරිච්ඡේදයට පසු මාස 12 ක් තුලදී උපලබ්ධි වෙතැයි අපේක්ෂා කරන වත්කම්, ජංගම වත්කම් ලෙස හඳුනාගත යුතු වුවද, රු.1,012,526,906 ක් වටිනා වසරක් තුළ කල්පිරෙන ස්ථාවර තැන්පතු 11 ක වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ නිරූපණය කර තිබුණි.

(ආ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07**

සමාලෝචිත වර්ෂයේදී මුදලින් ලැබී තිබූ මණ්ඩලයේ පොළී ආදායම රු.119,182,529 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ එය රු.120,768,549 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය රු.1,586,020 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

(i) ප්‍රමිතයේ 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.165,556,090 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 34 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව, මණ්ඩලයේ ඉඩම් හා ගොඩනැගිලි 2010 දෙසැම්බර් 31 දිනෙන් පසුවද, යන්ත්‍ර සූත්‍ර 2012 දෙසැම්බර් 31 දිනයෙන් පසුවද ප්‍රත්‍යාගණනය කර සධාරණ වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(iii) ප්‍රමිතයේ 55 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව මණ්ඩලය විසින් වත්කමක ක්ෂය කිරීම එය පාවිච්චි කිරීමට සූදානම් තත්ත්වයට ගෙන ආ පසු ආරම්භ කර තිබූ නමුත්, වත්කම් මිලදීගත් වර්ෂයේ සමානුපාතිකව ක්ෂය කිරීමත්, විකුණන වර්ෂය සඳහා ක්ෂය ප්‍රතිපාදනය නොකිරීමත් මණ්ඩලයේ ක්ෂය ප්‍රතිපත්තිය වන බව මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19**

ප්‍රමිතයේ 63 ඡේදය ප්‍රකාරව, සේවක පාරිතෝෂික සඳහා වූ වගකීම් හා වත්කම් වෙන වෙනම හඳුනාගෙන ඒවා එකිනෙකට හිළව් කිරීමෙන් ඇතිවන වර්තමාන ශුද්ධ පාරිතෝෂික අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ නොදක්වා පාරිතෝෂික වත්කම් හා ඊට අදාළ වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙන වෙනම දක්වා තිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුල දක්වා තිබුණු ස්ථාවර තැන්පතු වටිනාකම වූ රු.1,050,939,528 ක් තුල පාරිතෝෂික ආයෝජන අගයේ වටිනාකම වූ රු.38,412,622 ක් දැක්වීම හේතුවෙන් ස්ථාවර තැන්පතු වටිනාකම හා පාරිතෝෂික ආයෝජන වටිනාකම පිළිවෙලින් එම වටිනාකමින් වැඩියෙන් හා අඩුවෙන් නිරූපණය වී තිබුණි.

(ආ) 2017 මාර්තු හා අප්‍රේල් මාසවල සිට භාවිතයට ගෙන තිබූ පිළිගැනීමේ කවුන්ටරයේ හා තොරතුරු තාක්ෂණ අංශයේ ඉදිකිරීම්වලට අදාළව 2017 වර්ෂය සඳහා පිළිවෙලින් රු.230,999 ක් හා රු.209,171 ක් වූ ක්ෂය ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2017 අප්‍රේල් 01 දින රු.72,600 කට මිලදී ගන්නා ලද වායු සමීකරණ යන්ත්‍රයේ 2017 වර්ෂය සඳහා ක්ෂය ලෙස රු.13,612 ක් පමණක් ගැලපීම් කල යුතු වුවද, රු.54,698 ක් ක්ෂය කර තිබීම හේතුවෙන් ක්ෂය වියදම රු.41,086 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, කාර්ය මණ්ඩලය සඳහා වූ සියලුම දීමනාවල එකතුව සහ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන දීමනා වටිනාකම් අතර රු.3,709,070 ක වෙනසක් නිරීක්ෂණය විය. එසේම ලොතරැයි දිනුම් ඇදීම සඳහා කාර්ය මණ්ඩලයට සිදුකර ඇති ගෙවීම්වලට අදාළව මූල්‍ය අංශය හා පරිපාලන අංශය ඉදිරිපත් කල තොරතුරු අතර රු.2,828,300 ක වෙනසක්ද නිරීක්ෂණය වූ අතර මෙම වෙනස්කම් සඳහා හේතු පැහැදිලි නොකෙරුණි.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.13,249,192 ක් වූ වියදම් ගිණුම් ශේෂ 04 ක් සම්බන්ධයෙන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

	විෂයය	වටිනාකම	ඉදිරිපත් නොකළ විගණන සාක්ෂි
		රු.	
(i)	වාහන කුලී වියදම්	9,317,866	- ධාවනය පිළිබඳ මාසික වාර්තා (Monthly Record) - වාහන කුලියට ලබා ගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ විශේෂ අනුමැතිය
(ii)	සේවක මණ්ඩල පුහුණු වියදම්	1,740,549	- 2017 වර්ෂයේ පුහුණු සැලැස්ම - රු.100,000 ක සම්පත් දායක දීමනාවට අදාළ ගෙවීම් තීරණය කිරීමේ පදනම - පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූවන්ගේ පැමිණීමේ ලේඛන - Multi Media Diploma පුහුණු පාඨමාලාව සඳහා කැඳවීමේ ලිපිය - චක්‍රලේඛ/ අභ්‍යන්තර මැමය - අධ්‍යක්ෂ මණ්ඩල තීරණය හා පත්‍රිකාව - මණ්ඩලය හා පුහුණුකරු සමග ඇති කරගත් ගිවිසුම
(iii)	ජංගම රථවල රියදුරන්ට අතිකාල ගෙවීම.	1,047,590	- ජංගම ලොතරැයි අලෙවියේ නිරත රියදුරන්ගේ අතිකාල දීමනාවලට අදාළ පැමිණීම් පිටවීම් සනාථ කරගත් ලේඛන
(iv)	අලෙවි ප්‍රවර්ධන/ක්ෂේත්‍ර නිලධාරීන්ට ලබාදී තිබූ යතුරු පැදි වලට අදාළ ඉන්ධන වියදම්, වාරසේවා හා අළුත්වැඩියා හා නඩත්තු වියදම්	1,143,187	- යතුරු පැදිවල අදාළ ධාවන සටහන් හා ලොග් සටහන්, හෝ ධාවනය කල ස්ථාන හා රාජකාරී තහවුරු කෙරෙන ලියවිලි
		13,249,192	

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සහ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ විධිමත් ලෙස සම්පූර්ණ වූ පසුව ඉතා කඩිනමින් විගණනය වෙත ලබාදෙන ලෙස 2016 වර්ෂයේ සිට විගණන විමසුම් හා තොරතුරු ඉල්ලීම් ලිපි ගණනාවකින් ඉල්ලා තිබුණි. එසේම එම කාලපරිච්ඡේදය තුල පැවති විගණන කමිටු රැස්වීම්වලදී ද ඒ පිළිබඳව අවධානය යොමු කරන ලදී. එහෙත් ගනුදෙනු ක්‍රියාත්මක කර අවසන් වූ පසුව හා මාස 02 ත් 04 ත් අතර කාල ප්‍රමාදයකින් පසුව එම වාර්තා ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර තිබුණි. මේ නිසා මෙම වාර්තාවේ පෙන්වාදී ඇති ඇතැම් අලාභ හා අවදානම් අවම කර ගැනීමට මණ්ඩලයට තිබූ අවස්ථා අහිමි වී ඇතැයි යන සැකය විගණනයේදී බැහැර කළ නොහැකි විය.

2.3 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වොක්ෂෝල් විදියේ අංක 234 දරන ගොඩනැගිල්ල කුලී පදනම මත මණ්ඩලය වෙත ලබා ගැනීම සඳහා එළඹ තිබූ ගිවිසුම, ඒක පාර්ශවිකව මණ්ඩලය විසින් කඩ කිරීම නිසා මණ්ඩලයට අයවිය යුතු රු.5,700,000 ක මුදල වසර 14 ක් තිස්සේ අයකරගත නොහැකි වී තිබුණි.

(ආ) මණ්ඩලය විසින් 2012 වර්ෂයේදී ගෙවීමේ පදනම මත නිලධාරීන්ට ලබාදී තිබූ මෝටර් සයිකල් සඳහා වසර 06 ක් ගතවී තිබුණද ඒ සඳහා අයවිය යුතු රු.192,817 ක මුදල් සහ වසර 1 ත් 5 ත් අතර කාලයක් තිස්සේ අලෙවිකුට් ඉදිකිරීම වෙනුවෙන් ලබාදී තිබූ රු.856,498 ක් වශයෙන් එකතුව රු.1,049,315 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති රීති, රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම්
(අ) 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත	
11 (අ) වගන්තිය හා 18 (2) වගන්තිය	ජනාධිපති අරමුදලට අරමුදල් උත්පාදනය කිරීම මණ්ඩලයේ ප්‍රධානම කාර්යය වුවද, 2018 මාර්තු 03 දින වන විට එම අරමුදලට ප්‍රේෂණය කල යුතු හිඟ මුදල වූ රු.17,862,341 ක් නියමිත පරිදි ප්‍රේෂණය කර නොතිබුණි.

(ආ) 2006 අංක 10 දරණ ආදායම් බදු පනතේ 133 වන වගන්තියට අදාළ ඇමුණුමක් ලෙස නිකුත් කර තිබූ, 2011 පෙබරවාරි 28 දිනැති අංක **SEC 2011/1** දරන චක්‍රලේඛයේ 03 වන ඡේදය

පොලී ආදායම මත අයකරනු ලබන රඳවාගැනීමේ බදු ප්‍රතිශතය සියයට 10 ක් වුවද, එය නොසලකා එක් රාජ්‍ය බැංකුවකින් සියයට 10 ක් ලෙසද, තවත් රාජ්‍ය බැංකු 2 කින් එය සියයට 8 ක් ලෙසද රඳවාගැනීමේ බදු අයකර තිබුණි. එකම ආයතනයක් වෙනුවෙන් රඳවාගැනීමේ බදු ප්‍රතිශත දෙකක් අය කිරීම සම්බන්ධව අදාල බැංකුවලින් විමසීමක් සිදුකර නිවැරදි ප්‍රමාණය ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) **1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 03 වැනි වගන්තිය ප්‍රකාර රජයේ ගැසට් නිවේදනය**

සියයට 15 හෝ රු.5 යන අගයන් දෙකෙන් වැඩි අගයෙන් සෑම ලොතරැයියකටම මිල වැඩි කිරීමට බලතල ලැබී තිබියදී, ලොතරැයි පතක මිල සියයට 50 ක් නැතහොත් රු.10 කින් වැඩි කිරීම නිසා මණ්ඩලයට රු.මිලියන 11.2 ක අසාමාන්‍ය නිෂ්කාර්ය මුදුණ වියදමක් දැරීමට සිදුවී තිබුණි.

(ඈ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 11 වන ඡේදය හා 2007 ජුනි 12 දිනැති අංක 15/2007 (i) හා 2014 දෙසැම්බර් 26 දිනැති අංක 15/2007 (ii) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අනුමත ණය සීමාව ඉක්මවා නිලධාරීන් දෙදෙනෙකු වෙත රු.241,040 ක් ද නිලධාරීන් 05 දෙනෙකු වෙත රු.2,401,080 ක් ද ලෙස එකතුව රු.2,642,120 ගෙවා තිබුණු අතර නිලධාරීන් තිදෙනෙකුට දෙවරක් දේපල ණය ලබාදී තිබුණි. තවද, ණයකරුවන් 05 දෙනෙකු විසින් දැරිය යුතු රු.42,094 ක නීතීඥ ගාස්තුව මණ්ඩලය විසින් දරා තිබුණි.

(ඉ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

(i)	මුදල් රෙගුලාසි 103 හා 103 (1) ඊ	වාහන අනතුරු සම්බන්ධයෙන් විගණකාධිපති වෙත හා පොලිසිය වෙත වාර්තා කිරීම මෙන්ම වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන යම් අලාභයක් වෙතොත් අයකර ගැනීමට හැකි ලේඛනයක් පවත්වාගෙන යෑම කල යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වාහන 42 කට අදාළව අනතුරු 61 ක් සිදුවී තිබුණු අතර මණ්ඩලයට සිදුවූ පාඩුව රු.2,010,948 ක් වී තිබුණි. රක්ෂණ ආයතනයකින් ආවරණය කර ගත නොහැකි එම අලාභය වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර නොගෙන මණ්ඩලයේ අරමුදලින් දරා තිබුණි.
(ii)	මුදල් රෙගුලාසි 135	එකතුව රු.1,549,705 ක් වූ වවුචර් පත් 4 ක් සඳහා ගෙවීම් නිර්දේශ කිරීම, බලය දීම, අනුමත කිරීම හා ගෙවීම් සහතික කිරීම සිදු කිරීමේදී ලියකියවිලිවල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමකින් තොරව ගෙවීම් සිදුකර තිබුණි.
(iii)	මුදල් රෙගුලාසි 260 හා 389	විධිවිධාන ප්‍රකාරව ගෙවීම්වලට අදාළ චෙක්පත් නියමිත පුද්ගලයාට හෝ ආයතනයට භාරදිය යුතු වුවත් එකතුව රු.1,417,500 ක් වටිනා චෙක්පත් 03 ක් ද, පුහුණු වැඩසටහන් වෙනුවෙන් දරන ලද රු.31,075 ක් වෙනුවෙන් විවෘත චෙක්පතක් ද ලෙස එකතුව රු.1,448,575 ක් වූ චෙක්පත් 04 ක් මණ්ඩලයේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය විසින් ලබාගෙන තිබුණි.
(iv)	මුදල් රෙගුලාසි 757 (2)	විධිවිධාන ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර තිබූ නමුත් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(v) මුදල් රෙගුලාසි 1179 විධිවිධාන ප්‍රකාරව නිලධාරයකුට ගෙවිය හැකි ගාස්තු ඔහුගේ මාසික වැටුපට වැඩි නොවිය යුතු වුවත්, මණ්ඩලයේ නිලධාරීන්ගේ මාසික වැටුප ඉක්මවා ගාස්තු හා ලොතරැයි දිනුම් වාර දීමනා ගෙවා තිබූ අවස්ථා විය. සමාලෝචිත වර්ෂය තුල එසේ මාසික වැටුප් ඉක්මවා ගෙවා තිබූ දීමනා රු.23.567,305 ක් විය.

(ඊ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ

(i) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී/1/2015 දරන චක්‍රලේඛයේ 2 වගන්තිය විධිවිධාන ප්‍රකාරව සුදුසුකම් ලබා නොතිබූ නිලධාරීන් 08 දෙනෙකුට නිල වාහන වෙන්කර ඒ වෙනුවෙන් රු.1,471,440 ක ඉන්ධන දීමනා ගෙවා තිබුණි.

(ii) 2015 ජුනි 17 දිනැති අංක පීඊඩී/3/2015 දරන චක්‍රලේඛයේ 2.5 වගන්තිය විධිවිධාන ප්‍රකාරව සභාපති, ක්‍රියාකාරී අධ්‍යක්ෂ ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සඳහා හිමි දීමනාව හැර වෙනත් කිසිඳු දීමනාවක් ගෙවිය නොහැකි බවට අවධාරණය කර තිබුණි. එහෙත් සභාපති, ක්‍රියාකාරී අධ්‍යක්ෂ හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙත දිනුම් ඇදීම සඳහා සහභාගී වීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.1,142,000 ක මුදලක් ගෙවීම් කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.507,036,703 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,783,386,637 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,276,349,934 ක හෙවත් සියයට 72 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. 2001 සිට 2009 වර්ෂය සඳහා වූ මුළු හිඟ ආදායම් බදු බැඳියාව වූ රු.1,208,002,376 ක මුදල 2017 වර්ෂය තුලදී ගෙවීම් කිරීම, ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී රු.2,126,428,341 ක් වූ 2013 වර්ෂයේ අතිරික්තය 2015 වර්ෂය අවසානයට රු.1,727,063,739 ක් දක්වා පිරිහී තිබූ අතර 2016 වර්ෂයේදී රු.1,783,386,637 ක් දක්වා වර්ධනය වී තිබුණි. එහෙත් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,276,349,934 ක් හෙවත් සියයට 72 කින් පිරිහීමක් නිරීක්ෂණය විය. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් සහ රජයට ගෙවූ බදු යන ගැලපීම් කිරීමෙන් පසු 2013 වර්ෂයේදී රු.3,086,604,730 ක් වූ දායකත්වය 2016 වර්ෂයේදී රු.721,228,361 කින් හෙවත් සියයට 23 කින් වර්ධනය වී තිබූ නමුත් 2017 වර්ෂයේදී නැවතත් රු.256,524,904 කින් හෙවත් සියයට 7 කින් පිරිහී තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම්, ලාභදායීත්වය හා ද්‍රවශීලතාවය දැක්වෙන අනුපාත පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ.

	2017	2016
<u>මෙහෙයුම් අනුපාත</u>	සියයට	සියයට
විකුණුම් ආදායමට විකුණුම් හා බෙදාහැරීමේ වියදම්	25	24
විකුණුම් ආදායමට විකුණුම් පිරිවැය	58	58
<u>ලාභදායීත්ව අනුපාත</u>		
දළ ලාභ අනුපාතය	42	42
ශුද්ධ ලාභ අනුපාතය (බදු පෙර)	17	18
ශුද්ධ ලාභ අනුපාතය (බදු පසු)	3.6	12
ශුද්ධ ලාභයෙන් ත්‍යාග පවරා තිබීමේ අනුපාතය (බදු පෙර)	13	10
ශුද්ධ ලාභයෙන් ත්‍යාග පවරා තිබීමේ අනුපාතය (බදු පසු)	59	16
ශුද්ධ ලාභයට ආදායම් බදු අනුපාතය (බදු පෙර)	78	34
ශුද්ධ ලාභයට ආදායම් බදු අනුපාතය (බදු පසු)	358	51
විකුණුම් හා බෙදාහැරීමේ වියදම මුළු මෙහෙයුම් වියදමේ ප්‍රතිශතයක් ලෙස	89	90

<u>ද්‍රවශීලතා අනුපාත</u>		
ජංගම අනුපාතය	1:1.7	1:2
ක්ෂණික අනුපාතය	1:1.8	1:2

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය විසින් කරනු ලබන විකුණුම් හා බෙදාහැරීමේ වියදම්, විකුණුම් මිළෙන් පිළිවෙලින් සියයට 24 හා සියයට 25 ක් ලෙස ඉහළ අගයක් ගෙන තිබුණි. තවද ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ අයවැය ගත විකුණුම් හා බෙදාහැරීමේ වියදම්වලට වඩා තථ්‍ය වියදමේ පිළිවෙලින් සියයට 411 ක හා සියයට 353 ක විශාල වැඩිවීමක් නිරීක්ෂණය විය. තථ්‍ය විකුණුම් හා බෙදාහැරීමේ වියදම මුළු මෙහෙයුම් වියදම්වල ප්‍රතිශතයක් ලෙස පිළිවෙළින් සියයට 90 ක් හා සියයට 89 ක් විය. මෙසේ අධික පිරිවැයක් දැරීම මණ්ඩලය ලබන ශුද්ධ ලාභයට සෘජුව බලපාන අතර එය ජනාධිපති අරමුදලට සිදු කරන දායකත්වයටද අහිතකර ලෙස බලපා ඇති බැව් නිරීක්ෂණය විය.

(ආ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී උපයා ඇති බදු පසු ශුද්ධ ලාභයෙන් සියයට 59 ක්ම ජයග්‍රහයකයින් විසින් ලබා නොගත් ත්‍යාග මුදල් වලින් සමන්විත වී තිබූ අතර එය බදු පෙර ශුද්ධ ලාභයෙන් සියයට 13 ක් විය.

(ඇ) ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ බදු පසු ශුද්ධ ලාභයෙන් පිළිවෙලින් සියයට 51 ක් හා සියයට 358 ක් ආදායම් බදු ලෙස ගෙවා තිබුණු අතර එය බදු පෙර ලාභයෙන් පිළිවෙලින් සියයට 34 ක් හා සියයට 78 ක් විය. ඉකුත් වර්ෂවලදී ඒ ඒ වර්ෂයන්ට අදාලව ගෙවිය යුතු ආදායම් බදු නිවැරදිව නොගෙවීම හේතුවෙන් එම හිඟ බදු මුදල් නිරවුල් කිරීමට සිදුවීම මත සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී ආදායම් බදු ගෙවීම ශුද්ධ ලාභයේ ප්‍රතිශතයක් ලෙස ඉහළ අගයක් ගෙන තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අගෝස්තු 30 දින සිට දිනපතා දිනුම් අදිනු ලබන "අද කෝටිපති" නව ලොතරැයි පත වෙළඳපොළට හඳුන්වා දුන්නද ලොතරැයි අලෙවි ආදායම රු.778,374,934 කින් එනම් සියයට 5.3 කින් අඩුවී තිබුණු අතර විකුණුම් පිරිවැය ද ඊට සාපේක්ෂව රු.406,127,121 කින් එනම් සියයට 4.8 කින් අඩුවීම, දළ ලාභ අනුපාතය ඒකාකාරීව පැවතීම කෙරෙහි බලපා තිබුණි.

(ඉ) පසුගිය වසර හා සමාලෝචිත වසරේදී ජංගම හා ක්ෂණික අනුපාතය 1:2 ක් ලෙස සමාන අගයක් ගෙන තිබුණි. ඒ අනුව මණ්ඩලයේ ජංගම වත්කම් ඉක්මවා ජංගම වගකීම් පවතින බව නිරීක්ෂණය වන හෙයින් සමාලෝචිත වර්ෂයේදීද කාරක ප්‍රාග්ධන කළමනාකරණය කෙරෙහි මණ්ඩලයේ අවධානය යොමු වී ඇති බවක් නිරීක්ෂණය නොවීය.

3.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

බාහිර ආයතනයක් විසින් වාහනයක් වෙනුවෙන් රු.8,095,000 ක මුදලක් ගෙවන ලෙස ඉල්ලා එක් නඩුවක්ද, ආයතනයේ සේවයෙන් පහ කරන ලද නිලධාරියෙකු නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා අධිකරණ වල නඩු 02 ක් ද ගොනු කර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලසුම් කිරීම.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 සිට 2021 දක්වා වූ වර්ෂ සඳහා පිළියෙල කර තිබුණු මණ්ඩලයේ සංයුක්ත සැලැස්මේ පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) 2017 වර්ෂයේ සිට 2021 දක්වා ළඟා කරගැනීමට අපේක්ෂා කරන ලද අරමුණු හා ඉලක්කයන්හි ඇස්තමේන්තු ගත ප්‍රමාණයන්, පිරිවැයන් හා කාලවකවානු වගකිව යුතු කළමනාකාරීත්වය යනාදිය පිළිබඳව තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

(ii) උක්ත චක්‍රලේඛයේ 5.1.3 ඡේදය ප්‍රකාරව, ඊළඟ මුදල් වර්ෂය ආරම්භ වීමට අවම වශයෙන් දින 15 කට පෙර සංයුක්ත සැලැස්මේ පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද එම පිටපත් ඉදිරිපත් කර තිබුණේ 2017 ජූනි 01 වන දින දීය.

(iii) ඉහත චක්‍රලේඛයේ 9.2 ඡේදය සඳහන් පරිදි සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමේදී ආයතනයේ අවශ්‍යතාවය මත මානව සම්පත් සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් මණ්ඩලය විසින් එය පිළියෙල කර නොතිබුණි. පසුගිය වර්ෂවලදී විගණනය විසින් ඒ සම්බන්ධව දැනුවත් කළද එයට කළමනාකාරීත්වයේ අවධානය යොමු වී නොතිබුණි.

(iv) සංයුක්ත සැලැස්මේ දක්වා තිබුණු ඉලක්ක අතුරින් එක් ඉලක්කයක් වූයේ ජනාධිපති අරමුදලේ දායකත්වය උපරිම කිරීමයි. තවද එය 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ ප්‍රධාන කර්තව්‍ය ද වේ. එසේ වුවත් එම ඉලක්කය කරා ළඟාවීමට අනුගමනය කරන උපාය මාර්ග සංයුක්ත සැලැස්ම තුළ දක්වා නොතිබුණි.

(ආ) 2017 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ඉලක්ක, ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග, ඇස්තමේන්තු ගත ප්‍රමාණයන් හා පිරිවැයන් හා අදාළ කාලවකවානුද අයවැයගත ප්‍රතිපාදනයන් ද ඇතුළත් වන පරිදි 2017 වර්ෂය සඳහා මණ්ඩලය විසින් ක්‍රියාකාරී

සැලැස්ම විස්තරාත්මක ලෙස පිළියෙල කර නොතිබුණි. තවද, මණ්ඩලයේ සංයුක්ත සැලැස්මට හා වාර්ෂික අයවැයට සමගාමීව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඇති බව නිරීක්ෂණය නොවූ අතර ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රගතිය කාලානුරූපීව පරීක්ෂා කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක්ද හඳුන්වාදී නොතිබුණි.

4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

(අ) ලොතරැයි අලෙවිය හා අලෙවියෙන් ලැබෙන අරමුදල් ජනාධිපති අරමුදලට ප්‍රේෂණය කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලය විසින් මෙහෙයවා ඇති ලොතරැයි 10 සඳහා දිනුම්වාර 1190 ක් පවත්වා තිබුණු අතර, ලොතරැයිපත් අලෙවිය තුළින් රැස්කර ඇති ආදායම රු.13,981,500,306 ක් විය. එසේම වර්ෂය තුල රැස්කළ ආදායමෙන් රු.7,263,436,665 ක මුදලක් ත්‍යාග ලෙස වෙන්කර තිබුණු අතර ලොතරැයි අලෙවි ආදායමෙන් රු.376,145,499 ක්ද වෙනත් ආදායම් වලින් රු.130,891,204 ක් ද ඇතුළුව ජනාධිපති අරමුදල සඳහා ප්‍රේෂණය කළ මුදල රු.507,036,703 ක් හෙවත් සියයට 3.6 ක් විය.

(ii) දස ලක්ෂපති ලොතරැයියෙන් කිසිදු මුදලක් ජනාධිපති අරමුදලට ප්‍රේෂණය කර නොතිබුණු අතර ඉතිරි ලොතරැයි 9 න් ප්‍රේෂණය කළ මුදල එක් එක් ලොතරැයිය වෙනුවෙන් එකතුකළ ආදායමින් සියයට 0.98 ත් සියයට 5.6 ත් අතර ඉතා කුඩා පරාසයක විය.

(iii) ආදායම රැස්කිරීම සඳහා මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුලදී රු.12,078,580,888 ක පිරිවැයක් දරා තිබුණු අතර එම පිරිවැයෙන් සියයට 3.2 ක් ලෙස රු.386,509,683 ක් ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් දරා තිබුණි.

(iv) මණ්ඩලය විසින් ලොතරැයිපත් විකිණීමෙන් ලැබෙන ආදායමෙන් සියයට 50 ක් ත්‍යාග මුදල් සඳහා වෙන් කරනු ලබයි. සමාලෝචිත වර්ෂය තුල ත්‍යාගලාභීන් 172,507,676 ක් වෙත රු.6,920,946,975 ක් ත්‍යාග ලෙස බෙදාහැර තිබුණු අතර එය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 3 ක වර්ධනයක් වී තිබුණි. තවද සමාලෝචිත වර්ෂය තුලදී, ජයග්‍රාහකයින් විසින් මාස 06 ක කාලය ඉකුත් වීමට මත්තෙන් ලබාගත යුතුව තිබූ රු.297,376,550 ක් වටිනා ත්‍යාග මුදල් අදාළ ජයග්‍රාහකයින් වෙත පත්කිරීමට විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) මණ්ඩලයේ ලොතරැයිපත් අලෙවිය සඳහා දරන ලද ප්‍රචාරණ පිරිවැයට සාපේක්ෂව ලභා කරගත් විකුණුම් ආදායමේ කාර්ය සාධනය පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ශනිදා වාසනාව, ලග්න වාසනාව හා සුපර්බෝල් ලොතරැයිවල ප්‍රචාරණ පිරිවැය පිළිවෙලින් සියයට 34 කින්, සියයට 2.6 කින් හා සියයට 6.5 කින් ඉහළ ගියද විකුණුම් ආදායම පිළිවෙලින් සියයට 8.5 කින්, සියයට 26 කින් හා සියයට 27 කින් පහත වැටී තිබුණි.

(ii) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ගැලැක්සි ස්ටාර් හා දස ලක්ෂපති ලොතරැයි පත්වල ප්‍රචාරණ පිරිවැය පිළිවෙලින් සියයට 9 කින් හා සියයට 11 කින් පහත වැටී තිබුණු අතර එහි විකුණුම් ආදායම පිළිවෙලින් සියයට 34 කින් හා සියයට 50 කින් පහත වැටී තිබුණි.

(iii) ගැලැක්සි ස්ටාර් හා දස ලක්ෂපති ලොතරැයි පත්වල විකුණුම් ආදායමෙන් පිළිවෙලින් සියයට 3.4 ක හා සියයට 9 ක ප්‍රචාරණ වියදමක් දරා තිබුණු අතර අනෙක් ලොතරැයි පත්වල ප්‍රචාරණ වියදම විකුණුම් ආදායමෙන් සියයට 2 ක් වී තිබුණි.

(iv) කෝටිපති ශනිදා ලොතරැයි පතෙහි ප්‍රචාරණ වියදම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 0.27 කින් අඩු වී තිබු නමුත් අලෙවි ආදායම් සියයට 34 කින් වර්ධනය වී තිබුණි.

(ඇ) ජනාධිපති අරමුදලට 2014 වර්ෂයේදී ප්‍රේෂණය කළ ශුද්ධ ලාභය රු.මිලියන 2,353 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එය රු.මිලියන 507 ක් වී තිබීමෙන් එම අරමුදලට ප්‍රේෂණය කිරීම් 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අඛණ්ඩව සියයට 19.17 සිට සියයට 3.6 දක්වා සියයට 81 කින් අඩුවී තිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී, පෙර වර්ෂවල හිඟ බදු මුදල් පියවා දැමීම මෙම තත්ත්වයට හේතුවී තිබුණි.

	වර්ෂය			
	2017	**2016**	**2015**	**2014**
	---	---	---	---
	රු.	රු.	රු.	රු.
විකුණුම් ආදායම	13,981,500,306	14,759,875,240	11,874,659,603	12,271,477,490
බදු අඩුකළ පසු ලාභය	507,036,703	1,783,386,637	1,727,063,739	2,353,246,338
බදු අඩුකළ පසු ආදායම විකුණුම්වල ප්‍රතිශතයක් ලෙස	3.6	12.08	14.54	19.17

(ඇ) 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ මණ්ඩලය විසින් වෙළඳපොලට හඳුන්වා දී ඇති ලොතරැයිපත් දෙක හැර අනෙකුත් සියලුම ලොතරැයිපත්වල අලෙවිය කැපී පෙනෙන ලෙස අඩුවී තිබූ අතර මණ්ඩලයේ සමස්ත ලොතරැයිපත් අලෙවිය 2016 වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 685 කින් අඩුවී තිබුණි. ලොතරැයිපත් අලෙවියේ අඩුවීම සියයට 8.5 ත් සියයට 50.4 ත් අතර පරාසයක විහිදී තිබුණු අතර ලොතරැයිපත් 05 ක අලෙවිය සියයට 25 කට වඩා වැඩි ප්‍රමාණයකින් පහත වැටී තිබුණි.

(ඉ) 2016 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සෑම ලොතරැයි පතකටම අදාළව ලොතරැයිපත් දිනුම් ඇදීමේ වියදම වැඩි වී තිබුණි. එම වැඩිවීම් අතර ශනිදා වාසනාව, සංවර්ධන ලක්ෂපති සහ කෝටිපති ශනිදා යන ලොතරැයිපත් තුනට අදාළ වියදම පිළිවෙලින් සියයට 36, සියයට 49 සහ සියයට 94 ක ප්‍රතිශතයකින් වැඩි වී ඇති බව නිරීක්ෂණය විය.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් ගබඩා සංකීර්ණයක් ඉදිකිරීම සඳහා 2014 වර්ෂයේදී මිල ගණන් කැඳවා රු.මිලියන 14.5 ක ඇස්තමේන්තු වටිනාකමකට Primedare සමාගම සමඟ 2014 දෙසැම්බර් 31 දින ගිවිසුම්වලටද එළඹ තිබුණි. නමුත් එකී ගිවිසුම කඩකර 2015 මාර්තු 12 දින කොන්ත්‍රාත්තුව අත්හිටුවන බව මණ්ඩලයේ සභාපති විසින් ගනුදෙනුකරු වෙත දැන්වීමෙන් පසුව කොන්ත්‍රාත්කරු වෙත 2017 මාර්තු 07 දින ඒ වෙනුවෙන් දරන ලද රු.2,500,000 ක වන්දි මුදලක් (Amicable Settelment) ගෙවීමට සිදුවී තිබුණි. කළමනාකාරීත්වය විසින් ගත් තීරණය හේතුවෙන් උපදේශක ගාස්තු රු.996,501 ක්ද, විනිශ්චය ගාස්තු රු.40,000 ක්ද සමඟ රු.3,536,501 ක පාඩුවක් මණ්ඩලයට දැරීමට සිදුවී තිබුණි.

(ආ) 2015 වර්ෂයේදී ප්‍රවාහන නිලධාරී තනතුර සඳහා අවධිමත් ලෙස ලබාදී ඇති පත්වීම නීත්‍යානුකූල නොවන බව දක්වා එම නිලධාරියා සේවයෙන් ඉවත්කර තිබූ අතර එම නිලධාරියා විසින් 2015 මැයි 19 වන දින නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලීම් කර, නඩුවක් පවරා ඇති අතර එය අධිකරණයේ විභාග වෙමින් පවතී. කෙසේ වුවද 2017 දෙසැම්බර් 31 දිනට ඒ සඳහා දරා ඇති නීතීඥ ගාස්තුව රු.854,000 ක් වන අතර එය මණ්ඩලයේ ඉහළ කළමනාකරණය විසින් විධිමත් පරීදි බඳවා ගැනීම් සිදු නොකිරීම හේතුවෙන් මණ්ඩලයට දැරීමට සිදුවූ වියදමක් බැව් විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) 2016 මැයි 17 දින දිනුම් අදින ලද නියතජය 402 වැනි දිනුම්වාරයේදී සුපිරි ජයමල්ල වන රු.10,441,580 ක් හිමි ලොතරැයිපත වෙනුවෙන් එහි මුද්‍රණකරු වන Digiscan ආයතනයේ සේවකයෙකු විසින් ව්‍යාජ ලොතරැයිපතක් මුද්‍රණය කර තිබුණි. එම ආයතනය සමග ඇති කරගෙන තිබූ ගිවිසුමේ 6 වන වගන්තිය ප්‍රකාරව, මෘදුකාංග දෝෂයක් මත වැරදි හෝ වංචාවක් සිදු වුවහොත් රු.500,000 ක වන්දි මුදලක් අයකර ගත හැකි වුවද ඒ වෙනුවෙන් වන්දි මුදලක්ද අය කර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) දීමනා බෙදීයාමේ විෂමතා හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ නිලධාරීන් 251 දෙනෙකු අතර ගෙවා තිබුණු රු.123,505,364 ක් වූ විවිධ දීමනා වර්ගවල මුළු දීමනා වටිනාකමින් සියයට 21 ක් එනම් රු.26,456,847 ක්වූ දීමනා බෙදීගොස් තිබුණේ මණ්ඩලයේ නිලධාරීන් 22 දෙනෙකු අතරය. මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන්ම බලපා තිබුණේ මූල්‍ය ප්‍රකාශන තුල දැක්වෙන සමාලෝචිත වර්ෂයේ දිනුම් ඇදීමේ දීමනා වියදම රු.32,423,800 කින් රු.13,670,850 ක් එනම් සියයට 42 ක්ම, අධ්‍යක්ෂ මණ්ඩලයේ නිලධාරියකු ඇතුළු ඉහළ කළමනාකාරීත්වයේ නිලධාරීන් 23 දෙනෙකු වෙත හිමිවීමයි.

4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ක්ෂණික ටිකට්පත් අලෙවිය සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියකින් තොරව මණ්ඩලය විසින් වෑන් රථ 08 ක් ජංගම රථ ලෙස යොදා ගෙන තිබුණි. ඒ අනුව ජංගම රථ මඟින් ලොතරැයි අලෙවි කිරීමේදී එක් ටිකට්පතක් සඳහා රු.7.07 ක වියදමක් දැරුවද අලෙවි නියෝජිතවරුන් මඟින් අලෙවි කිරීමේදී දරා ඇති පිරිවැය රු.2.67 ක් වී තිබුණි. ඒ අනුව ජංගම රථ මඟින් ක්ෂණික ටිකට්පත් අලෙවි කිරීම හේතුවෙන් එක් ටිකට්පතක් සඳහා රු.4.40 බැගින් ටිකට්පත් 2,202,300 ක් වෙනුවෙන් රු.9,690,120 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි. කෙසේ වුවද, මෙම තීරණය ගෙන ඇත්තේ ප්‍රවර්ධන කටයුත්තක් ලෙස තරඟකාරීත්වයට මුහුණදීම සඳහාවන බව මණ්ඩලය විසින් වාර්තාකර තිබුණි.

(ආ) මණ්ඩලය විසින් 2017 අගෝස්තු 30 දින සිට ක්‍රියාත්මක වන පරිදි "අද කෝටිපති" නමින් ලොතරැයිපතක් වෙළඳපොලට හඳුන්වාදී තිබුණි. මෙම නව ටිකට්පතේ අලෙවිය වැඩිකර ගැනීමට බෙදාහැරීමේ නියෝජිතවරුන්ට විශේෂ දිරි දීමනා ලෙස ගෙවූ රු.25,813,683 ක් ද ඇතුලුව අලෙවි නියෝජිත කොමිස් හා බෙදාහැරීමේ කොමිස් ලෙස රු.279,496,493 ක් ගෙවීම් කර තිබුණි. කෙසේ වුවද, අනෙක් සියලුම ටිකට්පත්වල අලෙවිය පහත වැටී තිබුණු අතර ඒ අනුව නව ලොතරැයිපත් හඳුන්වාදීමේදී වෙළඳපොල තරඟකාරීත්වය හා

පාරිභෝගික හැසිරීම පිළිබඳ සමීක්ෂණයක් සිදුකර ඇති බවක් නිරීක්ෂණය නොවීය. 2017 ඔක්තෝබර් සිට දෙසැම්බර් 31 දින දක්වා සියලුම ලොතරැයිපත්වල නොවිකිණී ඉතිරි වූ ලොතරැයිපත් සංඛ්‍යාව මිලියන 32.5 ක් වූ අතර ඒවායේ මුද්‍රණ පිරිවැය රු.මිලියන 14.5 කට ආසන්න වී තිබුණි.

(ඇ) වාර්ෂික වර්ගීකරණ වාර්තා අනුව මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන ලොතරැයි වර්ග 08 කින් හා ක්ෂණික ලොතරැයි වලින් එක් එක් ලොතරැයි වර්ගයකින් වෙන් වෙන්ව ගණනය කරන ලද බදු පෙර ලාභය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 31 ත් සියයට 85 ත් අතර පරාසයක ප්‍රමාණයකින් පහත වැටී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී පසුගිය වර්ෂයට සාපේක්ෂව එසේ පහත වැටී තිබුණු මුළු බදු පෙර ලාභය රු.2,950,124,307 ක් විය.

(ඈ) 2017 මාර්තු 23 දින පැවති අලෙවි නියෝජිතවරුන්ගේ මූල්‍ය ශක්‍යතාව වර්ධනය කිරීම යන මැයෙන් පැවැත්වූ රැස්වීමේදී එකඟ වූ පරිදි අලෙවි නියෝජිතවරු 22 දෙනෙකු විසින් බැංකු ඇපකර ලෙස රු.මිලියන 12.2 ක මුදලක් තැබීම පැහැර හැර තිබුණි.

තවද, සමාලෝචිත වර්ෂය තුළ බෙදාහරින්නන් වෙත රු.මිලියන 108 ක් වටිනා ලොතරැයිපත් ණය පදනම මත ලබාදී තිබුණද, ඒවා අයකර ගැනීමට ප්‍රමාණවත් ඇප තැන්පතු මණ්ඩලය සතුව නොතිබීම නිසා බෙදාහරින්නන් වෙත ලබාදී තිබූ ණය අවදානම රු.මිලියන 105 ක් විය. මේ අනුව ණයට ලබාදෙනු ලබන ලොතරැයිපත්වලට අදාළව අවදානම අවම කර ගැනීම සඳහා ඉහත පියවර ගෙන තිබුණද එම අරමුණු ඉටුවී නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ දිනුම් අදින ලද ටිකට්පත් 800,940,150 ක් මුද්‍රණය කිරීම සඳහා රු.346,417,188 ක මුද්‍රණ වියදමක් දරා තිබුණු අතර නීතිරීති, පාරිභෝගික හැසිරීම, ලොතරැයි වෙළඳපොල හැසිරීම, එක් එක් ලොතරැයිවල ප්‍රතිලාභ ව්‍යුහය තුලින් පාරිභෝගිකයාට අත්වන බලපෑම යනාදී කරුණු ඇතුලුව සමස්ත වෙළඳපොළ පුරෝකථනයන් නොසලකා ලොතරැයිපත් මුද්‍රණය කර තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී මුද්‍රණ වියදම රු.51,748,146 ක් වූ ලොතරැයිපත් 119,656,730 ක් නොවිකිණී ඉතිරි වී තිබූ අතර එම වියදම නිශ්ඵල වියදමක් වී තිබුණි.

4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වාහනවලට ඉන්ධන ලබාදීම පිළිබඳව සිදුකළ නියැදි පරීක්ෂාවේදී ඉන්ධන ටැංකියේ ධාරිතාවය ඉක්මවා අවස්ථා 13 කදී වටිනාකම රු.10,678 ක්වූ ඉන්ධන ලීටර් 112 ක් ලබාදී තිබුණි. ඉන්ධන ටැංකියේ ධාරිතාවය ඉක්මවා ඉන්ධන ලබාදුන් ආකාරය විගණනයේදී මතභේදයට තුඩුදෙන කරුණක් විය.

(ආ) අලෙවි ප්‍රවර්ධන අයිතම් (කුඩ හා මග්) සඳහා මණ්ඩලයේ ලියාපදිංචි සැපයුම්කරුවකු විසින් 2017 ජූනි 22 දින මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. අදාළ සැපයුම්කරු විසින් දක්වා තිබුණු ලිපිනයේ නිවැරදිභාවය තහවුරු නොවූ අතර එහි දුරකථන අංකද කිසිවක් සඳහන් කර නොතිබුණි. විගණනය විසින් භෞතිකව පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය වූයේ, මෙවැනි ලිපිනයක් හෝ ආයතනයක් නොමැති බවය.

2016 දෙසැම්බර් 20 දින ප්‍රවර්ධන අයිතම් මිලදී ගන්නා අවස්ථාවේදී ඉහත සැපයුම්කරු විසින් කඳුරට කුඩ ආයතනයේ ප්‍රාදේශීය කළමනාකරුවෙකු (Area Manager) ලෙස පෙනී සිට කඳුරට කුඩ ආයතයේ ලිපි ශීර්ෂ භාවිතා කර මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. එවැනි ප්‍රාදේශීය කළමනාකරුවෙකු එම ආයතනයේ නොමැති බවත්, එම ලිපි ශීර්ෂ ඔවුන්ගේ ලිපි ශීර්ෂ නොවන බවත්, ඉහත ලිපිනයේ කිසිදු ශාඛාවක් නොමැති බවත් කඳුරට කුඩ ආයතනය විසින් විගණනය වෙත තහවුරු කෙරුණි.

තවද, මෙම ආයතනය විසින් ඉදිරිපත් කරන ලද සියළුම ලිපි ඡායා පිටපත් වන අතර මුල් පිටපත් කිසිදු අවස්ථාවක විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවද, එම ඉදිරිපත් කර ඇති ලිපිවල සඳහන් අත්සන් එකිනෙකට වෙනස් වී ඇති බැව් විගණනයේදී තවදුරටත් නිරීක්ෂණය විය. ඒ අනුව මෙවැනි සාවද්‍ය ආයතනයකින් 2017 වර්ෂය තුලදී රු.1,905,230 ක අලෙවි ප්‍රවර්ධන අයිතම් මිලදී ගැනීම මතභේදයට තුඩුදෙන ගණුදෙනුවක් විය..

(ඇ) ක්ෂණික ලොතරැයි පත් වර්ග අතුරින් Y-144 (B කොටස) 2017 මාර්තු 29 දින වෙළඳපොලට නිකුත් කරන ලෙසද, එම අවස්ථාවේදීම එක් පෙට්ටියකට කුඩ 25 බැගින් යොදා ටිකට්පත් පෙට්ටි 100 ක් නිකුත් කරන ලෙසද අලෙවි අංශය විසින් ගබඩාව වෙත දන්වා තිබුණි. නමුත් ගබඩාවේ ක්ෂණික ටිකට් තොග ලේඛනය අනුව (Y/144-(B)) මෙම ක්ෂණික ටිකට්පත් තොගය 2017 පෙබරවාරි 28 දින නිකුත් කර තිබුණි. තවද ටිකට්පත් නිකුත් කල නිවැරදි දිනය, නිකුත් කරන ලද කුඩ ප්‍රමාණය සහ බෙදාහැරීම් ලේඛනය යනාදී තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. කෙසේ වුවද ප්‍රධාන ගබඩාවේ පැවති ටිකට්පත් තොග 2017 පෙබරවාරි 28 දින උප ගබඩාවලට මාරුකර ඇති බව මණ්ඩලය විසින් විගණනයට වාර්තාකර තිබුණි.

4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 හා 2017 වර්ෂ තුල මිලදීගෙන තිබුණු, තවදුරටත් වර්ෂ 04 ක වගකීම් කාලයක් ඉතිරිව පැවති යතුරු පැදි 03 ක් ඇතුලුව ධාවන තත්ත්වයේ පැවති රු.3,405,757 ක් වටිනා යතුරු පැදි 19 ක් මාස 02 ත් වර්ෂ 2 ½ ත් අතර කාලයක් භාවිතයට නොගෙන ගබඩාවේ නවතා තිබියදී 2016 හා 2017 වර්ෂවලදී වසරකට යතුරු පැදි 06 බැගින් වටිනාකම රු.2,892,999 ක් වූ යතුරු පැදි 12 ක් මිලදී ගෙන තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන තුල දැක්වෙන රු.58,355,403 ක තොග ශේෂය තුල රු.1,594,664 ක් වූ ප්‍රයෝජනයට ගත නොහැකි තොග ඇතුලත් වී තිබුණි.

4.6 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයේ වාහන නියෝජිත සමාගමකින් රු.8,095,000 ක් වටිනා කැබ් රථයක් මණ්ඩලයේ කිසිදු නිලධාරියකුගේ අනුමැතියකින් තොරව එවකට හිටපු සභාපති විසින් භාරගෙන මණ්ඩලයේ නමට ලියාපදිංචි කර තිබුණද, එදින සිට මෙම වාහනය අස්ථානගත වී තිබුණි. අදාළ සමාගමට මෙතෙක් මුදල් නොගෙවීම මත එම සමාගම විසින් පවරා ඇති නඩුව සඳහා 2017 දෙසැම්බර් 31 දින වන විට මණ්ඩලය විසින් රු.2,244,685 ක නීතීඥ වියදමක් දරා තිබුණු අතර අදාළ වත්කම මෙතෙක් ලබා ගැනීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි. එහෙත් එම රථයේ වටිනාකම 2013 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස දක්වා වාර්ෂිකව ක්ෂය කර තිබූ අතර 2013 වර්ෂයේ සිට මෙම වාර්තාවේ දින දක්වා ජනාධිපති අරමුදලට අහිමි වූ දායක මුදල රු.10,339,635 ක් විය.

(ආ) අලෙවි ප්‍රවර්ධන අයිතම් ලෙස 2009 වර්ෂයේදී සතොස ආයතනයෙන් රු.590,500 ක් වටිනා තෑගි වවුචර්පත් 121 ක් සහ 2013 පෙබරවාරි 18 දින එස්ටීසී ආයතනයෙන් රු.100,000 ක් වටිනා කල් ඉකුත් වූ තෑගි වවුචර් පත් 32 ක්ද ලෙස වටිනාකම රු.690,500 ක වවුචර්පත් භාවිතයට නොගෙන සේප්පුවේ පවතින බැව් නිරීක්ෂණය විය. 2017 ජුනි 12 දින මෙම වවුචර්පත් නැවත අළුත් කර ගැනීමට එම ආයතන වලින් විමසා තිබුණද ඊට එකඟතාවය පල කර නොතිබුණු බැවින් මෙය මණ්ඩලයට නිශ්ඵල වියදමක් වී තිබුණි. එහෙත් මෙම වියදම තවදුරටත් අලෙවි ප්‍රවර්ධන අයිතම් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

4.7 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්/දේපලවල ව්‍යාපෘති ආරම්භ කිරීම.

තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයිති අක්කර 01 ක ඉඩම තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් දීර්ඝකාලීන බදු පදනම මත ලබා ගැනීමට එකඟ වී තිබුණද විධිමත් පරිදි බදු ගිවිසුමකට එළඹීමකින් තොරව සංචාරක නිවාසයක් ඉදිකිරීම සඳහා එම ඉඩමේ සංවර්ධන කටයුතු වෙනුවෙන් රු.492,392 ක් මණ්ඩලය විසින් වැයකර තිබුණි.

4.8 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් ආයතනයේ සම්පත්

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තිය අනුව රේඛීය අමාත්‍යාංශය හෝ වෙනත් රාජ්‍ය ආයතන සඳහා මණ්ඩලයේ සම්පත් ලබාදිය නොහැකි වුවත්, මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට බඳවා ගත් 11 දෙනෙකු බඳවා ගත් දින සිටම මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත නිදහස් කර තිබුණි. මෙම කාර්ය මණ්ඩලය, මණ්ඩලයේ කටයුතු සඳහා කිසිදු දායකත්වයක් දක්වා නොතිබුණු නමුත් මණ්ඩලයේ අරමුදලින් සේවක පාරිශ්‍රමික ලෙස 2016 වර්ෂයේදී හා 2017 ජූනි 19 දක්වා පිළිවෙලින් රු.3,376,415 ක් හා රු.3,725,000 ක් වශයෙන් එකතුව රු.7,101,415 ක් ගෙවීම් කර තිබුණි.

4.9 කාර්යමණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය 269 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 289 ක් විය. ඒ තුල පුරප්පාඩු සංඛ්‍යාව 21 ක් වූ අතර අතිරික්ත කාර්ය මණ්ඩලය 39 ක් විය. කාර්යභාරය හඳුනාගෙන එයට ගැලපෙන ආකාරයට මණ්ඩලයේ අත්‍යවශ්‍ය තනතුරු සඳහා බඳවා නොගැනීමත්, අනවශ්‍ය තනතුරු සඳහා සීමාව ඉක්මවා බඳවා ගැනීමත් පුරප්පාඩු හා අතිරික්තතා සඳහා හේතු වී තිබුණි.

(ආ) 2006 අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ විධිවිධාන අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් 2015 දෙසැම්බර් 16 දින අනුමත කරන ලද බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව, කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ ක්‍රමවේදය "ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි පුවත්පත් දැන්වීමකින් හෝ ප්‍රසිද්ධ දැන්වීමකින් ඉල්ලුම් පත් කැඳවා, ලිඛිත තරහ විභාගයක හා/හෝ පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන මණ්ඩලයක් මගින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තීරණය කල යුතුය. එහෙත් 2017 වර්ෂය තුල

බඳවා ගැනීමේදී ප්‍රසිද්ධ දැන්වීම් පලකර හෝ පුවත්පත් දැන්වීම් පල කර අයදුම්පත් කැඳවා නොතිබුණි.

(ඇ) විගණිත දිනය වූ 2018 ජූලි 30 දින වන තෙක් සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) පත් කිරීමට කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය තුල සිදුකළ රු.386,847,211 ක් වටිනා ප්‍රසම්පාදනයන්, මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස්වලට අනුකූලව සිදුවී නොතිබුණු අවස්ථා ගණනාවක් නිරීක්ෂණය විය.

(ඈ) 2016 හා 2017 වර්ෂවලදී පිළිවෙලින් රු.60,000 ක් හා රු.22,104 ක් බැගින් වූ මාසික වැටුපකට මහජන සම්බන්ධතා නිලධාරින්ද, පෞද්ගලික සහකාර ලෙස රු.30,000 ක මාසික වැටුපකට වයස 70 ක් වූ නිලධාරිණියක්ද හා රු.60,000 ක වැටුපකට තවත් නිලධාරිණියක් ද බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි අනුමත කර නොගෙන කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි.

(ඉ) වයස අවුරුදු 60 ඉක්ම වූ නිලධාරීන් බඳවා ගැනීමේදී අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබාගත යුතු වුවත්, 2016 හා 2017 වර්ෂවලදී එසේ අනුමැතිය ලබාගැනීමකින් තොරව පෞද්ගලික සහකාර, රියදුරු, කළමනාකරණ සහකාර හා විකුණුම් උපදේශක යන තනතුරු සඳහා පිළිවෙලින් රු.30,000 ක, රු.25,918 ක, රු.50,000 ක හා රු.100,000 ක මාසික දීමනාවක් ගෙවීමේ එකඟතාවය අනුව කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් සිදුකර තිබුණි.

(ඊ) ඉහත (ඇ) හා (ඉ) ඡේදවල සඳහන් තනතුරු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී නොතිබුණු අතර විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කිරීමකින් තොරව එකම තනතුර සඳහා දැඩි විෂමතාවයක් සහිතව දීමනා ගෙවමින් බඳවාගැනීම් සිදුකර ඇති බව නිරීක්ෂණය විය.

(උ) මණ්ඩලය විසින් අලෙවි කරනු ලබන ලොතරැයිපත්වල අලෙවි ඉලක්ක සපුරා ගැනීමට සහාය වීමට හා අලෙවි කුට් පරීක්ෂා කිරීම සඳහා සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ක්ෂේත්‍ර නිලධාරීන් 18 දෙනෙකු පත් කර ඇති අතර ඔවුන් විසින් සෑම මසකම ඉදිරි වැඩ සටහනක් (Advance Programme) ඉදිරිපත් කළ යුතු විය. එම වැඩ සටහන අනුව ඔවුන් රාජකාරී ඉටු කරනුයේද යන්න GPS තාක්ෂණය ඔස්සේ අධීක්ෂණය සඳහා නිලධාරීන් 04 දෙනෙකු පත්කර තිබුණද එවැනි අධීක්ෂණයක් සිදුවී නොතිබුණි.

(ඌ) 2017 මාර්තු 24 දින සිට කොන්ත්‍රාත් පදනම මත රියදුරෙකු බඳවා ගෙන තිබූ අතර සැප්තැම්බර් 30 දින සේවය අහෝසි වී තිබුණි. මෙම නිලධාරියා මණ්ඩලයේ සේවය කළ මාස 06 ක කාල සීමාව තුළ මණ්ඩලයේ කිසිදු කාර්යයකට සක්‍රීය දායකත්වයක් ලබාදී නොතිබුණු නමුත් වැටුප්, අතිකාල, දිරි දීමනා හා පැමිණීමේ දීමනා ලෙස රු.279,744 ක් මණ්ඩලය විසින් ගෙවා තිබුණි.

(ඒ) විධිමත් ගිවිසුමකට එළඹීමකින් තොරව, දිනුම් ඇදීමේ ක්‍රියාවලිය සිදු කිරීම සඳහා පුද්ගලික ආයතනයකින් සේවා ලබාගැනීම වෙනුවෙන් 2014 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා කාලය වෙනුවෙන් රු.104,716,157 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද මෙම කාර්යය වෙනුවෙන් සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ) තනතුරක් හා කාර්ය මණ්ඩලයේ 03 දෙනෙකු සමඟ අංශයක් පිහිටුවා තිබූ නමුත් අභ්‍යන්තරිකව කරවා ගැනීමේ හැකියාව පිළිබඳව අවධානය යොමු වී නොතිබුණි.

(ඓ) 2016 වර්ෂයේදී රු.782,817 ක් ව පැවති ඒක සේවක පිරිවැය 2017 වර්ෂයේදී රු.948,218 ක් වීමෙන්, රු.165,401 කින් හෙවත් සියයට 21 කින් ඉහළ ගොස් තිබුණි.

4.10 වාහන උපයෝජනය

(අ) 2009 වර්ෂයේදී මිලදී ගත් පිරිවැය රු.10,098,026 ක් වූ හයිවුන්ඩායි වර්ගයේ සුඛෝපභෝගී මෝටර් රථය අපහරණය කිරීම සඳහා 2015 නොවැම්බර් 15 දින භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන තිබුණි. මෙම වාහනය 2015 නොවැම්බර් 01 දින සිට 2016 දෙසැම්බර් 16 දින දක්වා කිසිදු කාර්මික දෝෂයක් නොමැතිව සංචිත වාහනයක් ලෙස මණ්ඩලයේ ඉහළ කළමනාකාරීත්වයේ අවශ්‍යතා සඳහා යොදාගෙන තිබුණි. අපහරණය කිරීම සඳහා එවකට ප්‍රමාණවත් හේතු නොපැවති බව විගණනය විසින් පෙන්වාදී තිබුණ ද ඉන් අනතුරුව එම වාහනය නොසැලකිලිමත්ව උපයෝජනය කර තිබීම හේතුවෙන් ගියර් පද්ධතියට රු.852,755 ක අළුත්වැඩියා වියදමක් හෝ රු.1,167,637 ක අළුත් ගියර් පද්ධතියක් සවිකිරීමේ වියදමක් වාහන නියෝජිත ආයතනය විසින් ඇස්තමේන්තු කර තිබුණි. එදින සිට වසර 2 ½ ක් වාහනය අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු නොකර අනාරක්ෂිතව ගාල්කර තිබුණි. මෙම කරුණු පිළිබඳව විගණනය විසින් දිගින් දිගටම පෙන්වාදීම හේතුවෙන් රු.396,900 ක වියදමක් දරා මෙම වාහනය අළුත්වැඩියා කර 2018 ඔක්තෝබර් 03 දින නැවත මණ්ඩලයේ වාහන සංචිතයට එක් කිරීම නිසා රු.5,000,000 කට අධික වෙළඳපොල වටිනාකමක් මණ්ඩලයට එකතු වී තිබුණි.

(ආ) 2001 සැප්තැම්බර් 14 දින රු.1,425,000 කට මිලදී ගෙන තිබූ වාහනයක් 2017 මාර්තු මස සිට සංචිත වාහනයක් ලෙස භාවිතා කර තිබුණි. 2016 අප්‍රේල් 20 දින වැඩ කොටස් 14 ක් සඳහා රු.239,749 ක ඇස්තමේන්තුවකින් වැඩ කොටස් 06 ක් හා 2016 ජූනි 15 දින රු.92,139 ක ඇස්තමේන්තුවකින් රු.26,927 ක පිරිවැයක් සහිත වැඩ කොටස් පමණක් අළුත්වැඩියා කර තිබුණි. කෙසේ වුවද පවතින දෝෂ නිසිපරිදි අළුත්වැඩියා නොකර කොටසක පමණක් අළුත්වැඩියා සිදුකරන ලද මෙම වාහනය 2018 අප්‍රේල් 05 දින අපහරණය කර තිබුණි.

(ඇ) 1999 මැයි 24 දින රු.2,943,000 කට මිලදී ගන්නා ලද වාහනයක අළුත්වැඩියා කටයුතු පෞද්ගලික ආයතනවලින් පමණක් සිදු කරවා ගෙන තිබුණු අතර 2016 ඔක්තෝබර් 17 දින පමණක් අළුත්වැඩියාවක් සඳහා නියෝජිත ආයතනය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු රු.1,901,864 ක ඇස්තමේන්තුවක් ලබාගෙන තිබුණි. එම අවස්ථාවේදී පමණක් අලෙවි නියෝජිත සමාගමෙන් ලබාගත් මිල පදනම්ව ආර්ථික වශයෙන් ඵලදායී නොවන බවට වූ ප්‍රවාහන උපදේශකගේ නිර්දේශය මත එම වාහනය අපහරණය කර තිබුණි.

(ඈ) උක්ත (ආ) හා (ඇ) හි සඳහන් වාහන 2 හි තක්සේරු වටිනාකම පිළිවෙලින් රු.1,200,000 ක් හා රු.2,500,000 ක් වූ අතර එහි විකුණුම් මිළ පිළිවෙලින් රු.1,850,000 ක් හා රු.3,550,000 ක් (වැඩිම ඉල්ලුම් මිල රු.3,650,000) වීමෙන් එම වාහන තක්සේරු වටිනාකමට වඩා සියයට 54 කින් හා සියයට 42 කින් වැඩියෙන් අලෙවි වී තිබුණි. ඒ අනුව මෙම වාහන සඳහා ලබාදී ඇති තක්සේරු වටිනාකම් විගණනයේදී මතභේදයට තුඩුදෙන ඒවා විය.

(ඉ) පෞද්ගලික ආයතනවලින් කුලී පදනම මත වාහන ලබා ගැනීමට සිදුවීමෙන් මණ්ඩලයට අධික වාහන පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි. එසේ 2017 වර්ෂය තුලදී කුලී පදනම මත වාහන 4 ක් ලබාගෙන තිබුණු අතර ඒ සඳහා රු.9,495,518 ක වැය බරක් දරා තිබුණි.

(ඊ) මණ්ඩලයට අයත් වෑන් රථ 8 ක් ක්ෂණික ලොතරැයිපත් අලෙවිය සඳහා ජංගම රථ ලෙස යොදා ගෙන තිබුණු අතර, එම වාහන රියදුරන්ට විධිමත්ව භාරදීම, අලෙවිය සිදු කරනු ලබන ස්ථාන පිළිබඳ GPS නාක්ෂණය ඔස්සේ නිරීක්ෂණය කිරීම, රාත්‍රී කාලයේ අලෙවි නිලධාරීන් හෝ අලෙවි ප්‍රවර්ධන නිලධාරී භාරයේ වාහනය තබා ගැනීම ආදීය සිදුකල යුතු වුවත් එම කාර්යයන් කිසිවක් සිදුකර නොතිබුණි.

(උ) 2016 හා 2017 යන වර්ෂවලදී මිලදී ගෙන ක්ෂේත්‍ර නිලධාරීන් වෙත ලබාදෙන ලද යතුරු පැදි 11 ක් සම්බන්ධව නියෝජිත සමාගම සඳහන් කර ඇති පරිදි ඉන්ධන ලීටරයකින් ධාවනය කල හැකි දුර කිලෝමීටර් 65 ත් 70 ත් අතර විය. නමුත් ක්ෂේත්‍ර නිලධාරීන් විසින් ඉන්ධන ලීටරයකට කිලෝමීටර් 35 ක් පමණක් ධාවනය කල හැකි බැව් දක්වා ඉන්ධන ලබාගෙන තිබුණි. 2018 අප්‍රේල් 23 දින වන විට යතුරු පැදි 11 ක් ධාවනය කර ඇති මුළු දුර ප්‍රමාණය කිලෝමීටර් 293,312 ක් වූ අතර පාරිභෝජනය කර ඇති ඉන්ධන ප්‍රමාණය ලීටර් 8281 කි. නමුත්, නියෝජිත සමාගම සඳහන් කර ඇති පරිදි ඒ සඳහා වැය වන ඉන්ධන ප්‍රමාණය ලීටර් 4512 ක් වුයෙන්, ලීටර් 3769 ක් සඳහා රු.440,915 ක අතිරික්ත ඉන්ධන වියදමක් දරා තිබුණි.

4.11 වෙළඳපොළ කොටස

වර්ෂය	ලොතරැයි විකුණුම් ආදායම		
	සංවර්ධන ලොතරැයි මණ්ඩලය රු.මිලියන	ජාතික ලොතරැයි මණ්ඩලය රු.මිලියන	සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ වෙළඳපොළ කොටස (සියයට)
2017	14,629	16,747	47
2016	15,314	20,170	43
2015	12,280	17,394	41
2014	12,232	15,153	45
2013	10,611	14,537	42
2012	10,668	12,024	47

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ 06 ක ලොතරැයි විකුණුම් ආදායම සැලකිල්ලට ගත්විට සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ වෙළඳපොළ කොටස ජාතික ලොතරැයි මණ්ඩලයේ වෙළඳපොළ කොටස සමඟ සැසඳීමේදී සාපේක්ෂව අඩු වෙළඳපොළ කොටසක් අත්කර ගෙන තිබුණි.

(ආ) 2012 වර්ෂයේදී සියයට 47 ක් වූ මණ්ඩලයේ වෙළඳපොල කොටස 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා සියයට 42 සිට සියයට 43 දක්වා උච්චාවචනයක් සිදු වී නැවත 2017 වර්ෂයේදී සියයට 47 දක්වා වර්ධනය වී තිබුණි.

5. තිරසාර සංවර්ධනය

5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම.

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කල යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

ඉහත පරිදි 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු. ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්දිස්ථාන ඉලක්ක මත ළඟා වීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද. හඳුනාගෙන නොතිබුණි.

6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය අනුව, මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා වූ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන 2018 පෙබරවාරි 28 දින ඉදිරිපත් කර තිබූ අතර අවසන් මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කර තිබුණේ මාස 05 ක ප්‍රමාදයකින් පසුව එනම් 2018 අගෝස්තු 03 දින දීය.

6.2 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර 05 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර තිබුණි. නමුත්, ආයතනයේ විෂය පථය ආවරණය කරගත හැකි පරිදි ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් එම අංශයට අනුයුක්ත කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන විමසුම් මණ්ඩලයේ සභාපති වෙත ඉදිරිපත් කලද, ඒ සම්බන්ධව ක්‍රියාමාර්ග ගැනීම කාර්යක්ෂමව සිදු නොවන බව නිරීක්ෂණය විය.

6.3 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

6.3.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4 වන පරිච්ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා නොගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ දී සිදුකල යුතුව තිබූ සියයට 50 කට ආසන්න ප්‍රසම්පාදනයන් ක්‍රියාත්මක වී නොතිබූ අතර ප්‍රසම්පාදන සැලැස්මට පරිභාහිරව රු.මිලියන 98.5 ක ප්‍රසම්පාදනයන් පූර්ව අනුමැතියකින් තොරව ක්‍රියාත්මක කර තිබුණි. ඉන් රු.මිලියන 56 ක ප්‍රසම්පාදනයන් ආරම්භ කර තිබුණේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1 (ඇ) ඡේදය ප්‍රකාරව අයවැය ප්‍රතිපාදන නොතිබියදීය. තවද, මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ඡේදයේ විධිවිධාන අනුව ප්‍රසම්පාදන සැලැස්ම තුළ ප්‍රසම්පාදන වර්ගය (Procument Catergary) සහ ප්‍රසම්පාදන ක්‍රමය (Procument Method) ඇතුළත් කර නොතිබුණු අතර ප්‍රසම්පාදන සැලැස්ම වගකිව යුතු නිලධාරියෙකු අනුමත කර නොතිබුණි.

(ආ) වටිනාකම රු.386,847,211 ක් වූ ප්‍රසම්පාදනයන් 10 ක් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අලෙවි ප්‍රවර්ධන අයිතම් මිලදී ගැනීම. රු.5,731,645

- අලෙවි ප්‍රවර්ධන අයිතම් ලෙස කුඩ හා මග් මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ඡේදය අනුව වෙළඳපල මිල සැදහුම් ක්‍රමය යටතේ ලංසු ඉදිරිපත් කිරීම සඳහා දින 07 ක කාලයක් ලබාදිය යුතු වුවත් දින 03 ක් පමණක් ලබාදී තිබුණි.

- ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.18 (ආ) ඡේදය ප්‍රකාරව ලංසු ඇගයීමේදී වැට බද්ද සැලකිල්ලට නොගත යුතු වුවද කුඩ 2500 ක මිල ගණන් ඇගයීමේදී එක් ආයතනයක වැට බද්ද සමග මිල හා අනෙක් ආයතනයේ වැට බද්ද රහිත මිල සමඟ සසඳා තිබීම හේතුවෙන් රු.138.043 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

(ii) කාර්ය මණ්ඩලය සඳහා දිවා ආහාර ලබාදීම රු.7,806,187

2015 වර්ෂයේ සිට මේ දක්වා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සඳහා දිවා ආහාරය ලබාදීම වෙනුවෙන් සැපයුම්කරුවෙකු තෝරාගෙන තිබුණු අතර 2017 වර්ෂය තුලදී ඒ වෙනුවෙන් රු.7,816,187 ක් වැයකර තිබුණි. තවද එක් එක් මාසයේදී සේවයට පැමිණි සංඛ්‍යාව ඉක්මවා කෑම ඉල්ලුම් කිරීම නිසා මණ්ඩලය විසින් රු.593,125 ක වැඩිපුර වියදමක් දරා තිබුණි.

(iii) දස ලක්ෂපති සුපිරි ත්‍යාගය සඳහා වාහන මිලට ගැනීම. රු.8,643,740

දස ලක්ෂපති ටිකට්පතේ සුපිරි ත්‍යාගය සඳහා මෝටර් කාර් රථ 04 ක් මිලට ගැනීමට අදාළ ඇස්තමේන්තු ගත වටිනාකම 2017 ප්‍රසම්පාදන සැලැස්මට හා අයවැය ඇස්තමේන්තුවට ඇතුලත් කර නොතිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 ඡේදය හා 2017 මාර්තු 15 දින අතිරේක 33 අනුව රු.මිලියන 10 ක් දක්වා වූ මිලදී ගැනීම් සඳහා අවම වශයෙන් ආයතන 5 කින් මුද්‍රා තබන ලද මිල ගණන් ලබාගත යුතු වීම, 5.3.11 මාර්ගෝපදේශය අනුව ලංසු සුරක්ෂණ ලබාගැනීම හා 8.9.1 මාර්ගෝපදේශය අනුව ගිවිසුම්වලට එළඹීම යන කොන්දේසිවලට අදාළව කටයුතු කර නොතිබුණි. තවද, තාක්ෂණික ඇගයීම් කමිටුවට වාහන සම්බන්ධව දැනුමක් ඇති අයෙකු පත්කර නොතිබුණු අතර, 2017 පෙබරවාරි 27 දින තාක්ෂණික ඇගයීම් කමිටු අනුමැතිය ලැබීමටත් පෙර 2017 පෙබරවාරි 18 දින සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) විසින් එම මෝටර් කාර් රථ මිලට ගැනීමට නිර්දේශ කර තිබුණි.

(iv) **රෝනියෝ යන්ත්‍ර මිලදී ගැනීම. රු.742,500**

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මඟින් රු.මිලියන 10 ට අඩු මිලදී ගැනීම් සඳහා සුළු ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර තිබුණද මෙම මිලදී ගැනීම් සඳහා එම කමිටුවල අනුමැතිය හා නිර්දේශ ලබාගෙන නොතිබුණි. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.1(ඈ) ඡේදය අනුව ලංසු ලේඛන පිළියෙල කිරීම, 6.1.4 ඡේදය අනුව ලංසු ලේඛන නිකුත් කිරීමේදී වාර්තාවක් පවත්වාගෙන යෑම, 6.3.1 ඡේදය අනුව මුද්‍රා තබන ලද ලංසු ලේඛන ලබා ගැනීම, 5.3.11 ඡේදය අනුව ලංසු සුරක්ෂණ ඉදිරිපත් කිරීම, 6.3.3 ඡේදය අනුව ලංසු ලේඛන විවෘත කිරීමේ කමිටුව පත් කිරීම, 6.3.6 ඡේදය අනුව ලංසු ලේඛන විවෘත කිරීම් වාර්තා කිරීම හා සාමාජිකයන් වාර්තාවේ අත්සන් යෙදීම, 5.3.10 ඡේදය අනුව ලංසු වලංගු කාලසීමාව තුල කටයුතු නිම කිරීම, 8.9.1 (ආ) ඡේදය අනුව සැපයුම්කාර සමාගම් සමඟ විධිමත් ගිවිසුමකට එළඹීම හා 5.4.10 ඡේදය ප්‍රකාරව කාර්ය සාධන සුරක්ෂණ ඉදිරිපත් කිරීම යන මාර්ගෝපදේශයන්ට අනුව කටයුතු කර නොතිබුණි.

(v) **ටී-ෂර්ට් මිලදී ගැනීම. වටිනාකම රු.10,384,200**

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතේ 4.2.3 ඡේදය හා 2017 මාර්තු 15 දිනැති අතිරේක 31 අනුව වටිනාකම රු.මිලියන 5 සිට රු.මිලියන 25 දක්වා භාණ්ඩ මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා උපරිම වශයෙන් සති 4 ක කාලයක් පමණක් ගතකල හැකි වුවද, රු.10,384,200 ක් වූ මෙම මිලදී ගැනීම් සඳහා දින 193 ක් ගත කර තිබුණි.

(vi) **CCTV කැමරා පද්ධතිය මිලදී ගැනීම. වටිනාකම රු.3,961,977**

CCTV කැමරා පද්ධතිය මිලදී ගැනීම් සඳහා මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතන 29 ක් අතුරින් ආයතන 09 ක් පිරිවිතරයන්ට අනුව මිල ගණන් ඉදිරිපත්කර තිබුණද ඉන් ආයතන 5 ක් ඇගයීමට ලක් නොකිරීමට හේතු විගණනයට ඉදිරිපත් නොවුණි. තවද, ලංසුකරුවන් විසින් ඉදිරිපත් කල තොරතුරු හා තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවේ තොරතුරුවල වෙනස්කම් නිරීක්ෂණය විය. එසේම පළමුව කොන්ත්‍රාත්තුව පිරිනැමූ ආයතනය විසින් එදින සිට දින 7 ක් ඇතුළත කාර්ය සාධන සුරක්ෂණයක් ඉදිරිපත් කර නොතිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.13 (ඈ) ඡේදය අනුව ලංසු සුරක්ෂණය වන රු.50,000 ක මුදල මණ්ඩලය වෙත අයකර ගෙන නොතිබුණි.

(vii) **සේවක පුහුණු වැඩමුළු පැවැත්වීම. රු.1,740,549**

සමාලෝචිත වර්ෂය තුල පවත්වා තිබුණු සේවක පුහුණු වැඩමුළු දෙකක් සම්බන්ධයෙන් වැඩමුළු පැවැත්වීම සඳහා ආහාර, නවාතැන් හා ශාලා පහසුකම් ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් තොරව පෞද්ගලික ආයතනයක් තෝරාගෙන රු.401,340 ක් ගෙවීම් කර තිබුණි.

(viii) **ලොතරැයි ප්‍රචාරණ වියදම්. රු.302,609,501**

සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලය ලොතරැයි ප්‍රචාරණ කටයුත්ත වෙනුවෙන් රු.302,609,501 ක් වැයකර තිබුණු අතර, මණ්ඩලයේ ප්‍රසම්පාදන සැලැස්ම තුල ප්‍රචාරණ නියෝජිත ආයතන තෝරාගැනීමේ විස්තර ඇතුලත් කර නොතිබුණි. තවද, ප්‍රචාරණ නියෝජිත ආයතන තෝරා ගැනීමේදී 2007 උපදේශන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.7.1, 7.4.4, 5.1.1 හා 5.2.3 ඡේදවල විධිවිධාන වලින් බැහැරව වෙළඳ දැන්වීම් නිර්මාණය හා ප්‍රචාරණ සඳහා රු.6,956,000 ක් ගෙවා තිබුණි.

(ix) **ලොතරැයි පත් මුද්‍රණය රු. 346,417,189**

- ලොතරැයිපත් මුද්‍රණය සඳහා සැපයුම්කරුවෙකු තෝරාගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.2 ඡේද අනුව ප්‍රසම්පාදන සැලැස්මට හා කාලසටහනට අනුව කටයුතු කර නොතිබුණු අතර, 5.3.2 ඡේදය ප්‍රකාරව ලංසු කැඳවීමේ ආරාධනයෙහි ලංසුකරුට තිබිය යුතු අවශ්‍යම හා උචිත සුදුසුකම් මොනවාද යන්න ඇතුලත් කර නොතිබුණි. තවද ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටු පත්කර නොමැති අවස්ථාවකදී මිල ගණන් විවෘත නොකර සුරක්ෂිතව තබන ලෙස මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් උපදෙස් දී තිබියදී එය අනුගමනය නොකර මිල ගණන් විවෘත කර තිබුණු අතර 6.3.6 මාර්ගෝපදේශය ප්‍රකාරව මිල ගණන් විවෘත කිරීම විධිමත් පරිදි වාර්තා කර නොතිබුණි.

- ලංසු ලේඛනවල ඇතුළත් විශේෂ කොන්දේසි අංක 5 අනුව ජාතික ලොතරැයි මණ්ඩලයට ලොතරැයිපත් මුද්‍රණය කර සපයනු ලබන ආයතන මුද්‍රණ කටයුතු සඳහා තෝරා නොගත යුතු වුවද ලොතරැයිපත් 03 ක මුද්‍රණ කටයුතු සඳහා ජාතික ලොතරැයි මණ්ඩලයේ මුද්‍රණ කටයුතු සිදුකර තිබුණු සැපයුම්කරුවෙකු තෝරාගෙන තිබුණි.

- ලංසු ලේඛනවල ඇමුණුම A පරිදි සුදුසුකම්ලත් ලංසුකරුවෙකු වෙත තිබිය යුතු, සුදුසුකම් කිසිවක් සපුරා නොතිබුණු ලංසුකරුවකු, ලොතරැයිපත් 03 ක් මුද්‍රණය සඳහා තෝරාගෙන තිබුණි.

- 2016/2017 වර්ෂය සඳහා මුද්‍රණ කටයුතුවලට අදාල ගිවිසුම 2017 ජූලි 31 දින අවසන් වී තිබුණු අතර 2017/2018 වර්ෂයට අදාල නව සැපයුම්කරුවකු තෝරාගැනීම සඳහා ලංසු කැඳවීමේ පුවත්පත් දැන්වීම 2017 ජූලි 31 දින පලකර තිබුණද නව සැපයුම්කරුගේ මුද්‍රණ කටයුතු 2018 ජනවාරි සිට ආරම්භ කර තිබුණි. ඒ අනුව 2017 අගෝස්තු 01 සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුල පැරණි සැපයුම්කරුගෙන් මුද්‍රණ කටයුතු සිදුකර ගැනීම හේතුවෙන් රු.9.125.619 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

(x) **තොරතුරු තාක්ෂණ ඒකකයේ ඉදිකිරීම් - රු.2,788,948**

ලියාපදිංචි සැපයුම්කරුවන් 09 දෙනෙකුගෙන් මිල ගණන් කැඳවා තිබුණද එක් ආයතනයක් පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. එසේම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ඡේදය ප්‍රකාරව ලංසු ඉදිරිපත් කිරීම සඳහා දින 7 ක කාලයක් ලබා දිය යුතු වුවද දින 3 ක් පමණක් ලබාදී තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.12 ඡේදය ප්‍රකාරව ඵලදායී තරගකාරී බවක් නොමැති බව පෙනී යන විට ලැබුණු ලංසු ප්‍රතික්ෂේප කර නැවත මිල ගණන් කැඳවිය හැකි වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. තවද, තෝරාගෙන තිබුණු කොන්ත්‍රාත්කරු සමඟ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

6.4 අයවැය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ 2017 වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති අයවැය ලේඛනය පිළියෙල කිරීමේදී ටිකට් පතක විකුණුම් වටිනාකම රු.30 ලෙස සලකා පිළියෙල කර තිබුණි. නමුත් 2017 පෙබරවාරි 01 දින සිට නැවත ටිකට්පතක විකුණුම් මිල රු.20 වූයෙන් ඒ අනුව සංශෝධිත අයවැය ලේඛනය පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. එම හේතුව නිසා සත්‍ය ආදායම් වියදම් හා අයවැය ගත ආදායම් වියදම් සමඟ සැසඳිය නොහැකි විය. ඒ අනුව අයවැය තාත්විකව පිළියෙල කර නොතිබීම, වරින් වර එය සමාලෝචනය කර නොතිබීම හේතුවෙන් ප්‍රමාණවත් පරිදි පාලන කාරකයන් වශයෙන් යොදාගෙන නොතිබුණු බැව් විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.1 ඡේදය පරිදි අයවැය ලේඛනය තුළ අයවැය ගත ශේෂ පත්‍රයද ඇතුළත් විය යුතු වුවත් මණ්ඩලයේ අයවැය තුළ අයවැය ගත ශේෂපත්‍රය ඇතුළත් කර නොතිබුණි.

(ඇ) 2017 වර්ෂය සඳහා දිනුම් අඳිනු ලබන ලොතරැයිපත් හා ක්ෂණික ලොතරැයිපත් මුද්‍රණය සඳහා ඇයවැය ලේඛනය අනුව ඇස්තමේන්තු ගත වියදම රු.මිලියන 307 ක් වූ අතර ප්‍රසම්පාදන සැලැස්ම අනුව වියදම රු.මිලියන 468 කි. එම රු.මිලියන 468 වියදම තුල අද කෝපිපති හා සංවර්ධන වාසනාව සඳහා ඇස්තමේන්තු ගත වියදම රු.මිලියන 24 ඇතුළත් වී නොතිබුණි. කෙසේ වුවද 2017 වර්ෂය සඳහා සත්‍ය වියදම රු.මිලියන 346 ක් වූයෙන් අයවැය ලේඛනය, ප්‍රසම්පාදන සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම එකිනෙකට සමගාමීව පිළියෙල කර ඇති බවක් නිරීක්ෂණය නොවීය.

6.5 නොවිසඳි ඇති විගණන ඡේද

ඉකුත් වර්ෂයේ විගණන වාර්තාවලින් පෙන්වා දී තිබුණද, සමාලෝචිත වර්ෂය දක්වාම ප්‍රමාණවත් අවධානයක් යොමුවී නොතිබුණු මූල්‍යමය වටිනාකම රු.297,416,453 ක් වූ විගණන ඡේද 13 ක් ඇතුළුව විසඳී නොමැති විගණන ඡේද 19 ක් විය.

6.6 සමාජ වගකීම් ඉටුකිරීම

(අ) ජනාධිපති අරමුදලට මණ්ඩලයේ දායකත්වය

1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 11 (1) (ආ) හි පරිදි කටයුතු සිදුවේද යන්න තහවුරු කර ගැනීමට පසු විපරම් ක්‍රියාවලියක් සිදුවී නොතිබීම හේතුවෙන්, මණ්ඩලයෙන් සිදුවිය යුතු සමාජ වගකීම නිසි පරිදි ඉටුවී ඇත්ද යන්න ප්‍රශ්නගත කරුණක් විය. පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකෙරේ.

(i) 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 11(1) (ආ) වගන්තිය ප්‍රකාරව ජනාධිපති අරමුදලට මණ්ඩලය විසින් ප්‍රේෂණය කරන මුදලින් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට දායක මුදල් ලබාදිය යුතු විය. එහෙත් සංවර්ධන ලොතරැයි මණ්ඩලය වෙනුවෙන් 2017 වර්ෂයේ දායක වූ රු.මිලියන 254 ක මුදල ඇතුළුව 2012 වර්ෂයේ සිට ජනාධිපති අරමුදලින්, මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට ලැබිය යුතුව තිබුණු රු.මිලියන 972 ක් වූ මුදල්, එම අරමුදලට ලැබී නොතිබුණි.

(ii) මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට ගෙවිය යුතු දායක මුදලින් රු.මිලියන 263 ක් වටිනා උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව එකී අරමුදල වෙනුවෙන් ජනාධිපති අරමුදල මඟින් දැරීමට, මහපොළ අරමුදලින් හෝ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතින් අනුමැතියක් ලැබී නොතිබුණි. මණ්ඩලය විසින් ජනාධිපති අරමුදලට හා මහපොළ උසස් අධ්‍යාපන අරමුදල වෙනුවෙන් ප්‍රේෂණය කරන මුදල්

ප්‍රමාණයන්, බදු ගෙවීම වෙනුවෙන් හිලව් කරන මුදල් ප්‍රමාණයන්, මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට සහ හිමිවිය යුතු මුදල් ප්‍රමාණයන් යනාදිය පිළිබඳව දැනුවත් වී ඇති බවක් නිරීක්ෂණය නොවිය. මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල විසින් ලැබූ මුදල පමණක් සටහන් කිරීමේ ප්‍රතිපත්තියත් අනුගමනය කිරීමත්, මණ්ඩලය විසින් පසු විපරම් ක්‍රියාවලියක් ක්‍රියාත්මක නොකිරීමත් නිසා සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 11 (1) (ආ) වගන්තිය ප්‍රකාර අරමුණු නිසිපරිදි ඉටුවී ඇත්ද යන්න ප්‍රශ්නගත කරුණක් විය.

(iii) 2003 ජුනි 02 දිනැති PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කිරීම නිසා මෙම වාර්තාවේ 4.8 (අ) හි පරිදි මණ්ඩලයෙන් ජනාධිපති අරමුදලට අහිමි වූ දායකය රු.7,101,415 ක් විය.

(ආ) දිනුම් ඇදීමේ ක්‍රියාවලියේ විනිවිදභාවය

සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ ලොතරැයි දිනුම්වාර 1190 ක් පවත්වා නිබුණු අතර ඒ සඳහා රු.466,033,872 ක වියදමක් දරා තිබුණි. කෙසේ නමුත් දිනුම්වාර 1190 කින් දිනුම්වාර 961 ක් සඳහාම විගණන අධික්ෂණයක් හෝ නියෝජනයන් ලබා ගැනීමට මණ්ඩලයේ අවධානය යොමු වී ඇති බවක් නිරීක්ෂණය නොවිය.

(ඇ) ත්‍යාගලාභීන්ට ප්‍රතිලාභ හිමිවීම.

- තිරසාර සංවර්ධන අරමුණු (SDG-10) එස්.ඩී.ජී - 10 අනුව රටතුල පවත්නා අසමානතාවන් අවම කිරීම උදෙසා සමස්ථ ආර්ථිකය තුල ලොතරැයි ප්‍රතිලාභ බෙදීයාමේදී සමාන අවස්ථාවන් පැවතීම තහවුරු වනසේ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ දිනුම් ඇදීමේ ව්‍යුහාත්මක ක්‍රියාකාරිත්වය සකස් වී ඇති බවත් නිරීක්ෂණය නොවිය. සමාලෝචිත වර්ෂයේ ජනවාරි මස සිට ඔක්තෝබර් මස දක්වා කාලය තුළ මණ්ඩලය විසින් පවත්වා තිබූ දිනුම්වාර සංඛ්‍යාව 946 ක් වූ අතර දිනුම් වාර සංඛ්‍යාවට අදාළව ත්‍යාගහිමි ලොතරැයි ප්‍රමාණය සියයට 25 ක් විය. එහිදී ත්‍යාග ව්‍යුහය සැලකිල්ලට ගත්විට රු.250 ට අඩු ත්‍යාගලාභීන්ගේ ප්‍රතිශතය සියයට 99.68 ක් විය.

- දස ලක්ෂපති ලොතරැයියේ ප්‍රථම ත්‍යාගය සඳහා මුදලින් රු.2,500,000 ක් ලබාදීමට කටයුතු කර නිබුණද, ඒ සඳහා මෝටර් කාර් රථය ලබාදීමට තීරණය කර තිබුණි. ඒ අනුව 2017 වර්ෂයේ දිනුම්වාර අවස්ථා 04 ක් සඳහා ත්‍යාග ලෙස වෙන්කල මුදල රු.10,000,000 ක් වුවද මෝටර් රථ 04 සඳහා දරන ලද වියදම් රු.8,643,740 ක් වූයෙන් ත්‍යාගලාභීන්ට අහිමි වූ වටිනාකම රු.1,356,260 ක් විය.

7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

	පද්ධති හා පාලන ක්ෂේත්‍ර		නිරීක්ෂණ
	---		---
(අ)	ගිණුම්කරණය	(i)	නියෝජිතයින් විසින් සෘජුවම බැර කරන ලද මුදල් හා නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකල චෙක්පත්වලට පදනම් වූ ගණුදෙනු හඳුනාගැනීමේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් හා මුදල් පොත පවත්වාගෙන යාමේ ක්‍රමවේදයක් හඳුන්වාදීම.
		(ii)	මුදල් පොතේ නිශ්චිතව හා පැහැදිලිව ශේෂ නොපෙන්වීම හා මූල්‍ය ප්‍රකාශනවල ශේෂ හා බැංකු ප්‍රකාශනවල ශේෂයන් අතර අසාමාන්‍ය වෙනසක් පැවතීමක් තුල කාරක ප්‍රාග්ධන තත්ත්වයේ අසාමාන්‍ය පිරිහීම.
		(iii)	තෑගි අවස්ථාවලදී රු.100,000 ට අඩු ටිකට්පත් සඳහා අලෙවි නියෝජිතයින්ට ගෙවීම් කිරීමේදී නිසි ගිණුම් සටහන් තැබීමේ ක්‍රියාවලියක් පවත්වා නොගැනීම.
		(iv)	නොලැබුණු මුදල් ලැබුණා සේ සලකා මුදල් පොතේ සටහන් තැබීම.
(ආ)	ලිපි ලේඛන නඩත්තු කිරීම.	(i)	මුදල් ලැබීම් වෙනුවෙන් ජංගම ගිණුම් 03 ක් පැවතියද, ඒ සඳහා එක් ලැබීම් මුදල් පොතක් පමණක් පවත්වා ගැනීම.
		(ii)	අලෙවි නියෝජිතවරුන් විසින් බැංකුවට මුදල් බැර කරන විට අදාල කුවිතාන්සි පරීක්ෂාවකින් තොරව මුදල් පොත පවත්වාගෙන යාම.

(ඇ) ගිණුම්කරණය

